දිවියට සවිය

ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම උදෙසා ගෘහස්ථ සුළු කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

Volume 01 | **කර්මාන්ත හා සේවා**

දිවියට සවිය

ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම උදෙසා ගෘහස්ථ සුළු කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

ප්‍රකාශනය

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය

දිවියට සවිය

ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

දිවියට සවිය - කුමක් සඳහාද ?

අයවැය ලේඛනය මඟින් වෙන්වන ප්‍රතිපාදන ඵලදායීව උපයෝගී කර ගනිමින් ජනතාවගේ ජීවනෝපාය ශක්තිමත්මත් කිරීම අරමුණු කරගෙන ග්‍රාමීය මට්ටමින් ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මැදිහත් වන පාර්ශවකරුවන්ට සහාය වීමට මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත.

දිවියට සවිය මාර්ගෝපදේශ සංග්‍රහය - කවුරුන් වෙනුවෙන්ද?

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් ඇතුළු දේශපාලන නියෝජිතයින්
- දිස්ත්‍රික් ලේකම්වරුන් ඇතුළු අදාල රාජ්‍ය නිලධාරීන්
- ප්‍රාදේශීය ජීවනෝපාය සම්බණ්ධීකරණ අනු කමිටු සාමාජිකයින්
- ග්‍රාමීය කමිටු සාමාජිකයින්

ග්‍රාමීය ආර්ථිකය නැංවීමේ රජයේ දැක්ම

ජීවනෝපාය සංවර්ධනය තුළින් පවුලේ ආදායම ඉහළ නැංවීම, දරිද්‍රතාවය තුරන් කිරීම, සේවා නියුක්තිය වැඩිකිරීම මඟින් විරැකියාව අඩුකිරීම, අපනයන ආදායම් ඉහළ නැංවීම, තුළින් රටේ සමස්ත ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.

ග්‍රාමීය ආර්ථිකය නැංවීමේ රජයේ වැඩපිළිවෙල.

එහිදි ජීවනෝපාය වැඩසටහන් වලට ප්‍රතිපාදන සැලසීම කෙරෙහි විශේෂ අවධානය යොමුකර එම වැඩසටහන් ක්‍රියාත්මක කරන අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සියල්ලේ සාමුහික සම්බනධීකරණයෙන් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වේ.

අයවැයෙන් සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් සංවර්ධන කටයුතු සඳහා මහජන නියෝජිතයන් වෙත වෙන්කර දීමට අවධානය යොමු වී ඇති බවත්, එමඟින් යටිතල පහසුකම් ව්‍යාපෘති වලට අමතරව ප්‍රාදේශිය වශයෙන් ඉදිරිපත් වන ජීවනෝපාය ව්‍යාපෘති යෝජනා ශක්තිමත් කිරීමට අවස්ථාව ලබාදීම.

ජීවනෝපය ව්‍යාපෘති තෝරා ගැනීම

සංවර්ධන කාර්යයේදී ග්‍රාමීය දේශපාලන නායකත්වය සතු ශක්තීන් ද යොදා ගනිමින් කෘෂිකර්ම, අපනයන බෝග, විසිතුරු මල් හා පැළැටි වගා ව්‍යාපෘති, පශු සම්පත්, ධීවර හා ජලජීවී, දේශීය හා විදේශීය සංචාරක ව්‍යාපාරය, පාරම්පරික කර්මාන්ත ඇතුළත් සුළු කර්මාන්ත හා ආර්ථික වශයෙන් ඵලදායී විවිධ සේවාවන් වලට සම්බන්ධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන විසින් පවුලේ ආදායම් තත්ත්වය හා ජීවන තත්ත්වය වැඩිකළ හැකි ආර්ථික වශයෙන් ඵලදායී ශක්‍යතාවයෙන් යුතු ව්‍යාපෘති හඳුනාගත යුතුය.

විශේෂයෙන්ම අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. දැනට ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහනට වඩා ඉදිරියට ගිය නිෂ්පාදනය ඉහළ නංවා වෙළඳපොල ශක්තිමත් කිරීම තුළින් ආර්ථික වර්ධනයට දායක විය හැකි ව්‍යාපෘති වලට ප්‍රමුඛතාවය ලබාදීම.

ව්‍යාපෘති වාර්තා සකස් කිරීම

ජීවනෝපාය සංවර්ධනයට දායක වන අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ හා අනුබද්ධ ආයතන තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ ස්ථිර ආදායම් මාර්ගයක් ලබාගත හැකි සාම්ප්‍රදායික මෙන්ම නව ව්‍යාපෘති හඳුනාගෙන ඒ ඒ ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.

ව්‍යාපෘති වාර්තා සැකසීමේ දී ඒ සඳහා සුදුසු ප්‍රදේශ, අමුද්‍රව්‍ය, උපකරණ, මූල්‍ය පහසුකම්, අලෙවි පහසුකම්, ගුණාත්මකභාවය, අවශ්‍ය තාක්ෂණික සහයෝගය, මගපෙන්වීම හා ක්‍රියාත්මක ක්‍රමවේදය ඇතුළත්ව ව්‍යාපෘති වාර්තා සකස් කිරීම හා එම ව්‍යාපෘති වාර්තා හැකි ඉක්මනින් තරුණ කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත යොමු කිරීමට කටයුතු කිරීම. ව්‍යාපෘති යෝජනා සැකසීමට රජයෙන් ලබාදෙන දායකත්වය දිරිගැන්වීමක් ලෙසත්, ඉතිරිය සමෘද්ධි බැංකු ඇතුළුව සහන ණය මුදලකින් ආවරණය කරගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති යෝජනා සැකසීම.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් නොමැති ව්‍යාපෘති යෝජනාවක් ඉදිපත් වුවහොත් අදාල දිස්ත්‍රික්කයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂ වෙත යොමු කර ව්‍යාපෘතිය සඳහා වැයවෙන මූලික ආයෝජනය, අපේක්ෂිත ලාභය වැනි මූලික කරුණු පිළිබඳ අවබෝධය හා නිවැරදි තොරතුරු ලබා ගැනීම කළ හැකිය.

ව්‍යාපෘති වාර්තා ලබා ගැනීමේ දී සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ද සහයෝගය ලබාගැනිම.

ව්‍යාපෘති වල නිෂ්පාදන සඳහා සුදුසු වෙළඳපොළ සම්බන්ධ කිරීම

සුපිරි වෙළඳ සංකීර්ණය ජාලය තුළ ව්‍යවසායකයන්ට ඉඩ ලබා ගැනීමට සාකච්ඡා කිරීමට කටයුතු කිරීම.

මාර්ගගත ක්‍රමයට විකුණුම් ප්‍රවර්ධනයට ප්‍රමුඛතාව ලබාදීම.

තරගකාරී වෙළඳපොලට ගැලපෙන අයුරින් නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහළ නංවාගැනීමට කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පසු අස්වනු තාක්ෂණ ආයතනය වැනි ආයතන වල සේවාව ලබා දීම.

අපනයන වෙළඳපොලට යොමු කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ලබාදීම.

ව්‍යාපෘති සම්බන්ධීකරණය

ජීවනෝපාය සංවර්ධනය සඳහා දායක වන අමාත්‍යාංශ ගණනාවක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමේ සිටින නිලධාරීන් කාර්යක්ෂමව මෙම කාර්යය සඳහා යොදවා ගැනීමටත්, යම් අමාත්‍යාංශයක ව්‍යාපෘති හඳුනාගැනිම හා සම්බන්ධීකරණය සදහා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරියකු නොමැති විට එය කර්මාන්ත නිලධාරී මගින් ඉටුකර ගැනිම හා අදාල රේඛීය අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් සිදුකර ගැනිම.

ජීවනෝපාය සංවර්ධන ක්‍රියාවලියේදී මතුවෙන ගැටළු විසදා ගැනීම

මූලික ගැටළු ග්‍රාමීය කමිටු මගින් විසඳුම් ලබාදීම.

ග්‍රාමීය කමිටු මගින් විසදුම් සොයා ගැනීමට අපහසු ගැටළු ප්‍රාදේශීය ජීවනෝපාය අනුකමිටු වෙත යොමු කිරීම. එබැවින් ජීවනෝපාය අනුකමිටු සඳහා, ව්‍යාපෘති වලට අදාල ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධ කරගැනීම.

ප්‍රාදේශීය ජීවනෝපාය අනුකමිටු වෙත යොමු කර විසඳුම් ලබා ගැනීමට නොහැකි ගැටළු දිස්ත්‍රික් ජීවනෝපාය අනුකමිටුව වෙත යොමු කිරීම.

ප්‍රතිපත්තිමය මැදිහත් වීමක් අවශ්‍ය වන ගැටළු හෝ යෝජනා ජාතික සම්බන්ධීකරණ ජීවනෝපාය අනු කමිටුව වෙත කඩිනමින් යොමු කිරීම.

සමස්ථ වැඩසටහනේ අධීක්ෂණය සහ පසුවිපරම

ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, අදාල අමාත්‍යාංශ වල ක්ෂේත්‍ර නිලධාරීන් මගින් සිදු කිරිමටත්, ඒවායේ පසුවිපරම අධීක්ෂණ කටයුතු සංවර්ධන සම්බන්ධීකරණ අධීක්ෂණ අමාත්‍යාංශය මගින් සිදුකිරීම.

‘සෞභාග්‍යයේ දැක්ම’

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්

සෑම පුරවැසියෙකුට ම නිෂ්චිත ආර්ථික
ස්ථාවරත්වයක්, දියුණුවීමේ සමාන අවස්ථා සහ
ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අයිතිය
ස්ථාවර කිරීම සඳහා
අපගේ ජනතා කේන්ද්‍රීය ආර්ථික සංකල්පය මත
අප නිබඳවම පෙනී සිටින්නෙමු.
ඒ සඳහා වන කඩිනම් ජීවන වැඩසටහනට
අමතරව අපේ අරමුණ
ධනපතීන්ට වඩා
පොදු ජනතාව නඟා සිටුවීමය.
අප ඒ සඳහා සුදානම් ය.

“දිවියට සවිය” ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීම උදෙසා ප්‍රවර්ධනය කළ හැකි ව්‍යාපාර අදහස් ඒකරාශී කරමින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සකස් වී ඇත. වෙළුම් ගණනාවක් ඔස්සේ නැවුම් ව්‍යාපාර අදහස් ජනගත කිරීම සඳහා ප්‍රකාශයට පත් වීමට නියමිත ග්‍රන්ථ පෙළක පළමුවැන්න මෙයයි. කාණ්ඩ තුනක් යටතේ පළමු වෙළුම ඔබ අතට පත් වෙන මෙම ග්‍රන්ථයන් පරිශීලනය කළ යුතු වන්නේ මනා අවබෝධයක් සහිතවය.

විවිධ ව්‍යාපාර අදහස් සහ එම අදහස් ව්‍යාපාර අවස්ථා බවට පත් කර ගැනීමේදී යොමු කළ යුතු මූලික කරුණු සංක්ෂිප්තව මෙමගින් දක්වා ඇත. එමගින් අදාල නිෂ්පාදනය සඳහා පවතින වෙළඳපොල, අමුද්‍රව්‍යය, මූලික ආයෝජනය, වියදම් සහ දළ ලාභය පිළිබඳව කරුණු ඇතුලත් වේ. මෙම කරුණු දක්වා ඇති නිෂ්පාදන නිපදවීමට තාක්ෂණික දැනුම ලබා දෙන ආයතන, දැනට එම ව්‍යාපාර ක්ෂේත්‍රවල නිෂ්පාදකයින්ගෙන් ලබා ගත් තොරතුරු ආදිය සැලකිල්ලට ගෙන ගණනය කිරීම සිදු කර ඇත. තවද යම් තත්ත්වයන් පිළිබඳව උපකල්පන කිහිපයක පිහිටා වටිනාකම් නිර්ණය කර තිබේ. බොහෝ ස්ථානවලදී පොදු අගයන් යොදා ගෙන තිබෙන අතර නිෂ්පාදනය කරන ස්ථානය, නිෂ්පාදන ධාරිතාව ව්‍යවසායකයාගේ දැනුම සහ කැපවීම වැනි කරුණු අනුව සාර්ථකභාවය රැඳී පවතී. එමෙන්ම කලානුරූපව මෙම අගයන් සංශෝධනය විය යුතුය.

මෙම ග්‍රන්ථ මාලාව ග්‍රාමීය ව්‍යාපාරයක් හෝ ව්‍යාපාර සමූහයක් ආරම්භ කිරීමේදී එවායේ මූලික වියදම ගැන අවබෝධයක් ලබා ගැනීමට ඉවහල් වනු ඇත. මෙහි අඩංගු යම් කරුණාක් පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පුරා විහිදුණු තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන නිළධාරීන් වෙතින් විමසීමට හැකිය.

මෙම ග්‍රන්ථ මාලාව සකස් කිරීමේදී නන් අයුරින් සහාය වූ මගපෙන්වීම් සිදු කළ සියලුම දෙනාට කෘතවේදීත්වය පිරි නමමු.

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
දුරකථන- 011-266 9240, 011-266 9234, 011-266 9236
වෙබ් අඩවිය- www.sed.gov.lk
විද්‍යුත් ලිපිනය- sed.gov.lk@gmail.com
මුහුණුපොත් පිටුව- www.facebook.com/SEDbureau
මාර්ගස්ථ පුහුණු කිරීම- sed.chords.org.lk

පෙළගැස්ම

පිටුව

01.	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනය (පෝච්චි නිෂ්පාදනය)	13
02.	කාන්තා අත් බෑග් නිෂ්පාදනය	16
03.	කොසු ඉදල් නිෂ්පාදනය	18
04.	සේදුම්කාරක නිෂ්පාදනය	21
05.	මැටි භාජන නිෂ්පාදනය	24
06.	තිර මුද්‍රණය (ස්ක්‍රීන් ප්‍රින්ටින්)	26
07.	වේවැල් නිෂ්පාදනය	28
08.	උණුසුම් ඇඳුම් නිෂ්පාදනය	32
09.	ත්‍රී වීල් රථ ටින්කරින් හා පේන්ටින්	35
10.	අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය	37
11.	කඩදාසි බෑග් නිශ්පාදනය	39
12.	බ්ලොක් ගල්, බිම් ඇතුරුම් ගල් නිෂ්පාදනය හා අලෙවිය	42
13.	රෙදි පටි බෝල නිෂ්පාදනය	45
14.	උඩරට මුල් ඇඳුම් මැසීමේ ව්‍යාපාරය	47
15.	කාන්තා ඇඳුම් නිෂ්පාදනය	50
16.	පන් ආශ්‍රිත නිෂ්පාදන	52
17.	හැන්ඩ්ලූම් බෑග් නිෂ්පාදනය	54
18.	පූජා භාණ්ඩ නිෂ්පාදනය	56
19.	පොල් කටු ඇඟුරු කර්මාන්තය	59
20.	විදුලි උපකරණ අලුත්වැඩියාව	62
21.	පාසල් නිල ඇඳුම් නිෂ්පාදනය	65
22.	පළතුරු අලෙවිසැල	68
23.	ටයර් සේවා ව්‍යාපාරය	70
24.	සංචාරක නවාතැන් පහසුකම් සැපයීම	73
25.	කායවර්ධන/ ව්‍යායාම මධ්‍යස්ථාන	76
26.	බතික් නිෂ්පාදන	78
27.	මදුරුදැල් නිෂ්පාදන	81
28.	විවාහ මංගල උත්සව සේවා	84
29.	සර්ෆින් ඉගැන්වීම සහ සර්ෆින් බෝඩ් බදු දීම	87
30.	ලුහු ඉංජිනේරු කර්මාන්ත	90
31.	වාහන පින්තාරු ව්‍යාපාරය	93
32.	මැණික් ගල් කැපීම හා ඔප දැමීමේ සේවා	96
33.	පල්ප් ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන	98
34.	මෘදු සෙල්ලම් බඩු නිෂ්පාදන	100
35.	බාබර් සාප්පු ව්‍යාපාරය	102
36.	ග්‍රිල් ගේට්ටු නිෂ්පාදන ව්‍යාපාරය	105
37.	කේටරින් සර්විස්	108
38.	මාතෘ- ළදරු ඇඟලුම් කට්ටල නිෂ්පාදනය	111
39.	පාවහන් නිෂ්පාදනය	114
40.	පෙල් ලෙලි කැබලි නිෂ්පාදනය	116
41.	සහාය සපයන ආයතන	119

සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන (පෝච්චි නිෂ්පාදනය)

1. හැඳින්වීම

අතීතයේ කාන්තාවන් ගෙමිදුල අලංකරණය කිරීම සඳහා සහ බුද්ධ වන්දනාවට ඉතාමත් සුවඳ මල් වර්ග වගා කළ අතර මල් පෝච්චි භාවිතයක් ප්‍රබල ලෙස දක්නට නොතිබුණි. මල් පෝච්චි අවශ්‍ය වූ විට ඉවතලන වලං යොදා ගන්නා ලදි. සමාජ, සංස්කෘතික හා ආර්ථිකමය වශයෙන් සිදු වී ඇති වෙනස්වීම් තුළ මල් වගාව ව්‍යාපාරයක් ලෙස ව්‍යාප්ත වීම දැක ගත හැකිය. විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල අඩු ඉඩකඩ හේතුවෙන් මල්, පළතුරු හා එළවළු වගාව සඳහා පෝච්චි භාවිතය විශාල ලෙස ඉහළ ගොස් ඇත. එබැවින් සිමෙන්ති පෝච්චි නිෂ්පාදනය වර්තමානයේ ගෘහාශ්‍රිත මට්ටමෙන් සිදු කළ හැකි හොඳ වෙළඳපොල අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

සිමෙන්ති / චිප්ස් / වැලි / කම්බි / තීන්ත / පිලර් / ෂයිනින් පේපර් / කළුතෙල් / පින්සල්

3. වෙළඳපොල

වර්තමානයේ නිවෙස් පමණක් නොව උද්‍යාන ඇතුළු සියළුම ආයතන අලංකරණය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි. එහෙයින් සිමෙන්ති මල් පෝච්චි සඳහා පවතින වෙළඳපොල ඉල්ලුම දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. එක් එක් පාරිභෝගික කාණ්ඩයන්ගේ ලක්ෂණ (ආදායම, අධ්‍යාපනය, වයස, රුචිකත්වය) අනුව, ඒකාකාරී ස්වභාවයෙන් මිදී විවිධ හැඩයෙන් ප්‍රමාණයෙන් හා වර්ණයෙන් යුක්තව නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කර ඇත. සිමෙන්ති පෝච්චි නිෂ්පාදනය තරගකාරී ව්‍යාපාරයක් ලෙස දක්නට ලැබෙන අතර ප්‍රමාණය, ගුණත්වය හා හැඩය මත විවිධ මිල ගණන් යටතේ වෙළඳපොලට ඉදිරිපත් කළ හැකිය.

4. ආයෝජනය

මසකට සිමෙන්ති පෝච්චි 250ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු.	240,000.00
4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු.	81,250.00
මුළු එකතුව	-	**රු 321,250.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යසායකයා පදිංචි ස්ථානය තුල ව්‍යාපාරය පවත්වාගෙන යාමට හැකි වේය යන උපකල්පනය මත පිහිටා ස්ථාවර වත්කම් ගණනය කරන ලදි. (පර්චස් 10-20 අතර)

අනු අංකය	යන්ත්‍ර හා උපකරණ	ඒකක ගණන	වටිනාකම (රුපියල්)
01	ගොඩනැගිල්ල	01	125,000.00
02	වතුර මෝටරය	01	25,000.00
03	ග්‍රයින්ඩර්	01	7,500.00
04	ඇච්චු	-	75,000.00
06	ඩ්‍රිල්	01	7,500.00
	එකතුව		240,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සදහා)

අනු අංකය	විස්තරය	මාසික වියදම (රු.)
01	අමුද්‍රව්‍ය වියදම	38,000.00
02	ශ්‍රම වියදම (දිනකට රු 1250)	31,250.00
03	වෙනත් වියදම්	12,000.00
	එකතුව	81,250.00

5. ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට දින 25ක් නිෂ්පාදන කටයුතු සිදු කරන අතර දිනකදී සිමෙන්ති පෝච්චි 10ක් බැගින් මාසික නිෂ්පාදනය 250ක් සිදු කරන බවට ඇස්තමේන්තු කර ඇත. දිනක ශ්‍රම වියදම රු. 1,250.00ක් ලෙසත්, පෝච්චියක විකුණුම් මිල රු. 550.00ක් ලෙස ගණනය කර ඇත.

මාසික විකුණුම් ආදායම = (මාසික නිෂ්පාදනය 250 x ඒකකයක විකුණුම් මි රු. 550.00)
= රු. 137,500.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්

සෘජු පිරිවැය = රු. 38,000.00 + රු. 31,250.00 + රු. 12,000.00

= රු. 81,250.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සදහා දරණ වියදම් වේ (ජලය/විදුලිය/ප්‍රවාහන/අලෙවි/ක්ෂය කිරීම් ආදි අනෙකුත් වියදම්) එය මාසයක් සදහා රු. 20,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 137,500.00 - (රු. 81,250.00 + රු. 20,000.00)
= රු. 137,500.00 - රු. 101,250.00
= රු. 36,250.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුගේ මාසික වැටුප වශයෙන් රු. 31,250.00 ක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය වශයෙන් රු. 36,250.00 ක් උපයා ගත හැකිය.

කාන්තා අත් බෑග් නිෂ්පාදනය

1. හැඳින්වීම

කාන්තා අත්බෑග් ශ්‍රී ලංකාවේ ඉතා ඉහළ පාරිභෝගික ආකර්ෂණයක් පවතින වෙළඳ භාණ්ඩයකි. මෙම අත්බෑග් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර එය දිනෙන් දින වෙනස් වන මෝස්තර වලින් යුක්ත වේ. කාන්තාවන්ගේ සිතැඟි අනුව එහි ප්‍රමාණය, වර්ණය මෙන්ම හැඩය ද වෙනස් විම අවශ්‍ය ය. අත් බෑගය විලාසිතා ලෝකයේ වැදගත්ම අංගයක් වී ඇති අතර, බොහෝ විට ඒවා කාන්තා ඇඳුම් කට්ටලයට අදාළ අංගයක් ලෙස වර්තමාන විලාසිතා ලෝකයේ භාවිතා කරයි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

1. රෙක්සින් - විවිධ ගුණාත්මක තත්ත්වයේ රෙදි පවතින අතර ඒ අනුව මිල වෙනස් වේ.
2. ටැපටා රෙදි
3. ෂිපර් ලොකු, ෂිපර් පොඩි, ෂිපර් ටේප්
4. රබර් කොකු, බකල්, බැජ්
5. නූල්

මෙම අමුද්‍රව්‍ය කොළඹ හා මහරගම ප්‍රදේශවලින් තොග වශයෙන් ලබා ගත හැකිය.

3. වෙළඳපොල

ප්‍රධානම පාරිභෝගික කාණ්ඩය රැකියා ගත කාන්තාවන් වන අතර, තරුණියන් සහ අනෙකුත් කාන්තාවන් ද කාන්තා අත් බෑග් වෙළඳපොල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබේ. විවිධ ආදායම් මට්ටම් වල කාන්තා පාරිභෝගික පිරිස් ඉලක්ක කර ගනිමින් විවිධ විලාසිතා යටතේ මෙම කාන්තා අත් බෑග් නිර්මාණ වෙළඳපලේ බහුලව පවතී. කාන්තා අත් බෑග් සාදන අමුද්‍රව්‍ය සහ එහි විලාසිතා අනුව වෙළෙඳපොළ වටිනාකම වෙනස් වේ.

තොග වෙළෙඳ පොළේ පවතින අමුද්‍රව්‍ය මිල උච්චාවචනය අනුව මෙම අත්බෑග් වල පිරිවැය විචලනය වේ. මෙම බෑග් මිලදී ගැනීමේ ස්ථාන වශයෙන් හඳුනාගත හැකි විවිධ නිමි ඇඳුම් අලෙවිසැල් සහ විසිතුරු භාණ්ඩ අලෙවිසැල් පවතී. ඊට අමතරව සුපිරි වෙළෙඳ සංකීර්ණ දක්වා ද මෙම පාරිභෝගික ආකර්ෂණය දිගු විය හැකිය. තරගකරුවන් බොහෝ සිටින අතර ගුණාත්මක බව හා කල් පැවැත්ම මෙන්ම විලාසිතාව කෙරෙහි පාරිභෝගික උද්යෝගයක් දැකිය හැකිය.

4. ආයෝජනය

මාසිකව බෑග් 200ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 60,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 102,500.00
මුළු එකතුව	- **රු. 162,500.00**

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්මේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	ජුකී මැෂිම	45,000.00
02	ලී බඩු (මේස/ පුටු/ රාක්ක)	10,000.00
03	අනෙකුත් උපකරණ (කතුරු/ මාර්කර්/ ටේප්)	5,000.00
	මුළු එකතුව	60,000.00

කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

මාසයකට දින 25ක් තුල බෑග් 200ක් නිෂ්පාදනය කරනු ලැබේ.

අංක	විස්තරය සතිය	වියදම (රු.)	මාසික වියදම (රු.)
01	අමුද්‍රව්‍ය	22,000.00	88,000.00
02	ශ්‍රම වියදම	-	12,000.00
03	වෙනත් වියදම්	500.00	2,500.00
	එකතුව	22,500.00	102,500.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මාසයකට දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන අතර මසකට කාන්තා අත් බෑග් 200 ක් නිෂ්පාදනය කර අලෙවි කරන බවට ඇස්තමේන්තු කර ඇත. බෑගයක විකුණුම් මිල රු.680 ක් වේ.
ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = (රු. 680.00 x බෑග් 200) = රු. 136,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම

සෘජු පිරිවැය = රු. 88,000.00 + රු. 12,000.00 + රු. 2,500.00

= රු. 102,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ (ජල, විදුලි, ප්‍රවාහන, අලෙවි ආදි අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 5,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය

= රු. 136,000.00 - (රු. 102,500.00 + රු. 5,000.00)

= රු. 28,500.00

ව්‍යාපාරිකයා විසින් ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 12,000.00 ක ශ්‍රම වැටුපක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 28,500.00ක මුදලක් උපයා ගත හැකිය.

කොසු ඉදල් නිෂ්පාදනය

1. හැඳින්වීම

ලෝකය නවීන තාක්ෂණය සමඟ වේගයෙන් ගමන් කරමින් පවතී. කෙතරම් වේගයෙන් ගමන් කළද කොසු-ඉදල් යනු මිනිසාට අත්‍යවශ්‍යම භාණ්ඩ වේ. කර්මාන්ත අතරින් වසර ගණනාවක දීර්ඝ ඉතිහාසයක් ඇති කොසු-ඉදල් කර්මාන්තයට ශ්‍රී ලංකාව තුළ හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ව්‍යාපාරයක් ලෙස සාර්ථකව ආරම්භ කරමින් ඉතා කෙටි කාලයක් තුළ විශාල දියුණුවක් කරා ගමන් කළ හැකි මෙම කොසු-ඉදල් ව්‍යාපාරය පරිසර හිතකාමීය. වාර්ෂිකව ඉවත දමන ප්ලාස්ටික් කොසු-ඉදල් ප්‍රමාණය ටොන් ගණනකි. එමඟින් ප්‍රබල පරිසර හානියක් සිදු වන බව පරිසරවේදීහු පෙන්වා දෙති. ස්වාභාවික දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරමින් පරිසර හිතකාමී නිෂ්පාදනයක් ලෙස ආරම්භ කළ හැකි මෙම ව්‍යාපාරය රටට සහ පරිසරයට නියත වශයෙන්ම යහපතක් සිදුකරනු ඇත.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

දිනකට කොසු 50ක් සහ ඉදල් 50ක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ ඒ සඳහා වියදම පහත පරිදි වේ. (මාසයකට දින 25ක් නිෂ්පාදනය සිදු කරන බව ඇස්තමේන්තු කර ඇත.)

කොසු 1,250 ක් සඳහා

මිට (අඩි 5,000 × රු. 4.00 = රු.20,000.00), කොහු (කි.ග්‍රෑ.415 × රු. 110.00 = රු. 45,650.00)
තහඩු (ෂීට් 14 × රු. 240.00 = රු 3,360.00), ඇණ (කි.ග්‍රෑ.20 × රු. 300.00 = රු.6,000.00),
ලේබල් (1,250 × රු. 0.60 = රු. 750.00)

මුළු වියදම = රු. 75,760.00

ඉදල් 1,250 ක් සඳහා

මිට (අඩි 3,750 × රු. 4.00 = රු.15,000.00), ඉරටු (කි.ග්‍රෑ.750 × රු. 80.00 = රු. 60,000.00),
තහඩු (ෂීට් 14 × රු. 240.00 = රු. 3,360.00), ඇණ (කි.ග්‍රෑ.20 × රු. 300.00 = රු. 6,000.00),
ලේබල් (1,250 × රු. 0.60 = රු. 750.00) **මුළු වියදම = රු. 85,110.00**

3. වෙළඳපොල

ශ්‍රී ලංකාව සහ විදේශ රටවලට අත්‍යවශ්‍ය භාණ්ඩයක් ලෙස කොසු සහ ඉදල් සැලකිය හැකිය. මේ සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. ග්‍රාමීය, අර්ධ නාගරික සහ නාගරික ප්‍රදේශවල නිවාස සහ ආයතන සඳහා ඉතා ඉහළ වෙළඳපොළක් පවතී.
දේශීය කර්මාන්ත නගා සිටුවීම සඳහා පරිසරයට හානිකරන ප්ලාස්ටික් කොසු-ඉදල් ආනයනය නතර කිරීමට රජය ගත් තීන්දුව මෙම ව්‍යාපාරයට ඉතා හොඳ අවස්ථාවකි.
තවද, ශ්‍රී ලංකාවේ කොසු-ඉදල් සඳහා ඇමරිකා එක්සත් ජනපදය හා ජපානය ප්‍රමුඛ ඉහළ පෙළේ විදේශ රටවලින් ඉල්ලුමක් ලැබීමද මෙම ව්‍යාපාරය වර්ධනය සඳහා සෘජුවම බලපානු ඇත.
ඒ අනුව, උසස් ප්‍රමිතියෙන් යුක්තව නිෂ්පාදනය කර ඉතා හොඳ මිලක් යටතේ අලෙවි කිරීමේ හැකියාව පවතී. සාමාන්‍ය සිල්ලර වෙළඳසැල්, තොග වෙළඳසැල් සහ සුපිරි වෙළඳසැල් ආදී ඕනෑම ස්ථානයකදී මෙම කොසු-ඉදල් අලෙවි කළ හැකිය.

4. ආයෝජනය

මාසයකට කොසු 1,250ක් සහ ඉදල් 1,250ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළයුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 17,900.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 227,870.00
	මුළු එකතුව	- **රු. 245,770.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ගොඩනැගිල්ල සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අනු අංකය	උපකරණ පිළිබඳ විස්තරය	වටිනාකම (රු.)
01.	ඉදල් නිෂ්පාදනය සඳහා අච්චුව (දඬු අඬුව)	15,000.00
02.	අඬුව	200.00
03.	මිටිය	500.00
04.	කපන කටුව (ඉරටු හා කොහු කැපීම සඳහා)	200.00
05.	යතු කැටය (මිට සකස් කර ගැනීම සඳහා)	1,500.00
06.	තහඩු වළලු සාදා ගැනීමේ යකඩ බටය	500.00
	එකතුව	17,900.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

දිනකට කොසු 50ක් හා ඉදල් 50ක් ලෙස මාසයක් තුළ කොසු හා ඉදල් 1250 බැගින් නිෂ්පාදනය කරන ආකාරයට සැලසුම් කර ඇති අතර, මාසයකට දින 25 ක් නිෂ්පාදන කටයුතු සිදුකරන ආකාරයට ඇස්තමේන්තු සකස් කර ඇත.

අනු අංකය	විස්තරය	මාසික වියදම (රු.)
1.	අමුද්‍රව්‍ය සඳහා වියදම 1. කොසු 1,250ක් සඳහා 2. ඉදල් 1,250ක් සඳහා	 75,760.00 85,110.00
2.	ගෙන ඒමේ කුලී	2,000.00
3.	නිෂ්පාදන ශ්‍රම වියදම 1. අයිතිකරු 2. පුහුණු සේවකයා	 30,000.00 30,000.00
4.	වෙනත් වියදම්	5,000.00
	එකතුව	227,870.00

05. මාසික ශුද්ධ ලාභය

වර්තමාන වෙළඳපොළ මිල ගණන් යටතේ කොස්සක හා ඉදලක විකුණුම් මිල (තොග මිල) රු. 130.00ක් ලෙස ගත් විට,

මාසික විකුණුම් ආදායම

කොසු (දිනක නිෂ්පාදනය 50 × දින 25 × රු. 130.00) = රු. 162,500.00

ඉදල් (දිනක නිෂ්පාදනය 50 × දින 25 × රු. 130.00) = රු. 162,500.00

= රු. 325,000.00

මාසික මුළු පිරිවැය	**= සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය**
සෘජු පිරිවැය	= සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය
	= (රු.7 5,760.00 + රු. 85,110.00) + රු. 60,000.00 + රු. 7,000.00
	= රු. 227,870.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ (දුරකතන, නඩත්තු, සංග්‍රහ, උපකරණ ක්ෂය, බෙදාහැරීමේ සේවක වැටුප්, ප්‍රවාහන හා ප්‍රචාරණ වියදම්)

එක් මාසයක් සඳහා වක්‍ර වියදම රු. 30,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 325,000.00 - (රු. 227,870.00 + රු. 30,000.00)
	= රු. 325,000.00 - රු. 257,870.00
	= රු. 67,130.00

ව්‍යාපාරයේ අයිතිකරුද නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට රු. 30,000.00ක වැටුපක් වෙන් කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 67,130.00ක් උපයා ගත හැකි වේ.

සේදුම්කාරක නිෂ්පාදන

1. හැඳින්වීම

සේදුම්කාරක හෙවත් Detergents අද සමාජයේ සියලුම පුද්ගලයන් හට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වී අවසානය. සේදුම්කාරක යනු මේදය හා අපිරිසිදු ද්‍රව්‍ය ඉවත් කිරීමට කෘතිමව නිෂ්පාදනය කරනු ලැබූ රසායනික සංඝටක රැසක් සහිත ද්‍රව්‍යයක. සබන් යනු එක්තරා ආකාරයක සේදුම්කාරකයකි. සබන් වලට ඉතා දිගු ඉතිහාසයක් ඇත. අතීතයේදී සබන් නිෂ්පාදනය සඳහා ස්වාභාවික දෑ භාවිත කලද වර්තමානයේ රසායනික සංඝටක යොදා ගනිමින් වඩා ඵළදායි ලෙස සබන් නිෂ්පාදනය කරනු ලබයි. සබන් වලට අමතරව වර්තමානයේ වඩා ක්‍රියාකාරී සේදුම්කාරක වර්ග රැසක් අපට හමුවේ. එනම් රෙදි සේදුම්කාරක කුඩු (Detergent Powder) රෙදි සේදුම් කාරක දියර (Detergent Liquid) මතුපිට සේදුම් කාරක දියර, (Tile Cleaner), දෑත් සේදුම් කාරක (Hand Wash), වීදුරු පිරිසිදු කාරක වැනි නිෂ්පාදනයන්ය. මෙහි අඩංගු Surfactants නම් සංයෝගය මගින් පිරිසිදු කිරීමට ඇති මතුපිටෙහි හෝ ද්‍රව්‍යයේ ඇති අපිරිසිදු දෑ ඉවත්කිරීම සිදුකරනු ලබය. මෙහි එක් අග්‍රයක් ජලයට ආකර්ෂණය වන අතර අනිත් අග්‍රය මේදය හා අපිරිසිදු ද්‍රව්‍ය වලට ආකර්ෂණය වන බැවින් අපිරිසිදු ද්‍රව්‍ය ජලය සමග එකතු වී ඉවත් කරනු ලබයි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

Hand Wash සඳහා
ඇල්කොහොල්
සුවඳ වර්ග
ලැබ්සා
HEC

Tile Cleaner සඳහා
ඇල්කොහොල්
HEC
Labsa
කෝස්ටික් සෝඩා
ක්ලෝරීන් (70%)
සෝඩා ඇෂ්
සුවඳ වර්ග
ප්ලාස්ටික් බෝතල්

Toilet Cleaner සඳහා
ක්ලෝරීන්
Acid ticner
සුවඳ වර්ග
කෝස්ටික් සෝඩා
STPP

3. වෙළඳපොල

සේදුම් කාරක සඳහා වර්තමානයේ ඉහල ඉල්ලුමක් පවත. එබැවින් එහි වෙළඳපොලද ඉතා ඉහළ මට්ටමක පවතී. වර්තමානයේ දී එනම් කොරෝනා ව්‍යසන කාලයේදී මෙම සේදුම් කාරක වල ඉල්ලුම ඉතා ඉහළ තත්ත්වයකට පත්ව ඇත. එපමණක් නොව වර්තමානයේදී ජනතාව කාර්යබහුල ජීවන රටාවකට පත්ව ඇති බැවින් රෙදි සේදීමට පවා බහුතරය රෙදි සෝදන යන්ත්‍ර භාවිතයට හුරුව ඇත. කොපමණ වටිනා යන්ත්‍රයක් වුවද විෂබීජ සහ අපිරිසිදු ද්‍රව්‍ය ඉවත් කිරීමට නම් අනිවාර්යයෙන් සේදුම් කාරක යෙදිය යුතුමය. එබැවින් සුලු පරිමාණයේ මෙන්ම මධ්‍ය පරිමාණයෙන් සහ මහා පරිමාණයෙන් වුවද මෙම ව්‍යාපාරයට යොමු වීමට හැකියාවක් පවතින ව්‍යවසායකයන්හට මෙමගින් විශාල ලාභයක් ලබාගත හැකි බව නොඅනුමානය. අනාගතයේ මෙම නිෂ්පාදන සඳහා ඉල්ලුම තවත් වැඩිවන බැවින් දිනෙන් දින වර්ධනය වන ව්‍යාපාර අවස්ථාවක් බව ඉතා පැහැදිලිය.

4. ආයෝජන

මාසිකව 500ml සේදුම්කාරක බෝතල් 1000 නිෂ්පාදනය සඳහා

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 72,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය	= රු. 145,000.00
මුලු එකතුව	= **රු. 217,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
1	අමුද්‍රව්‍ය මිශ්‍රණ බැරල්	10,000.00
2	බෝතල් සීලර් යන්ත්‍ර	12,000.00
3	දින සටහන් යන්ත්‍රය	30,000.00
4	වෙනත් උපකරන	20,000.00
	මුලු මුදල	72,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

අංකය	විස්තරය	මසක වියදම (රු.)
1	අමුද්‍රව්‍ය	100,000.00
2	ශ්‍රම වියදම	40,000.00
3	වෙනත්	5,000.00
	මුලු මුදල	145,000.00

අමුද්‍රව්‍ය වියදම (මාසික)

අංකය	අමුද්‍රව්‍ය	ඒකකය	ඒකක ප්‍රමාණය	ඒකකයක මිල (රු.)	මුලු එකතුව (රු.)
1	Alcohol	liter	10	500	5,000.00
2	HEC	Kg	2	2,300	4,600.00
3	Labsa	Kg	25	300	7,500.00
4	Costic	Kg	10	100	1,000.00
5	STTP	Kg	10	230	2,300.00
6	Acid Tickner	Kg	1	1,500	1,500.00
7	Chlorine 70%	Kg	15	425	6,375.00
8	Soda Ash	Kg	10	110	1,100.00
9	Fragrance	liter	1	4,000	4,000.00
10	Plastic Bottle 1	Nos	250	80	20,000.00
11	Plastic Bottle 2	Nos	250	75	18,750.00
12	Plastic Bottle 3	Nos	250	75	18,750.00
13	Plastic Bottle 4	Nos	250	35	8,750.00
					99,625.00

5. මාසික ශුද්ධ ලාභය

දිනකට බෝතල් 40 බැගින් මාසයේ දින 25 ක් නිෂ්පාදන කටයුතු සිදුකරන බවට ඇස්තමේන්තු කර ඇත.

විකුණුම් ආදායම මාසයකට

අනු අංකය	සේදුම් කාරක වර්ගය	ඒකකයක මිල (රු.)	මසකට අලෙවිකරන ප්‍රමාණය (බෝතල්)	විකුණුම් ආදායම (රු.)
1	Hand Wash (500ml)	325.00	250	81,250.00
2	Dish Wash (500ml)	180.00	250	45,000.00
3	Toilet Cleaner (600ml)	150.00	250	37,500.00
4	Tile Cleaner (500ml)	175.00	250	43,750.00
	මුල එකතුව (රු)			207,500.00

මාසික විකුණුම් ආදායම = රු. 207,500.00

මාසික මුලු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්

= රු. 100,000.00 + රු. 40,000.00 + රු. 5,000.00

= රු. 145,000.00

වක්‍ර වියදම

වක්‍ර වියදම ලෙස රු. 20,000.00 මුදලක් මසකට යෙදවිය යුතු බව උපකල්පනය කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම + මාසික මුලු වියදම

= රු. 207,500.00 - (රු. 145,000.00 + රු. 20,000.00)

= රු. 42,500.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට රු. 40,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 42,500.00 ක් උපයා ගත හැකි වේ.

මැටි භාජන නිෂ්පාදනය

01. හැඳින්වීම

ශ්‍රී ලාංකික ජන සමාජයේ මුළුතැන්ගෙයි බඩු බාහිරාදිය අතර මැටි භාජන වලට පවතින්නේ සුවිශේෂී ස්ථානයකි. මැටි වළං නොමැති මුළුතැන්ගෙයක් ශ්‍රී ලංකාව තුළ සොයාගැනීමට අපහසුය. තාක්ෂණය පුද්ගල ජීවන රටාව වේගයෙන් වෙනස් කළ ද ඒ හා සමගාමීව පුද්ගලයන් පරිසර හිතකාමීභාවය හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් පිළිබඳ වඩාත් සැලකිලිමත් වීම හේතු කොටගෙන ආහාර පිසීමේ කටයුතු සඳහා යොදාගත් වෙනත් විකල්ප වලින් බැහැර වී මැටි භාවිතා කිරීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ඇත. විශාල ප්‍රාග්ධනයක් වැය නොකර ගෘහාශ්‍රිතව ආරම්භ කළ හැකි ව්‍යාපාරයක් ලෙසට මැටි භාජන නිෂ්පාදන ව්‍යාපාරය හැඳින්විය හැකි අතර නිර්මාණශීලීව නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමෙන් ලාභ උපරිම කළ හැකි ව්‍යාපාරයකි.

02. අවශ්‍ය ද්‍රව්‍ය (මැටි සැකසීම සඳහා)

ජලය
පස් සහ කලවම් පස්

03. වෙළඳපොල

ආහාර පිසීමේ හා පිළිගැන්වීමේ කටයුතු වලදී නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය සහ විවිධ ආදායම් මට්ටම් නියෝජනය කරන සියලු කාණ්ඩ වලින් ඉහළ ඉල්ලුමක් පවතින අතර බොහෝ පිසූ ආහාර නිෂ්පාදන ව්‍යාපාර තම නිෂ්පාදනයන්හි ප්‍රාථමික ඇසුරුම ලෙස මැටි භාජන භාවිතා කරයි. සිංහල අවුරුදු සමය වැනි සංස්කෘතික ක්‍රියාකාරකම් වල දී ද මැටි භාණ්ඩ වලට ප්‍රමුඛත්වය හිමි වේ. එමෙන්ම විදෙස් වෙළඳපොල තුළ ද මේ මැටි භාජන වලට පවතින්නේ ඉහළ ඉල්ලුමකි. වෙළඳපොල තුළ මැටි භාජන (මැටි වලං) සඳහා විකාකාරී මිලක් පවතින අතර නිෂ්පාදනයන් විවිධාංගීකරණය කිරීම තුළින් වෙනස් මිල ගණන් යටතේ අලෙවි කළ හැකිය. ගමෙහි පොළේ සිට සුපිරි වෙළඳසැල දක්වා පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබාගත හැකි අතර පහසුවෙන් ප්‍රවර්ධනය කළ හැකි භාණ්ඩයකි.

04. ආයෝජනය

දිනකට මැටි වලං 60 ක් සහ රොටි කබල් 10 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 270,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	- රු. 22,000.00
	මුළු එකතුව	- **රු. 292,000.00**

තිර මුද්‍රණය (ස්ක්‍රීන් ප්‍රින්ටින්)

1. හැඳින්වීම

තිර මුද්‍රණය (Screen Printing) යනු, සරල ලෙස දැක් වූ කල සිහින් නුල් වලින් යුත් සිල්ක් වර්ගයේ විශේෂ රෙද්දක් ලී හෝ ඇලුමිනියම් රාමුවක ඉතා හොඳින් ඇද සකස් කරගෙන එහි නුල් අතරින් අනවශ්‍ය කොටස වසා අවශ්‍ය තැන් වලට තීන්ත යවමින් පෘෂ්ටයක් මත මුද්‍රණය කිරීම වෙයි. මෙම මුද්‍රණ ක්‍රමයේ ආරම්භය සිදුවී ඇත්තේ ක්‍රි .ව 960-1279 යන කාලවකවානු වල චීනය මුල් කරගෙන වන අතර පසුව ජපානය සහ ලෝකය පුරා ව්‍යාප්ත විය. වර්තමානයේ මුද්‍රණ ක්‍රමවේදය තුල මෙම තිර මුද්‍රණය බහුලව භාවිතා කරනු දක්නට ඇත. ස්ක්‍රීන් ප්‍රින්ටින් බහුලව රෙදි ආශ්‍රිත මුද්‍රණය සඳහා අප රටෙහි භාවිතයට ගනු ලබන අතර ගෘහස්ථ කර්මාන්තයක් ලෙස දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ව්‍යාපාරය සුදුසු වෙයි. මෙම තිර මුද්‍රණ ක්‍රියාවලියේ මූලිකම වාසියක් වනුයේ සරල තාක්ෂණයකින් හා අවම පිරිවැයකින් සිදුකළ හැකි වීමය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

තීන්ත වර්ග / ඉමල්ෂන් වර්ග / ඉමල්ෂන් රිමුවර් / තින්කර් වර්ග / කෙමිකල් වර්ග

3. වෙළඳපොල

ස්ක්‍රීන් ප්‍රින්ටින් ක්ෂේත්‍රය සඳහා වර්ධනය වන වෙළඳපොල ඉල්ලුමක් දක්නට ලැබේ. ඕනෑම මතුපිටක් මත මුද්‍රණය කිරීමට මින් හැකියාව පවතින නිසා ටී ෂර්ට්, සරොම් වැනි ඇඟලුම් ක්ෂේත්‍ර මත පමණක් නොව පාවහන්, කඩදාසි, උපකාරක පන්ති යනාදී ව්‍යාපාර ක්ෂේත්‍රයන්ගෙන් ද ස්ක්‍රීන් ප්‍රින්ටින් සඳහා ඉල්ලුමක් පවතී. වෙළඳපොල වෙත පිවිසීමේ දී මෙම ව්‍යාපාර අවස්ථාවේ පවතින විශේෂත්වය වනුයේ ව්‍යවසායකයාගේ පවතින නිර්මාණශීලිත්වය මත අවම පිරිවැයක් සහ අවම තාක්ෂණයක් මත පහසුවෙන් වෙළඳපොල වෙත පිවිසීමේ අවස්ථාව හිමි වීමය.

අප රට තුල ගෘහ කර්මාන්තයක් ලෙස මෙම ව්‍යාපාරය ප්‍රචලිත කිරීම තුලින් තිර මුද්‍රණ ව්‍යාපාරය සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොල අවස්ථාවන්ද උදා වනු ඇත.

4. ආයෝජන

සතියකට ටී ෂර්ට් 185 ක් ද, සරොම් 100 ක් ද, ගවුම් 100 ක් ද, බ්ලවුස් 100ක් ද ස්ක්‍රීන් ප්‍රින්ටින් කරනු ලබන අතර, සතියට දින 6 ක් වැඩකරනු ලබන ව්‍යාපාරයක් සඳහා අවම ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 91,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	- රු. 20,500.00
	මුළු එකතුව	- **රු. 112,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානයට අදාළව මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	ප්‍රමාණය	වටිනාකම (රු.)
1	ඇලුමිනියම් රාමු මෙෂ් (mesh) සමග	15	20,000.00
2	ක්ලැම්ප් (clamp)	2	2,000.00
3	ස්කුවිජී (squeegee)	3	3,000.00
4	ස්කූප් කෝටර්	1	1,500.00
6	exposure unit		15,000.00
7	රාක්ක	2	30,000.00
8	වියලන යන්ත්‍රය (dryer)		10,000.00
9	ටී ෂර්ට් බෝඩ	10	10,000.00
	මුළු වකතුව		91,500.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

සතියකට ටී ෂර්ට් 185 ක් ද, සරොම් 100ක් ද, ගවුම් 100 ක් ද, බ්ලවුස් 100 ක් ද ස්ක්‍රීන් ප්‍රින්ටින් කරනු ලබන අතර සතියට දින 6 ක් වැඩකරනු ලැබේ.

අංක	විස්තරය	සතියක වියදම (රු.)
1	අමුද්‍රව්‍ය	12,500.00
2	ශ්‍රම වැටුප්	7,500.00
3	වෙනත්	500.00
	වකතුව	20,500.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

පිටතින් රැගෙන එනු ලබන නිෂ්පාදන සඳහා පමණක් ස්ක්‍රීන් ප්‍රින්ටින් කරනු ලබන බවට උපකල්පනය කර ඇත. මසකට ටී ෂර්ට් 750 ක් ද, සරොම් 400ක් ද, ගවුම් 400 ක් ද, බ්ලවුස් 400 ක් ද ස්ක්‍රීන් ප්‍රින්ටින් කරනු ලබන අතර, මසකට දින 25 ක් වැඩකරනු ලබන බවට උපකල්පනය කර ඇත. ඒ අනුව

මාසික විකුණුම් ආදායම

ටී ෂර්ට් 750 ක් ද, සරොම් 400ක් ද, ගවුම් 400ක් ද, බ්ලවුස් 400 ක් සඳහා

- ටී ෂර්ට් 750 × රු. 35 - රු. 26,250.00
- සරොම් 400 × රු. 100 - රු. 40,000.00
- ගවුම් 400 × රු. 100 - රු. 40,000.00
- බ්ලවුස 400 × රු. 50 - රු. 20,000.00

මාසික විකුණුම් ආදායම - රු. 126,250.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම

සතියක සෘජු පිරිවැය = රු. 12,500.00 + රු. 7,500.00 + රු. 500.00
= රු. 20,500.00 x සති 4
= රු. 82,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ (ජලය, දුරකථන සංග්‍රහ ,නඩත්තු ආදි අනෙකුත් වියදම්). එක් මාසයක් සඳහා රු. 9,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 126,250.00 - (රු. 82,000.00 + රු. 9,000.00)
= රු. 126,250.00 - රු. 91,000.00
= රු. 35,250.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට වැටුප ලෙස රු. 30,000.00 ශුද්ධ ලාභය රු. 35,250.00 ක මුදලක් උපයාගත හැකිය.

වේවැල් නිෂ්පාදනය

01. හැඳින්වීම

අතීතයේ සිටම ලංකාව තුළ වේවැල් කර්මාන්තයෙහි යෙදුණු පිරිසක් සිටි බැවින් වේවැල්දෙණිය, වේවැල්දූව, වේවැල්කඳුර, වේවැල්වල, වේවැල්පනාව වැනි ග්‍රාම නාමයන් අදටත් දක්නට ලැබේ. ලංකාවේ ආදිවාසී ජනතාව බඹර කැපීම සඳහා අවශ්‍ය වුණු ඉණිමං සෑදීම සඳහා වේවැල් භාවිතා කළ බවත් දෙවන පෑතිස් රජ සමයේ මෙරටට පැමිණි ශිල්ප ශ්‍රේණි 18කට අයත් පිරිස අතර කුළු පොත්තන් නමින් හඳුන්වනු ලැබූ පිරිසක් සිටි බවත් ඉතිහාසයේ සඳහන් වේ. ඔවුන්ට පැවරී තිබුණු රාජකාරිය වුයේ වේවැල් භාවිතා කරමින් විවිධ භාණ්ඩ නිෂ්පාදනයයි. ශ්‍රී ලංකාවේ වේවැල් කර්මාන්තයේ නිරත වූ පිරිසක් සිටි බව රොබට් නොක්ස් ඔහුගේ වාර්තාවල සඳහන් කර ඇත. ඒ අනුව, ඉහත සඳහන් කළ කරුණු වලින් පැහැදිලිවම පෙනීයන්නේ මෙරට වේවැල් කර්මාන්තය දිගු ඉතිහාසයකට හිමිකම් කියන බවයි.

වර්තමානය වනවිට බොහොමයක් ලක්වාසී ජනතාව මෙන්ම සමස්ත ලෝකවාසී ජනතාවම පරිසර හිතකාමී නිෂ්පාදන පරිහරණය කෙරෙහි ඉහළ ප්‍රවණතාවයක් දක්වන බව පෙනී යයි. තවද, අප රට තුළ මෙම කර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් වේවැල් කර්මාන්තය වෙනම අමාත්‍යාංශයක් යටතට පත් කර අවශ්‍ය පහසුකම් සැපයීමට රජය විසින් කටයුතු කරමින් සිටි. ඒ අනුව, නිර්මාණශීලිත්වය මත අගය තීරණය වන මෙම කර්මාන්තය ආශ්‍රිත නිපැයුම් සඳහා ඉහළ ව්‍යාපාරික අවස්ථාවක් නැවත නිර්මාණය වෙමින් පවති.

02. අවශ්‍ය අමුද්‍රව්‍ය

- පටි වේවැල්/ ගෙඩි වේවැල් තම ප්‍රදේශය තුළින්ම සපයා ගත හැකි නම් වියදම අවම කරගත හැකි අතර නැතහොත් දේශීය හෝ ආනයනික වේවැල් ලබාගැනීමට අවස්ථාව පවති.

- වේවැල් දඬු - ගෘහ භාණ්ඩ නිෂ්පාදයේදී ඉහළ ප්‍රමිතියකින් සිදුකරයි නම් වේවැල් දඬු යොදා ගත හැකි අතර කුරුඳු, ගිනිසීරියා වැනි දෑ භාවිතා කරන අවස්ථාද පවති.

- ඇණ - පිත්තල ඇණ භාවිතා කරයි නම් පිරිවැය ඉහළ යන අතර ඊට සාපේක්ෂව විකුණුම් මිල මෙන්ම කල් පැවැත්මද ඉහල වේ. නමුත්, යකඩ ඇණ භාවිතා කරන්නේ නම් නිෂ්පාදන පිරිවැය මෙන්ම විකුණුම් මිල සහ කල්පැවැත්මද අඩුවේ.

- ගම් - ප්‍රමිතියෙන් යුත් කිරිගම්

- රසායනික ද්‍රව්‍ය - හයිඩ්‍රජන් ෆෙරොක්සයිඩ්, කෝස්ටික් සෝඩා, පොලිස් සහ ටිනර්

03. වෙළෙඳපොළ

පරිසර හිතකාමී අමුද්‍රව්‍යයක් වන වේවැල් වලින් නිම කරන ලද ගෘහ භාණ්ඩ, මුළුතැන්ගෙයි උපකරණ, කාර්යාලීය උපකරණ සහ විසිතුරු භාණ්ඩ වැනි දෑ අවුරුදු 25 කටත් වඩා අධික කාලයක් වුවද භාවිතා කිරීමේ හැකියාවත්, ස්වභාවික අමු අමුද්‍රව්‍ය භාවිතා කරන බැවින් සෞඛ්‍ය හිතකර බවත්, වේවැල් භාණ්ඩ භාවිතා කිරීමේදී අත්විඳිය හැකි වාසි ලෙස සඳහන් කළ හැකිය. එබැවින්, මුළුතැන්ගෙයි උපකරණ වැනිදෑ ඕනෑම ආදායම් මට්ටමක පාරිභෝගිකයින් හට අලෙවි කිරීමේ අවස්ථාව පවතින අතර, අන් සියලු වේවැල් නිෂ්පාදන ඉහල ආදායම්ලාභී පාරිභෝගික කණ්ඩායමට මෙන්ම සංචාරකයින් ප්‍රමුඛ අපනයනය වෙළෙඳපොළ අවස්ථා උදාකර ගැනිමේ හැකියාව පවති.

තවද, ජාතික ශිල්ප සභාවේ අලෙවි මධ්‍යස්ථාන (ගාල්ල, කොටුව, පොල්ගොල්ල, සීගිරිය, මොලගොඩ, වරාගොඩ සහ වාරියපොළ), ලක්සල අලෙවි ශාඛා - ලක් මැදුර, ලක් පහන, ලංකා හෑන්ඩ්ස් මෙන්ම සුපිරි වෙළෙඳසැල් සහ සංචාරක පුරවරයන්හි පිහිටි අලෙවිසැල් හරහා පමණක් නොව විවිධ අලෙවි හා අධ්‍යාපනික ප්‍රදර්ශනය භූමි තුළද අලෙවිකරණ අවස්ථා උදාකරගැනිමේ හැකියාව නිර්මාණශීලී ව්‍යවසායකයින්ට පවති.

04. ආයෝජනය

පැය භාගයකින් ඉඳිඅප්ප වට්ටියක් බැගින් දින 05ක් තුළ වට්ටි 80 ක්, දිනකට මාර්කට්න් බෑග් 01 බැගින් දින 01 ක් තුළ බෑග් 04ක්, පැයකට පලතුරු / මල් වට්ටිය බැගින් දින 04 ක් තුළ වට්ටි 32 ක්, දින දෙකකට එක් විසිතුරු (ලෑම්ප් සෙඩ් ආදි) නිර්මාණය බැගින් දින 06 ක් තුළ නිර්මාණ 03 ක් සහ දිනකට 01 බැගින් දින 06 ක් තුළ ගෘහ භාණ්ඩ (පොත් රාක්ක ආදි) 06 ක් නිෂ්පාදනය කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 80,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 47,600.00
	මුළු එකතුව	- **රු. 127,600.00**

ව්‍යවසායකයා විසින් තෝරගන්නා නිෂ්පාදන කාණ්ඩයන් අනුව සහ දින ගණන අනුව ගණනය කිරීම් වෙනස්වේ.

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අනු. අංකය	යන්ත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
1	ගෑස් ලාම්පුව (ටෝච්)	7,000.00
2	ගෑස් සිලින්ඩරය	5,500.00
3	කොම්ප්‍රෙෂර්	30,000.00
4	කැපුම් උපකරණ (වේවැල් කපන පිහිය, කැත්ත, උල්කටු පිහිය, බූට් සපත්තු)	7,000.00
5	අච්චු තල (වේවැල් සිහින්ව ඉරා ගැනීමට සහ මැද ගැනීමට)	2,000.00
6	රාක්ක (අමුද්‍රව්‍ය සහ නිමැවුම් තැබීමට)	10,000.00
7	හෑන්ඩ් ග්‍රිල්	7,500.00
8	ග්‍රයින්ඩර්	7,500.00
9	වෙනත් අත් වැසුම්, බේසම්, කතුරු ආදි)	3,500.00
	එකතුව	80,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

පැය භාගයකින් ඉඳි ආප්ප වට්ටියක් බැගින් දින 05ක් තුළ වට්ටි 80ක්, දිනකට මාර්කට්ටින් බෑග් 01බැගින් දින 04ක් තුළ බෑග් 04 ක් , පැයකට පලතුරු / මල් වට්ටිය බැගින් දින 04ක් තුළ වට්ටි 32ක්, දින දෙකකට එක් විසිතුරු (ලෑම්ප් සෙඩ් ආදි) නිර්මාණය බැගින් දින 06ක් තුළ නිර්මාණ 03ක් සහ දිනකට 01 බැගින් දින 06ක් තුළ ගෘහ භාණ්ඩ (පොත් රාක්ක ආදි) 06ක් නිෂ්පාදනය කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

අනු. අංකය	විස්තරය	ඒකක වියදම රු.	මාසික වියදම රු.
1	අමුද්‍රව්‍ය - පට්ටි වේවැල් 5kg	2,000.00	10,000.00
2	අමුද්‍රව්‍ය - ගෙඩි වේවැල් (අඩි 12 වැල් 300)	24.00	7,200.00
3	ශ්‍රම වියදම (දිනකට)	1000.00	25,000.00
4	ගෑස් 12.5kg /මාස 05 (රු. 1,800.00/05)	360.00	360.00
5	රසායනික ද්‍රව්‍ය සහ පොලිස් (කෑලි 45කට)	100.00	4,500.00
6	ඇණ (යකඩ) - 2kg	270.00	540.00
	එකතුව		47,600.00

4.3 මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මාසයකට දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන අතර දිනකට පැය 08 බැගින් වූ එක් දිනකදී එක් නිෂ්පාදන වර්ගයක් බැගින් ඉදිඅප්ප වට්ටි දින 05ක්, මාර්කට්ටින් බෑග් දින 04ක්, වට්ටි දින 04ක්, ගෘහ භාණ්ඩ දින 06ක් සහ විසිතුරු නිර්මාණ දින 06ක් වශයෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකරන බවට ඇස්තමේන්තු කර ඇත. ඉදිඅප්ප වට්ටි 01ක මිල රු. 31.00ක්, මාර්කට්ටින් බෑග් 01ක මිල රු. 1,500.00ක්, පලතුරු / මල් වට්ටියක් රු. 250.00ක්, ගෘහ භාණ්ඩ (පොත් රාක්කයක්) රු. 8,000.00ක් සහ විසිතුරු නිර්මාණ (ලෑම්ප් සෙඩ්) 01ක මිල රු. 6,000.00ක් බැගින් වෙළෙඳපොළට නිකුත් කරයි.

ඒ අනුව,

මාසික විකුණුම් ආදායම	= මාසික නිෂ්පාදන ඒකක ප්‍රමාණය × ඒකකයක අලෙවි මිල
ඉදි ආප්ප වට්ටි	= ඒකක 80 × රු. 31.00 = රු. 2,480.00
මාකට්ටින් බෑග්	= ඒකක 4 × රු. 1,500.00 = රු. 6,000.00
වට්ටි	= ඒකක 32 × රු. 250.00 = රු. 8,000.00
ගෘහ භාණ්ඩ	= ඒකක 6 × රු. 8,000.00 = රු. 48,000.00
විසිතුරු නිර්මාණ	= ඒකක 03 × රු. 6,000.00 = රු. 18,000.00
මුළු මාසික විකුණුම් ආදායම	= රු. 82,480.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

■ සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම

මාසික සෘජු පිරිවැය = රු. 17,200.00 + රු. 25,000.00 + රු. 5,400.00

= රු. 47,600.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යෑම සඳහා දරණ වියදම් (ජලය, විදුලිය, දුරකථන ගාස්තු, ප්‍රවාහන, අලෙවිකරණය, ආදි අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 5,000.00 ක් ලෙස ඇස්තමීන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය

= රු. 82,480.00 - (රු. 47,600.00 + රු. 5,000.00)

= රු. 82,480.00 - රු. 52,600.00

= රු. 29,880.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සහ බෙදාහැරීමේ කටයුතු සිදුකරයි නම් ඔහුට මසකට රු. 25,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර ශුද්ධ ලාභය වශයෙන් රු. 29,880.00 ක් ඉපැයීමට අවස්ථාව පවතී.

උණුසුම් ඇඳුම් නිෂ්පාදනය

1. හැඳින්වීම

සීත දේශගුණයක් පවතින නුවරඑළිය, හැටන් වැනි ප්‍රදේශවල ජනතාව පවතින දැඩි සීතලෙන් ආරක්ෂා වී ඔවුන්ගේ එදිනෙදා කටයුතු කරගැනීම උදෙසා උණුසුම් ඇඳුම් භාවිතා කරයි. සෑම දිනකම මෙම උණුසුම් ඇඳුම් බොහෝ විට දිනය පුරාම ඇඟලාගෙන සිටින බැවින් සාමාන්‍යයෙන් එක් පුද්ගලයෙක් අවම වශයෙන් වසරකට උණුසුම් ඇඳුම් තුනක් වත් මිලදී ගනී. එමෙන්ම සංචාරක නගරයක් වශයෙන් ප්‍රචලිත නුවරඑළිය නගරයට පැමිණෙන සෑම සංචාරකයෙක්ම පාහේ උණුසුම් ඇඳුම් කට්ටලයක් මිලදී ගැනීමට යොමුවේ.

උණුසුම රඳවාගත හැකි බෝවා, ෆෙෂින්, පටගෝනි, කොටබෝවා වැනි රෙදි වලින් හා ජලය කාන්දු නොවන රෙක්සීන් රෙදි වලින් ද උණුසුම් ඇඳුම් නිර්මාණය කිරීමේ හැකියාව පවතී.

උණුසුම් ඇඳුම් කුඩා ළමුන් සඳහා කුඩා, මධ්‍යම, විශාල යන ප්‍රමාණ වලින්ද වැඩිහිටියන් සඳහා කුඩා, මධ්‍යම, විශාල, ඉතා විශාල ප්‍රමාණවලින් ද නිර්මාණය කරනු ලබයි.

උණුසුම් ඇඳුම් නිශ්පාදනය කිරීමේ ව්‍යාපාරය ගෘහ ආශ්‍රිතව ආරම්භ කළ හැකි ලාභදායි කර්මාන්තයක් ලෙස හඳුන්වා දිය හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

බෝවා රෙදි- උණුසුම ඉතා ඉහල මට්ටමක රඳවා ගත හැකි, යම් පමණක ඉහල මිලක් වන ආනයනික රෙදි විශේෂයකි.

ෆෙෂින් රෙදි- අනෙක් රෙදි වර්ග වලට සාපේක්ෂව උණුසුම රඳවා ගත හැකි ප්‍රමාණය, යම් ප්‍රමාණයක අඩුවක් දක්නට ලැබුනද මිල ගණන්ද සාපේක්ෂව අඩු රෙදි වර්ගයකි.

ෂිප් වර්ග- මේ සඳහා ආනයනික ෂිප් වර්ග මෙන්ම කිලෝ ගණනට වෙළඳපොලෙන් තොග මිලට ලබාගන්නා ෂිප් වර්ගද යොදා ගත හැකිය.

නූල් හා රිබ් වර්ග - මෙම නූල් හා රිබ් වර්ග කිලෝ ගණනට වෙළඳපොලෙන් තොග මිලට ලබාගත හැකිය.

ඉහත අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී හැකි සෑම විටම තොග මිලට මිලදී ගැනීමේදී ලබන ලාභ ප්‍රමාණය වැඩිකරගත හැකිය.

3. වෙළඳපොල

උණුසුම් ඇඳුම් සඳහා නුවරඑළිය හා හැටන් ප්‍රදේශවල විශාල ඉල්ලුමක් පවතින අතර ම සංචාරක නගරයක් ලෙස නම් දරා සිටින නුවරඑළිය නගරයට පැමිණෙන සංචාරකයින් හා හග්ගල උද්භිද උද්‍යානයට පැමිණෙන සංචාරකයින් ඉලක්ක කරගෙන මෙන්ම ශ්‍රී පාද සමයේ පැමිණෙන සංචාරකයින් ඉලක්ක කරගෙන මෙම ව්‍යාපාරයේ වෙළඳාම පුළුල් කල හැකිවේ. එසේම පාසල් ළමුන් සඳහා පාසල් නිළ ඇඳුමට අමතර ව අදාළ පාසලේ ලාංඡනය සහිතව නිළ ඇඳුමක ආකාරයෙන් උණුසුම් ඇඳුම් අවශ්‍ය වීම ද තවත් වෙළෙඳපොළ අවස්ථාවකි.

4. ආයෝජනය

ලාභය උපරිම කර ගැනීම උදෙසා එක් අයෙකු විසින් දිනකට උණුසුම් ඇඳුම් 12ක් නිශ්පාදනය කරන බව සලකා ගණනය කිරීම් කර ඇත.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 225,370.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියකට)	- රු. 43,920.00
	මුළු එකතුව	- **රු. 269,290.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01.	ජුකී මැෂින්	67,900.00
02.	නූල් 05 ඕවලොක් මැෂින්	103,700.00
03.	කැපුම් යන්ත්‍රය	20,100.00
04.	අනෙකුත් උපකරණ	11,670.00
05.	ලී බඩු	22,000.00
	එකතුව	225,370.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

ලාභය උපරිම කර ගැනීම උදෙසා එක් අයෙකු විසින් දිනකට උණුසුම් ඇඳුම් 12ක් නිශ්පාදනය කරන බව සලකා ගණනය කිරීම් කර ඇත.

අංක	විස්තරය	දිනක් සඳහා රු.	(සතියකට) රු.
01	සෘජු අමුද්‍රව්‍ය	5,000.00	35,000.00
02	ශ්‍රම වියදම	650.00	7,800.00
03	සෘජු වෙනත්	160.00	1,120.00
	එකතුව	5,810.00	43,920.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

යොදා ගන්නා රෙදි වර්ගය හා උණුසුම් ඇඳුමේ ප්‍රමාණය මත මිල ගණන් වෙනස් වන අතර මෙම සැලසුම සැකසීමේදී වැඩි වශයෙන් අලෙවි වන බෝවා හා ෆෙෂින් රෙදි වර්ග වලින් නිෂ්පාදනය කරනු ලබන මධ්‍යම හා විශාල ප්‍රමාණයේ වැඩිහිටි උණුසුම් ඇඟලුම් පමණක් නිර්මාණය කර තොග මිලට විකිණීම උපකල්පනය කර ඇත.

ලාභය උපරිම කර ගැනීම උදෙසා එක් අයෙකු විසින් දිනකට උණුසුම් ඇඳුම් 12ක් බැගින් මසකට දින 25 ක් වත් නිශ්පාදනය කළ යුතු වේ. ඒකක විකුණුම් මිල රු. 650.00 කි

ඒ අනුව

මාසික විකුණුම් ආදායම = විකුණුම් ප්‍රමාණය × විකුණුම් මිල

= 300 × රු. 650.00

= රු. 195,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = (සෘජු අමුද්‍රව්‍ය + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත්) × දින ගණන
= (රු. 5,000.00 + රු. 650.00 + රු. 160.00) × 25
= රු. 145,250.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ (විදුලි, ප්‍රවාහන, අලෙවි ඇසුරුම් ආදි අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 12,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 195,000.00 - (රු. 145,250.00 + රු. 12,000.00)
= රු. 195,000.00 - රු. 157,250.00
= රු. 37,750.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 16,250.00 ක වැටුපක් ලබා ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 37,750.00 ක් උපයාගත හැකිය.

තී වීල් රථ ටින්කරින් හා පෙන්ටින්

1. හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ මේ වන විට ගමනාගමනය සඳහා බහුලව ම ත්‍රී රෝද රථ යොදාගනු ලබන අතර, දිවයින පුරා ත්‍රී රෝද රථ 1,150,000ක් පමණ පරිහරණය වන බව මෝටර් රථ දෙපාර්තමේන්තු දත්ත අනුව පැහැදිලි වේ. ඒ අනුව ත්‍රී රෝද රථ ටින්කරින් හා පින්තාරු කිරීම සඳහා වර්තමානයේ ප්‍රශස්ථ වෙළෙඳපොල අවස්ථාවක් පවතී. මේ සඳහා අවශ්‍ය දැනුම වෘත්තීය පුහුණු අධිකාරිය සහ කාර්මික විද්‍යාල මගින් ලබාගැනීමේ හැකියාව පවතින අතර, මෙම ව්‍යාපාරය තරුණ පරපුරට තමාගේ දැනුම උපයෝගී කරගෙන සිදුකළ හැකි ව්‍යාපාර අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

මෙම ව්‍යාපාරය සඳහා අමුද්‍රව්‍ය ලෙස තීන්ත, ෆිලර්, පොටි, තිනර්, වැලි කඩදාසි, වාහන සේදුම්කාරක වර්ග, ආදී ද්‍රව්‍ය දැක්විය හැකිය. ඒවා වෙළඳපොළ තුළ බහුල ව දක්නට ඇත.

3. වෙළඳපොල

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක මෙම ව්‍යාපාරය සාර්ථකව පවත්වාගෙන යාමේ හැකියාව ඇත. විශේෂයෙන් නාගරික ජනතාව අතර මෙම ත්‍රී රෝද රථ ටින්කරින් හා පින්තාරු කිරීම වඩා ප්‍රචලිතය. ඒ අනුව නාගරික තරුණ ප්‍රජාව මෙම ව්‍යාපාර ක්ෂේත්‍රය කෙරෙහි යොමු වීම කාලෝචිත වේ. එසේම ත්‍රීරෝද රථ නිතර අනතුරු වලට භාජනය වන බැවින් මේ වන විට මෙම ව්‍යාපාරය සඳහා විශාල විභවතාවයක් ඇතිවෙමින් පවතී.

4. ආයෝජනය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 360,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	- රු. 80,000.00
	මුළු එකතුව	- **රු. 440,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ප්‍රාදේශීයව මෙම මිල ගණන් වෙනස් විය හැක.

අංක	ස්ථාවර වත්කම	වටිනාකම (රු.)
01	ගොඩනැගිල්ල (බදු පදනම මත)	60,000.00
02	අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ (හුළං කම්ප්‍රෙසරය / ස්ප්‍රේ ගන් එක / ඔක්සිජන් ප්ලාන්ට් එක හා අනෙකුත් උපකරණ)	300,000.00
	එකතුව	360,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

අනුඅංක	විස්තරය	මාසික වියදම (රු)
01	අමුද්‍රව්‍ය වියදම	61,000.00
02	ශ්‍රම වියදම	15,000.00
03	වෙනත් වියදම්	4,000.00
	එකතුව	80,000.00

5. ශුද්ධ ලාභය

සැ. යු.- ත්‍රී රෝද රථ ටින්කරින් හා පින්තාරු කිරීම සඳහා භාරගැනීමේ දී අත්තිකාරම් මුදලක් ලබා ගත හැකි බැවින් එය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා යෙදවිය හැකිය.

සාමාන්‍යයෙන් මසකට ත්‍රී රෝද රථ 2 ක් පින්තාරු කළ හැකි අතර, එක් රථයකට රු. 60,000.00 බැගින් රු. 120,000.00 ක ආදායමක් ලබා ගත හැකිය. අනෙකුත් නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සඳහා මසකට රු. 30,000.00 ක අමතර ආදායමක් ද ලබා ගත හැකිය.

මාස 1 ක ආදායම (රු. 120,000.00 + රු. 30,000.00) = රු. 150,000.00

මාස 1 ක මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්

= රු. 61,000.00 + රු. 15,000.00 + රු. 4,000.00

= රු. 80,000.00

වක්‍ර පිරිවැය මාස 1 ක් සඳහා රු. 28,800.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. (ජල බිල්පත්, විදුලි බිල්පත්, දුරකථන බිල්පත් ආදී...)

මාස 1ක ශුද්ධ ලාභය = මාස 1ක විකුණුම් ආදායම - මාස 1ක මුළු පිරිවැය

= රු. 150,000.00 - (රු. 80,000.00 + රු. 28,800.00)

= රු. 150,000.00 - රු. 108,800.00

= රු. 41,200.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 15,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 41,200.00 ක් උපයාගත හැකිය.

අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය

01. හැඳින්වීම

අත්යන්ත්‍ර ආශ්‍රිතව නිෂ්පාදනය කෙරෙන රෙදිපිළි සඳහා දේශීයව මෙන්ම විදේශීය වෙළඳපොලේ ද ඉහළ ඉල්ලුමක් පවතී. ගුණාත්වය සහ කල්පැවැත්ම අතින් මේවා ඉහළ අගයක් ගන්නා අතර මෙම නිෂ්පාදන සාරි, සරොම්, කර්ටන් රෙදි, ඇඳ ඇතිරිලි, මේස රෙදි, අත් පිස්නා, අතින් වියන ලද පා පිස්නා, කාපට් සහ ළමා සෙල්ලම් බඩු ආදී වශයෙන් විවිධ වේ. මේ සඳහා අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා නූල් වල ඝණකම සහ නූල් ප්‍රමාණය නිෂ්පාදන වර්ගය අනුව වෙනස් වේ. එසේම අත්යන්ත්‍ර නිෂ්පාදනයන් වයස් භේදයකින් තොරව සියලුම පාරිභෝගික කණ්ඩායම් ඉලක්ක කර නිෂ්පාදනය කළ හැකිය. මෙය වෙළඳපොලින් පහසුවෙන් සපයාගත හැකි අමුද්‍රව්‍ය යොදාගනිමින් (කපු නූල්) ගෘහාශ්‍රිතව සිදුකළ හැකි ව්‍යාපාර අවස්ථාවකි.

02. අවශ්‍ය අමුද්‍රව්‍ය

කපු නූල් - මේවා වෙළඳපොලින් පහසුවෙන් සපයාගත හැකි වේ. (කොළඹ, මහනුවර, මරදමුණ ආදී ප්‍රදේශ වල බහුලව පවතී.)

03. වෙළඳපොළ

වර්තමානයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වන අත්යන්ත්‍ර රෙදිපිළි වලට දිනෙන් දින වර්ධනය වන ඉල්ලුමක් පවතී. වෙළඳපොල තුළ මේ සඳහා පවතින මිල ගණන් ගුණාත්වය මත පදනම්ව තීරණය වී ඇත. මෙම නිෂ්පාදන පාරිභෝගිකයන්ගේ වයස් භේදයකින් තොරව (බාල, තරුණ සහ වැඩිහිටි) අලෙවි කළ හැකිය. ගුණාත්වය සහ ඇසුරුමේ ස්වභාවය අනුව මිල ගණන් වෙනස් වේ.

04. ආයෝජනය

දිනකට රෙදි යාර 5 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් සිදු කළ යුතු ආයෝජනය ඇස්තමේන්තුගත කර ඇත.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	රු. 120,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	රු. 12,000.00
	මුළු පිරිවැය	**රු. 132,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍යම යැයි තහවුරු කළ අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාර ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
01	අත් යන්ත්‍රය	70,000.00
02	වයින්ඩින් මැෂින්	10,000.00
03	වෝප් රෝල	20,000.00
04	බොබින්, ෆර්න්, සැටල්බොක්ස්, හුලුබෑව හා අනිකුත් උපකරණ	20,000.00
	මුළු එකතුව	120,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට රෙදි යාර 5 ක් නිෂ්පාදනය සිදු කෙරෙන අතර සතියකට දින 6 ක් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලැබේ.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු.)
01	අමුද්‍රව්‍ය සඳහා	800.00	4,800.00
02	ශ්‍රමය සඳහා වියදම	1,000.00	6,000.00
03	වෙනත් වියදම්	200.00	1,200.00
	එකතුව	2,000.00	12,000.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට දින 25 ක් නිෂ්පාදන කටයුතු සිදු කරන බවට ඇස්තමේන්තු කර ඇත. එක් දිනකදී රෙදි යාර 5 ක් නිෂ්පාදනය කරන අතර රෙදි යාරයක මිල රු. 685.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික විකුණුම් ආදායම
(දින 25 × දිනක නිෂ්පාදනය රෙදි යාර 5 × රෙදි යාරයක මිල රු. 685.00) = රු. 85,625.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රමය වියදම් + සෘජු වෙනත් වියදම්

දිනක සෘජු පිරිවැය = රු. 800.00 + රු. 1,000.00 + රු. 200.00
= රු. 2,000.00 × 25
= රු. 50,000.00

වක්‍ර පිරිවැය
ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජලය, විදුලිය සහ ප්‍රවාහන ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 8,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 85,625.00 - (රු. 50,000.00 + රු. 8,000.00)
= රු. 85,625.00 - රු. 58,000.00
= රු. 27,625.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මසකට වැටුප ලෙස රු. 25,000.00 ක මුදලක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 27,625.00 උපයාගත හැකිය.

කඩදාසි බෑග් නිෂ්පාදනය

1. හැඳින්වීම

වර්තමානයේ පරිභෝජන රටාව තුළ සෞඛ්‍යයට හිතකර හා පරිසරයට හිතකර නිෂ්පාදනයන් කෙරෙහි සීඝ්‍ර නැඹුරුවක් දක්නට ඇත. ඊට අනුකූල වන පරිදි ආර්ථික ප්‍රතිපත්ති සැකසෙමින් පවතී. පොලිතීන් භාවිතය අවම කිරීම මේ යටතේ ගත් ඉතා වැදගත් තීරණයකි. පොලිතීන් බෑග් ආනයනය අවම කරමින් පරිසර හිතකාමී බෑග්, ආවරණ හා කවර භාවිතය වර්තමානයේ ප්‍රවර්ධනය කරමින් පවතී. කඩදාසි වැනි පුනර්ජනනීය අමුද්‍රව්‍යයක් භාවිතයෙන් නිෂ්පාදනය කරන බෑග් හා කවර මේ අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී.

පහත සඳහන් වාසි සහගත තත්ත්වයන් හේතුවෙන් කඩදාසි බෑග් නිෂ්පාදනය ව්‍යවසායකයෙකුහට ආරම්භ කළ හැකි වඩාත් යෝග්‍ය විකල්ප ව්‍යාපාර අවස්ථාවක් වී ඇත.

නිෂ්පාදනය හා සංවිධානය සංකීර්ණ නොවීම, වෙළඳපොළේ මෙම අංශයට ඇතුල් වීමේ පහසුව, විශේෂ ප්‍රාගුණ්‍යයක් /තාක්ෂණයක් අවශ්‍ය නොවීම, ආයෝජන මත ප්‍රතිලාභ ලැබීමට ගත වන කාලය අවම වීම, පුළුල් පාරිභෝගික වෙළඳපොළක් පැවතීම.

විවිධ භාවිතාවන් සඳහා යොදා ගත හැකි කඩදාසි ඇසුරුම් නිෂ්පාදනයන් වඩාත් ලාභදායී ලෙස නව්‍යතාවන් සිදුකරමින් ස්ථායී ලෙස පවත්වාගෙන යා හැකි ජීවනෝපාය සංවර්ධන ආර්ථික කටයුත්තකි.

2. අවශ්‍ය අමු ද්‍රව්‍ය

Craft Papers
බයින්ඩර් ගම්

3. වෙළඳපොළ

ප්‍රවේශයට පහසු හා ඉහළ ඉල්ලුමක් පවතින වෙළඳපොළක් කඩදාසි බෑග් නිෂ්පාදනය සඳහා පවතී. විවිධ ප්‍රමාණයන්ගෙන් විවිධ භාවිතයන් සඳහා විවිධ මිල ගණන් යටතේ කඩදාසි බෑග් ගැනුම් කරුවන් වෙළඳපොළ තුළ සිටී. සුපිරි වෙළඳසැල් , බේකරි , අවන්හල් සහ ක්ෂණික ආහාර වෙළඳසැල් , තෑගි හා ඇඟළුම් අලෙවිසැල්, තොග හා සිල්ලර අලෙවිසැල්, ඖෂධ අලෙවිසැල් , පළතුරු වගා කරුවන් හා මල් පැල තවාන්කරුවන් විශාල වශයෙන් කඩදාසි බෑග් නිෂ්පාදන ඉල්ලුම් කරයි. හරිත සුපිරි වෙළඳසැල් නැමති සංකල්පය තුළ මෙවැනි නිෂ්පාදන සඳහා අඛණ්ඩ වෙළඳපොළක් නිර්මාණය වෙමින් පවතී. භාවිතය කෙටි කාලීන වීම නිසා වෙළඳපොළ තුළ සීමිත නොවන ඉල්ලුමක්ද ඇත.

4. ආයෝජනය

සතියකට පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත්,බෑග් 2300 බැගින් නිෂ්පාදනය කිරීම සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 4,500.00
4.2	කාරක ප්‍රග්ධන පිරිවැය (සතියක් සඳහා)	= රු. 35,395.00
	මුළු ආයෝජනය	= **රු. 39,895.00**

නිෂ්පාදනයට අපේක්ෂිත බෑග් ප්‍රමාණයන් (සතියක් සඳහා) (අඟල්)

- පතුල හතරැස් බෑග් (කුඩා) 7.9 × 4.7 × 2.8 - 2300
- පතුල හතරැස් බෑග් (මධ්‍යම) 9.4 × 5.5 × 3.1 - 2300
- පතුල හතරැස් බෑග් (විශාල) 11 × 7.1 × 4.7 - 2300
- පතුල පැතලි කවර (කුඩා) 7.1 × 3.9 × 1.6 - 2300

සතියකට පැය 2ක් පතොරම් කැපීමට හා පැයකට බෑග් 50ක් ඇලවිය හැකි යැයි උපකල්පනය කෙරේ.

4.1 ස්ථාවර ප්‍රාග්ධනය

අංකය	විස්තරය	වටිනාකම
01	කඩදාසි කැපුම් තල (Paper Cutter)	500.00
02	කතුර	800.00
03	අඩි රැල් හා මේසය	3,200.00
	එකතුව	4,500.00

(කැපුම් යන්ත්‍ර භාවිත කරමින් ද නිෂ්පාදන කටයුතු කළ හැකි නමුත් අවම ස්ථාවර ප්‍රාග්ධනයක් භාවිත කිරීමේ අපේක්ෂාවෙන් ස්ථාවර ප්‍රාග්ධනය ඇස්තමේන්තුගත කර ඇත.)

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

අංකය	විස්තරය	සතියක වියදම (රු.)	මාසික වියදම (රු.)
01	අමු ද්‍රව්‍ය සඳහා		
	කඩදාසි 637× රු. 45.00	28,665.00	114,660.00
	බයින්ඩර් ගම් 1 kg× රු. 480.00	480.00	1,920.00
02	ශ්‍රම වියදම	6,000.00	24,000.00
03	වෙනත් වියදම්	250.00	1,000.00
	එකතුව	35,395.00	141,580.00

සතියකට දින 6ක් බැගින් මසකට සති 04ක් නිෂ්පාදනයේ නියැලේ යැයි උපකල්පනය කෙරේ.

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය දිනකට පැය 8 බැගින් වූ දින 6ක් සතියකට හා මසකට සති 04 ක් නිෂ්පාදන කටයුතු සිදු කරන බව අපේක්ෂා කෙරේ. සතියකට එක් වර්ගයකින් බෑග් 2300 ක නිෂ්පාදනයක් අපේක්ෂා කර ඇත. කඩදාසි බෑග් සඳහා 2021.08.18 දිනට පැවති මිල ගණන් යොදාගෙන ඇත.

මාසික මුළු විකුණුම්

පතුල හතරැස් බෑග් (කුඩා)	රු. 4.00 × 2300 × 4	= රු. 36,800.00
පතුල හතරැස් බෑග් (මධ්‍යම)	රු. 5.00 × 2300 × 4	= රු. 46,000.00
පතුල හතරැස් බෑග් (විශාල)	රු. 6.50 × 2300 × 4	= රු. 59,800.00
පතුල පැතලි කවර (කුඩා)	රු .2.75 × 2300 × 4	= රු. 25,300.00
මාසික මුළු විකුණුම් ආදායම		= රු. 167,900.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

මාසික සෘජු පිරිවැය = රු. 35,395.00 × 4 = රු. 141,580.00
(සතියක කාරක ප්‍රාග්ධනය × සති 4)

මාසික වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා වැය වන ප්‍රවාහන, ක්ෂය, ජලය, විදුලිය, අලෙවි හා දුරකතන වියදම් සඳහා රු. 3,000.00 ක් වැය වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 167,900.00 - (රු. 141,580.00 + රු. 3,000.00)
= රු. 167,900.00 - රු. 144,580.00
= රු. 23,320.00

කඩදාසි බෑග් නිෂ්පාදනය අයිතිකරුම සිදු කරයි නම් මාසික වැටුප ලෙස රු. 24,000.00 ක් වෙන් කර ගත හැකි අතර ශුද්ධ ලාභය ලෙස රු. .23,320.00 ක් උපයා ගත හැකිය.

.වෙනත්

- සමස්තයක් ලෙස පොදුවේ සියලු ව්‍යවසායකයන් හට යෝග්‍ය වන පරිදි දත්ත සටහන් කර ඇති අතර තොග වශයෙන් මිලදී ගැනීම් හා ඉවතලන කඩදාසි භාවිතයෙන් නිෂ්පාදන පිරිවැය තව දුරටත් අවම කර ගත හැක.
- වෙළඳපොළ පවතින ඉල්ලුම අනුව විවිධ ප්‍රමාණයන්ගේ කඩදාසි බෑග් නිෂ්පාදනය සිදු කළ හැකි අතර ගණනය පහසු වීම සඳහා මෙහිදී ප්‍රමාණයන් කිහිපයක් පමණක් යොදාගෙන ඇත.
- කඩදාසියකින් කැපිය හැකි උපරිම බෑග් ප්‍රමාණය අපේක්ෂිත ආසන්න සංඛ්‍යාවක් ලෙස යොදාගෙන ඇත.
- කඩදාසියකින් ප්‍රධාන නිෂ්පාදන සඳහා ලබාගෙන ඉතිරි වන කොටස් මගින් වීකක 1000 ක් රු. 300.00 ක් බැගින් වන ෆාමසි කවර සෑදීමෙන් අමතර ආදායමක් ළඟා කර ගත හැකි ය.
- සියලුම මිල ගණන් 2021.08.18 දිනට පැවති තත්ත්වයන් යටතේ ලබාගෙන ඇත .

බ්ලොක් ගල්, බිම් ඇතුරුම් ගල් නිෂ්පාදනය හා අලෙවිය

1. හැඳින්වීම

ගෘහ ආශ්‍රිත කර්මාන්තයක් වශයෙන් ආරම්භ කළ හැකි ඵලදායී ව්‍යාපාරයක් ලෙස ඉන්ටර්ලොක් කැට හා බ්ලොක් ගල් නිෂ්පාදනය කර අලෙවිකිරීම දැක්විය හැකිය. මධ්‍යම මට්ටමේ ආදායම් ලබන පිරිස් තුලද මේ වන විට ගෘහ අලංකරණය හා නිවාස ඉඳිකිරීම පිළිබඳ ඇල්ම වැඩිවීම සහ වර්තමානයේ ජාතික වශයෙන් ඇතිවන සංවර්ධන ව්‍යාපෘති හරහා මෙම නිෂ්පාදනය සඳහා වැඩි ඉල්ලුමක් ජනිත වේ. බ්ලොක් ගල් හා ඉන්ටර්ලොක් කැට නිෂ්පාදනය සඳහා සැලකිය යුතු ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වන අතර ව්‍යාපාර සංවර්ධනය කිරීමේ දී යන්ත්‍ර සූත්‍ර භාවිතය වැදගත් වේ. එමෙන්ම පරිසර බලපත්‍ර ලබා ගැනීම ද අවශ්‍යය.

2. අමුද්‍රව්‍ය

උසස් ප්‍රමිතියෙන් යුතු බිම් ඇතුරුම් ගල් (ඉන්ටර්ලොක් ගල්) 2,500 ක් සහ බ්ලොක් ගල් 2,500 ක් අලෙවි කරන ආයතනයක් සඳහා මාසයකට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණයන් පහත පරිදි වේ.

සිමෙන්ති	කොට්ට 50
ගල්කුඩු මිශ්‍ර චිප් ගල්	කියුබ් 9
වර්ණක	කි.ග්‍රෑ. 12
දැවී තෙල්	ලීටර 25
ජලය	ප්‍රමාණවත් පරිදි

3. වෙළඳපොල

බොහෝ දෙනෙක් ගෘහ අලංකරණයට දැඩි කැමැත්තක් දක්වන නිසාත්, හෝටල් පරිශ්‍ර අලංකරණය සඳහා ඉන්ටර්ලොක් කැට යොදා ගැනීම නිසාත්, දීප ව්‍යාප්ත වශයෙන් දියත් කරන ජාතික මිට්ටමේ සංවර්ධන යෝජනා ක්‍රම නිසාත්, කාන්තාවන්ගේ කාර්ය බහුලත්වය නිසා මිදුල් අතුගෑමේ අපහසුව නිසා එය පිරිසිදුව පවත්වාගෙන යාමේ උපක්‍රමයක් ලෙස ඉන්ටර්ලොක් කැට ඇල්ලීම සහ ඉඳිකිරීම් කටයුතු වලදී මැටි ගඩොල් භාවිතයට වඩා පහසුවෙන් හා ඉක්මණින් බ්ලොක් ගල් භාවිතයෙන් කාර්ය නිමවන නිසාත් මෙම නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. තවද, ඉඳිකිරීම් ක්ෂේත්‍රය යනු සැමදා ඉල්ලුමක් ඇති කරන ක්ෂේත්‍රයකි. වර්තමානයේ මෙන්ම අනාගතයේද නිවාස ඉඳිකිරීම්, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ගෘහාලංකරණය යනාදිය සිදුවේ.

4. ආයෝජනය

දිනකට බිම් ඇතුරුම් ගල් (ඉන්ටර්ලොක් ගල්) 100 ක් සහ බ්ලොක් ගල් 100 ක් යන්ත්‍ර මගින් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 720,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 172,250.00
	මුළු එකතුව	- **රු. 892,250.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

නිෂ්පාදනවල ගුණාත්මක බව සහ කාර්යක්ෂමව නිෂ්පාදන කටයුතු සිදු කිරීම පිළිබඳ අවධානය යොමුකොට අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත. යන්ත්‍ර භාවිත නොකර වුවද ව්‍යාපාරය ආරම්භ කළ හැකිය.

අංක	වර්ගය	වටිනාකම (රු.)
01	බ්ලොක් ගල් යන්ත්‍රය (ගඩොල් 2)	185,000.00
02	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය	150,000.00
03	බිම් ඇතුරුම් ගල් යන්ත්‍රය	250,000.00
04	වැඩ මඩුව	100,000.00
05	ඉන්ටර්ලොක් අච්චු 100	15,000.00
06	බ්ලොක් ගල් ලෑලි 100	20,000.00
	එකතුව	720,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසික)

දිනකට බිම් ඇතුරුම් ගල් (ඉන්ටර්ලොක් ගල්) 100 ක් සහ බ්ලොක් ගල් 100 ක් නිෂ්පාදනය කරන ආකාරයටත්, මසකට දින 25 ක් නිෂ්පාදන කටයුතු සිදුකරන ආකාරයටත් ගණනය කිරීම් සිදු කර ඇත.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	මාසික වියදම (රු.)
01	අමුද්‍රව්‍ය	5,450.00	136,250.00
02	ශ්‍රමය	-	30,000.00
03	වෙනත්	-	6,000.00
	එකතුව	-	172,250.00

5.0 මාසික ශුද්ධ ලාභය

උපකල්පන

මාසයකට දින 25 ක් වැඩ කරන බව.
දැනට පවත්නා මිල ගණන් අනුව ගණනය කිරීම් සිදුකර ඇති බව.
තනි පුද්ගලයෙකු විසින් ව්‍යාපාරයේ සියලු කටයුතු සිදුකරන බව.

මාසික විකුණුම් ආදායම

ඉන්ටර්ලොක් ගල් 2,500 × මිල රු. 40.00	=	රු. 100,000.00
බ්ලොක් ගල් 2,500 × මිල රු. 48.00	=	රු. 120,000.00
මාසික මුළු ආදායම	=	රු. 220,000.00

මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
= රු. 136,250.00 + රු. 30,000.00 + රු. 6,000.00
= රු. 172,250.00

වක්‍ර පිරිවැය

මාසික වක්‍ර පිරිවැය රු. 14,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මුළු පිරිවැය = රු. 172,250.00 + රු.14,000.00 = රු. 186,250.00

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 220,000.00 - රු. 186,250.00
= රු. 33,750.00

යන්ත්‍ර භාවිතයෙන් සිදු කරන බැවින් ව්‍යාපාරිකයාටම පහසුවෙන් මෙම ව්‍යාපාරය සේවකයෙක් නොමැතිව පවත්වාගෙන යා හැකිය.

ඒ අනුව ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 30,000.00 වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 33,750.00 ක් උපයා ගත හැකිය.

රෙදි පටි බෝල නිෂ්පාදනය

1. හැඳින්වීම

රෙදි නූල් (පටි) බෝල කෘෂිකාර්මික උපාංග අතර ඉහළ ඉල්ලුමක් පවතින උපාංගයකි. එළවළු මැසි සැකසීම, වගාවන් සඳහා ආරක්ෂිත වැටවල් ඉදි කිරීම, බෝග ආධාරක සිටුවීම මෙන්ම කුරුඳු පඳුරු බැඳීම සඳහා ද විශේෂයෙන් මෙම රෙදි පටි බෝල භාවිතා කරයි. එසේ වුවද මෙම නිෂ්පාදනය වර්තමානය වන විට අනෙකුත් සියලුම ව්‍යාපාරික ස්ථානවල ද භාවිත කරනු දක්නට ලැබෙයි. භාණ්ඩ අලෙවි කිරීමේදී පාරිභෝගිකයාට පහසුවෙන් රැගෙන යා හැකි පරිදි ඇසුරුම් කර දීමේදී මෙම පටි ගෘහ භාණ්ඩ ඇතුලු උපකරණ අලෙවි සැල් වල පවා අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්ව ඇත. මෙම ව්‍යාපාරය ඉතා අඩු ආයෝජනයක් යටතේ විශේෂ පුහුණුවක් හෝ යන්ත්‍ර සූත්‍ර නොමැතිව පවුලේ ශ්‍රමය යොදාගෙන ගෘහස්ථ මට්ටමින් පහසුවෙන් ආරම්භ කර ලාභ ඉපැයිය හැකි ව්‍යාපාරයකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

මෙම රෙදි පටි බෝල සැකසීම සඳහා අමුද්‍රව්‍ය වශයෙන් ඇඟලුම් කර්මාන්ත ශාලා වලින් ඉවත ලන රෙදි පටි තොග වශයෙන් ලබා ගනී. මෙහිදී පහසුව සඳහා පටි වශයෙන් කැපූ රෙදි තොග මිලදී ගත හැකිය. එසේ පටි කැපූ රෙදි තොග නොමැතිනම් තමන් විසින් පටි වශයෙන් කපා ගැනීම සිදුකළ යුතුය. මෙම රෙදි තොග කිලෝ වශයෙන් ලබාදේ. ශක්තිමත් භාවයෙන් වැඩි රෙදි පටි තොග ලබා ගැනීම මගින් නිෂ්පාදනයේ ගුණාත්මක භාවය වැඩි වේ.

3. වෙළඳපොල

ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නිරත ගොවි මහතුන්ගේ, ගෙවතු වගාවල නිරත පුද්ගලයින්ගේ, ඉදිකිරීම් කටයුතුවල නිරත පුද්ගලයින්ගේ, වෙළෙඳාම් කටයුතු වල නිරත අයගේ මෙන්ම එදිනෙදා ගෘහස්ත කටයුතු සඳහාද මෙම රෙදි පටි නූල් වලට ඉහළ පාරිභෝගික ඉල්ලුමක් දක්නට ලැබේ. කොහු ලණු භාවිතය වෙනුවට ආදේශකයක් ලෙස වර්තමානයේ මෙය වෙළඳපලට හඳුන්වා දී ඇත. ඉදිකිරීම් ද්‍රව්‍ය අලෙවිසැල් (හාඩ්වෙයාර්), කෘෂි නිෂ්පාදන අලෙවි සැල්, සිල්ලර වෙළඳසැල් හරහා මෙම නිෂ්පාදනය ඉහළ අලෙවියක් සිදුකර ගත හැකිය. කෘෂි කාර්මික ප්‍රදේශයන්හි මේවා බහුලව අලෙවි වේ.

4. ආයෝජනය

මාසිකව රෙදි පටි බෝල 2,000 ක් නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	රු. 15,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය (සඳහා)	රු. 191,000.00
මුළු එකතුව	**රු. 206,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්මේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	ලී බඩු (මේස, පුටු රාක්ක)	10,000.00
02	අනෙකුත් උපකරණ (කතුරු, ටිමර්)	5,000.00
	මුළු එකතුව	15,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතිය සඳහා)

මාසික රෙදි නූල් බෝල 2,000 ක් නිෂ්පාදනය දින 25 ක් තුළ දී සිදු කරනු ලැබේ.

අංක	විස්තරය	මාසික වියදම (රු.)
01	අමුද්‍රව්‍ය	133,000.00
02	ශ්‍රම වියදම	20,000.00
03	වෙනත් වියදම්	38,000.00
	එකතුව	191,000.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

මෙම ව්‍යාපාරය මාසයකට දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන අතර මසකට රෙදි නූල් බෝල 2,000 ක් නිෂ්පාදනය කර අලෙවි කරන බවට උපකල්පනය කර ඇත. රෙදි නූල් බෝල නිෂ්පාදන එකකයක විකුණුම් මිල රු.150 ක් වේ. ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = රු. 125.00 × නූල් බෝල 2,000
= රු. 250,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
සෘජු පිරිවැය = රු. 133,000.00 + රු. 20,000.00 + රු. 30,000.00
= රු. 183,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජල, විදුලි, බෙදාහැරීම්, අලෙවි ආදි අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 15,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මුළු පිරිවැය = රු. 183,000.00 + රු. 15,000.00
= රු. 198,000.00

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 250,000.00 - රු. 198,000.00
= රු. 52,000.00

ව්‍යාපාරිකයා විසින් ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 20,000.00 ක ශ්‍රම වැටුපක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 52,000.00 ක් උපයා ගත හැකිය.

උඩරට මුල් ඇඳුම් මැසීමේ ව්‍යාපාරය

1. හැඳින්වීම

ශ්‍රී ලංකාව ප්‍රෞඩ ඉතිහාසයක් තිබෙන ලෝකයේ පිළිගන්නා වූ අනන්‍ය සංස්කෘතියක් ඇති රටකි. අතීතයේ උඩරට ප්‍රදේශයේ කුලවතුන්ට පමණක් සීමා වී තිබුණු සම්ප්‍රදායානුකූල උඩරට මුල් ඇඳුම සැලකෙන්නේ දැඩිමුණ්ඩ දෙවියන්ගේ ඇඳුම හා ආභරණ කට්ටලය ලෙසය. වර්තමානයේ සෑම තරුණයෙකුගේම ජීවිතයේ සුවිශේෂම දිනය වර්ණවත් කිරීමටත්, අභිමානවත් බවක් ආරෝපණය කර ගැනීමටත්, උඩරට ක්‍රමයට මුල් ඇඳුමෙන් සැරසීමට වැඩි කැමැත්තක් දක්වන බව පෙනී යයි. එම නිසා වර්තමානයේ රටේ සෑම ප්‍රදේශයකම මෙම කර්මාන්තය ව්‍යාප්ත වී තිබේ. මෙම ඇඳුම් නිර්මාණය සඳහා ලියවැල්, කොඩි, හේරුණ්ඩ පක්ෂියා, හංස පූට්ටුව, සිංහරූප, ඇත්රූප, මොණරා, ගුරුළා, වැනි සත්ව රූප මෝස්තර යොදාගෙන නිර්මාණය කරනු ලබන කොටස් 14 කින් සමන්විත ප්‍රභූ ඇඳුමකි.

මෙම ඇඳුම කෙනෙකුට තනිව ඇඳිය හැකි ඇඳුමක් ද නොවේ. ඒ සඳහා සුවිශේෂ පුහුණුවලත් කෙනකුගේ සහය ලබාගත යුතුයි. ඇඳුම ඇන්දවීමේ දී මුලින්ම රැලි සහිත කලිසම අන්දවා, පපු පටිය ගැට ගසා, පසුව සුදු රෙද්ද, රතු රෙද්ද සහ කවණියෙන් සරසා තුම්පොට්ටිය ඇන්දවීමෙන් පසු බඳ පටිය හා විල්ලුද ජැකට් එක අන්දවනු ලැබේ. අවසන අදාළ ආභරණ, හිස්වැසුම් සහ සපත්තු පැළඳවීම සිදු කරයි. නිලමේ ඇඳුමෙන් සැරසෙන ඕනෑම පුද්ගලයෙකු තුළ මහත් ආඩම්බරයක්, ගෞරවයක් ඇති වෙන අතර ඔහුට මනා පෞරුෂයක්, කැපී පෙනෙන ස්වභාවයක් ඇතිවීම ද ඉඛේම සිදුවේ.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

නිලමේ හැට්ටය, මුලු හතරේ තොප්පිය, මිරිවැඩි සඟල, බඳ පටිය හා කරපටිය සඳහා අවශ්‍ය අමුදුව්‍ය (ප්‍රධාන නගරවල මෙම අමුද්‍රව්‍ය තොග වශයෙන් අලෙවිකරණ වෙළඳසැල් ඇත)

වෙල්වට් රෙදි, පොප්ලින් රෙදි, අමු රෙදි, පබළු වැල්, පබලු ඇට, විවිධ හැඩයෙන් හා පාටවලින් යුත් ගල් (stone), ස්ට්‍රිප්ස්, සීකුයින්ස්, රැපටා, පන්ච්, රබර්ෂීට්, රෙක්සින්, රබර් අඩි, ගම් (multibond), බකල්, නූල් බෝලයක්.

3. වෙළඳපොල

මුල් ඇඳුම් කුලී පදනමට සේවාව සලසන ස්ථාන ඉතා විශාල ප්‍රමාණයක් තරඟකාරී ලෙස රට පුරාම සේවා සපයමින් පවතී. නමුත් මුල් ඇඳුම් නිර්මාණකරුවන් ඉතා සුළු ප්‍රමාණයක් දැකිය හැකි වේ. ඒ සඳහා මුල් ඇඳුම් නිර්මාණය කිරීමේ ශිල්පීය ඥාණය බොහෝවිට පරම්පරාවෙන් පැවතෙන සුළු පිරිසක් අතර පැවතීම ද හේතුවක් විය හැකි අතර වර්තමානයේ මෙම කර්මාන්තයේ නිරත වන ගම්මාන දැකිය හැකිය. (උදා -මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය, හිඳගල) මුල් ඇඳුම් නිර්මාණය කිරීමේදී භාවිතා කරන අමුද්‍රව්‍ය, මෝස්තර වල නිමාව, ආභරණවල ප්‍රමිතිය, ඇඳුමේ ප්‍රමාණය, අවසන් නිමාව හා ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය අනුව වෙළඳපල මිල ගණන් වල විශාල වෙනස්කම් පවතී. වියදම් කිරීමේ හැකියාව අඩු පාරිභෝගිකයාගේ සිට ඉහල සමාජ තත්ත්වයක් ඇති ධනවත් පාරිභෝගිකයා දක්වා ඉලක්ක වෙළඳපල හඳුනාගනිමින් විවිධ මිල ගණන් වලට මුල් ඇඳුම් කට්ටල වෙළඳපල තුළ දැකිය හැකිය. මුල් ඇඳුම් නිර්මාණයේදී යොදාගනු ලබන විලාසිතා නිතරම වෙනස් වන අතර, ජනගහන වර්ධනයත් සමග ඉහළ ඉල්ලුමක් ඇති ධනාත්මක ව්‍යාපාර ක්ෂේත්‍රයක් ලෙස මෙම කර්මාන්තය හඳුනාගත හැකිය.

4. ආයෝජනය

උඩරට මුල් ඇඳුමක් නිර්මාණය සඳහා දින 10ක් ගතවන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 96,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (දින 10ක් සඳහා)	=	රු. 31,600.00
	මුළු එකතුව	=	**රු.128,100.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	යන්ත්‍ර සූත්‍ර උපකරණ	වටිනාකම (රු.)
01	ජුකී මැෂිමක්	රු. 65,000.00
02	වීදුරු අල්මාරියක් (Show-case)	රු. 8,000.00
03	රෙදි කපන මේසය	රු. 6,000.00
04	ලී පටි රාමුව	රු. 1,500.00
05	සපත්තු අච්චු 5ක් (විවිධ ප්‍රමාණවල)	රු. 4,000.00
06	අනෙකුත් උපකරණ (කතුරු,ටිමර්, අඬුව, මිටිය ඇතුලු අනෙකුත් දෑ)	රු. 12,000.00
	මුළු එකතුව	රු. 96,500.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (දින 10ක් සඳහා)

එක් මුල් ඇඳුමක් නිර්මාණය හා මැසීම සිදුකර අවසන් නිමාව ලබාගැනීම සඳහා දින 10ක් ගත වේ.

අංක	විස්තරය	දින 10ක වියදම (රු.)
01	අමුද්‍රව්‍ය	රු. 21,100.00
02	ශ්‍රමය සඳහා	රු. 10,000.00
03	වෙනත් වියදම්	රු. 500.00
	මුළු එකතුව	රු. 31,600.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට මුල් ඇඳුම් කට්ටල 03ක් (නිලමේ හැට්ටය, මුලු හතරේ තොප්පිය, මිරිවැඩි සඟල) නිෂ්පාදනය සිදුකරන බවට උපකල්පනය කර ඇත. එමෙන්ම මෙම මුල් ඇඳුම් කට්ටල චීවා බදු දෙන ආයතන සඳහා අලෙවි කරන ආකාරයට ගණනය කර ඇත.

මුල් ඇඳුම් කට්ටලයක විකුණුම් මිල රු. 45,000.00 කි.

මාසික විකුණුම් ආදායම = මුල් ඇඳුම් කට්ටල 03 × රු. 45,000.00 = රු. 135,000.00
මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්

මුල් ඇඳුමක සෘජු පිරිවැය = රු. 21,100.00 + රු. 10,000 + රු. 500.00
= රු. 31,600.00
මුල් ඇඳුම් කට්ටල 03 ක (මාසික) සෘජු පිරිවැය = රු. 31,600.00 × 03
= රු. 94,800.00

වකු පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ. (අමුද්‍රව්‍ය ප්‍රවාහන, අලෙවිය හා ප්‍රචාරණ ආදී අනෙකුත් වියදම්) එක් මාසයක් සඳහා රු. 10,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 135,000.00 - (රු. 94,800.00 + රු. 10,000.00)
	= රු. 135,000.00 - රු. 104,800.00
	= රු. 30,200.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 30,000.00 වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 30,200.00 ක් උපයා ගත හැකිය.

කාන්තා ඇඳුම් නිෂ්පාදනය

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය 52%ක් ඉක්මවන බැවින් කාන්තා නිමි ඇඳුම් සඳහා විශාල වෙළඳපොලක් නිර්මාණය වී ඇත. වෙළඳපොල අවශ්‍යතාවයෙන් විශාල කොටසක් ආනයනික නිමි ඇඳුම් මගින් ආවරණය වූ අතර වර්තමානයේ පවතින ආනයන සීමා වීමත් සමග දේශීය නිෂ්පාදන සඳහා වෙළඳපොල තුළ විශාල ඉඩකඩක් නිර්මාණය වී ඇත. කාන්තාවගේ ස්ත්‍රී ප්‍රතිරූපය නිර්මාණය කිරීමටත් ඇයගේ ආකර්ෂණීය බව වැඩි කිරීමටත් නිරන්තර වෙනස් වන විලාසිතාවන්ගෙන් නිමවන කාන්තා ඇඳුම් නිෂ්පාදනය ගෘහාශ්‍රිතව ආරම්භ කිරීමට හැකි ලාභදායී ව්‍යාපාර අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

විස්කෝස් රෙදි
ලිනන් රෙදි
බොත්තම්
ඉලාස්ටික්
නූල්
ඕවර්ලොක් නූල්

3. වෙළඳපොල

ආනයනය සීමා වීමත්, සමග දේශීය කාන්තා නිමි ඇඳුම් සඳහා පැවති වෙළඳපොල විශාල ලෙස වර්ධනය වෙමින් පවතින බව දක්නට ලැබේ. සමාජ ආර්ථික මට්ටම් අනුව නිමි ඇඳුම් නිෂ්පානයේදී ගුණාත්වය, මෝස්තරය, මිල ගණන්, වෙළඳපොල ප්‍රවණතාවයන් ආදිය පිළිබඳ සැලකිල්ලට ගනු ලැබේ. ඒ අනුව විවිධ මිල ගණන්, විවිධ මෝස්තරයන් යටතේ නිරන්තර වෙනස්වන වෙළඳපොල තත්ත්වයන් යටතේ සිදු කරන ගුණාත්මක නිෂ්පාදන සඳහා හැමවිටම ඉහළ ඉල්ලුමක් පවතී. කාන්තා නිමි ඇඳුම් අතර කාන්තා රාත්‍රී ඇඳුම්, සාමාන්‍ය කාන්තා කලිසම් හා ලිනන් ගවුම් සඳහා කැපී පෙනෙන වෙළඳපොලක් දක්නට ලැබේ.

4. ආයෝජනය

මසකට කාන්තා ඇඳුම් 250ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුළු මුදල.

(කලිසම් 100, රාත්‍රී ඇඳුම් 100, ලිනන් ගවුම් 50)

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධනය	- රු. 117,000.00
4.2	කාරක ප්‍රාග්ධනය (මසකට)	- රු. 153,500.00
	මුළු වියදම	- **රු. 270,500.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
1	ජුකී මැෂින් 1	50,000.00
2	ඕවර්ලොක් මැෂින් 1	60,000.00
3	බටන් හෝල්ඩර් (බොත්තම් සිදුරු විදිනය) 1	4,500.00
4	කතුරු, ඉදිකටු, හැන්ගර්ස් සමඟ අනෙකුත් උපකරණ	2,500.00
	එකතුව	117,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

සතියකට දින 06ක් නිෂ්පාදනයේ යෙදෙන කාන්තා නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරයේ මසකට දින 25 ක් සේවය කරයි.

අංක	විස්තරය	මාසික වියදම (රු.)
1	අමුද්‍රව්‍ය වියදම	122,500.00
2	ශ්‍රම වියදම	25,000.00
3	වෙනත් වියදම් (ගෙන ඒමේ කුලී, ලේබල්, සහ පොලිතින් පැකට්)	6,000.00
	එකතුව	153,500.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට කෑලි 250ක් නිෂ්පාදනය කරන අතර දින 25ක් ව්‍යාපාර කටයුතු සිදු කරන බවට උපකල්පනය කර ඇත.

ලිනන් ගවුමක විකුණුම් මිල රු. 2,100.00ක් ද, දිග කලිසමක මිල රු. 610.00ක් ද, කාන්තා රාත්‍රී ගවුමක මිල රු. 400.00ක් ද වේ. මේ අනුව,

මසකට මුළු විකුණුම් ආදායම

	මිල	ප්‍රමාණය	
ලිනන් ගවුමක විකුණුම් මිල	රු. 2,100.00 ×	50	= රු. 105,000.00
දිග කලිසමක විකුණුම් මිල	රු. 610.00 ×	100	= රු. 61,000.00
රාත්‍රී ගවුමක විකුණුම් මිල	රු. 400.00 ×	100	= රු. 40,000.00
මසක මුළු විකුණුම් ආදායම			= රු. 206,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම්

මාසික සෘජු පිරිවැය = රු. 122,500.00 + රු. 25,000.00 + රු. 6,000.00 = රු. 153,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යෑම සඳහා දරණ වියදම් වේ. (ජල, විදුලි, ප්‍රවාහන සහ ක්ෂය, අලෙවි ප්‍රවර්ධන) ආදී අනෙකුත් වියදම් වේ. එය මාසයක් සඳහා රු. 25,000.00 ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 206,000.00 - (රු. 153,500.00 + රු. 25,000.00)
= රු. 27,500.00

ව්‍යාපාරිකයා විසින් ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට වැටුප ලෙස රු. 25,000.00 ක් හා ශුද්ධ ලාභය ලෙස රු. 27,500.00ක මුදලක් උපයාගත හැකිය.

පන් ආශ්‍රිත නිෂ්පාදන

1. හැඳින්වීම

පරිසර හිතකාමී ඉතා අලංකාරවත් ලෙස නිර්මාණය කරගත හැකි පන් ආශ්‍රිත නිෂ්පාදන අතීතයේ පටන් පැවතගෙන එන දේශීය කර්මාන්තයකි. අතීතයේ කාන්තාව පන් වලින් වියන ලද මාගල්, කළාල, වට්ටි හා පෙට්ටි අලෙවි කරමින් තම පවුලට ආර්ථිකමය වශයෙන් සවියක් විය. එම සාම්ප්‍රදායික නිෂ්පාදන තවදුරටත් නිර්මාණශීලීව නිෂ්පාදනය කරමින් ඉතා අලංකාර බිත්ති සැරසිලි, පාපිසි, අත් බෑග්, විසිතුරු භාණ්ඩ ආදිය වර්තමාන වෙළඳපොලට පැමිණ ඇත.

මෑත ඉතිහාසයේ පන් නිෂ්පාදන සඳහා ආදේශක ලෙස ප්ලාස්ටික්, පොලිතීන් හා විවිධ රෙදි වර්ග යොදා ගනිමින් කළ නිෂ්පාදන බිහිවූවත් දේශීයව නිපදවන පන් නිෂ්පාදන සඳහා තිබූ ඉල්ලුම නැවතත් වැඩිවෙමින් පවතී. එසේම විවිධ පන් වර්ග දේශීයව සොයාගැනීමට හැකියාව ද පවතී. ඒ අනුව අමුද්‍රව්‍ය පිළිබඳ ගැටළුවක් නොමැති බව කිව හැකිය. මෙවැනි තත්ත්වයක් හමුවේ ඉතා සුළු ප්‍රාග්ධනයක් යොදවා ව්‍යවසායකයෙකුට ඇරඹිය හැකි ව්‍යාපාර අවස්ථාවක් ලෙස දේශීය පන් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය හඳුනාගත හැකිය. එමනිසා මෙම කර්මාන්තය අලුතින් ආරම්භ කිරීමට අදහස් කරනු ලබන ව්‍යවසායකයන්ට ඉතා ඉහළ ආදායමක් හා පහසුවෙන් කළ හැකි කර්මාන්තයක් බව කිව හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

පන් / සායම් / රෙදි / සම් කැබලි

3. වෙළඳපොල

අලංකාර හා සැහැල්ලු බවින් යුත් දිගුකල් පැවැත්මක් පවතින දේශීය පන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා මේ වන විට වෙළඳපොල ඉල්ලුම වැඩිවෙමින් පවතී. පන් නිෂ්පාදන වල ඇති සිත් ඇදගන්නා සුළු බව නිසා ම අද වන විට සංචාරක ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විශේෂ අවධානය යොමු වී ඇත. සංචාරක හෝටල්, නිවාඩු නිකේතන වලට ලාංකික අනන්‍යතාවය විදහාපෑම සඳහා බොහෝ පන් සැරසිලි යොදාගෙන ඇති අතර, මේ වන විට දෙස් විදෙස් සංචාරකයින්ගේ විශේෂ අවධානය ඒ සඳහා යොමුව ඇත. කාර්යබහුල ජීවන රටාව තුල පරිසර හිතකාමී හා සෞඛ්‍යාරක්ෂිතබව කෙරෙහි විශේෂ අවධානය යොමු කරන පිරිසක් ජීවත්වන අද සමාජය තුළ පන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා පුළුල් වූ වෙළඳපළක් බිහි වන බව මේ වන විට අපට අවබෝධ වන සුවිශේෂී කාරණයකි. එමනිසා මෙම කර්මාන්තයේ නියැළෙන්නන්ට වෙළඳපොලක් දේශීයව සහ විදේශීය වශයෙන් පවතින බව කිව හැකිය.

4. ආයෝජනය

මසකට පන් බෑග් 15 ක්, පන් පෙට්ටි 15 ක්, පන් තොප්පි 15 ක්, පන් වට්ටි 15 ක් සහා පන් වට්ටි ආන 30 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල,

4.1	ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 5,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	= රු. 45,375.00
	මුළු එකතුව	= **රු. 50,875.00**

4.1 ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	උපකරණ	වටිනාකම (රු.)
01	කතුරු	1,500.00
02	ලොකු මුට්ටිය	3,000.00
03.	තැළුම් කොටය	500.00
04.	බෑග් අච්චු	500.00
	මුළු එකතුව	5,500.00

4.2 කාරක ප්‍රාග්ධනය පිරිවැය (මාසයක් සඳහා)

මසකට පන් බෑග් 15 ක්, පන් පෙට්ටි 15 ක්, පන් තොප්පි 20 ක්, පන් වට්ටි 15 ක් සහ පන් වට්ටි ආන 20 ක් නිෂ්පාදනය කරනු ලබයි.

අංකය	විස්තරය	මාසික වියදම (රු.)
01	අමුද්‍රව්‍ය සඳහා	18,100.00
02	ශ්‍රමය සඳහා	18,750.00
03.	වෙනත් වියදම්	3,500.00
	මුළු එකතුව	40,350.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මාසයකට දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන බවට උපකල්පනය කරඇත. පන් බෑගයක් රු.600 බැගින්ද, පන් පෙට්ටියක් රු.1000 බැගින් ද, පන් තොප්පියක් රු.500 බැගින්ද, පන් වට්ටියක් රු.500 බැගින්ද සහ පන් වට්ටි ආනක් රු. 1500 බැගින් ද අලෙවි කරනු ලබයි.

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = (සෘජු ද්‍රව්‍ය + සෘජු ශ්‍රමය + සෘජු වෙනත්)

මාසික සෘජු පිරිවැය = රු. 18,100.00 + රු. 18,750.00 + රු. 3,500.00
= රු. 40,350.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා දරන වියදම් ය. (ක්ෂය, ප්‍රවාහන, ලිපිද්‍රව්‍ය, දුරකතන, අලෙවි සහ වෙනත්) වය මාසයක් සඳහා රු. 9,500.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 40,350.00 + රු. 8500.00
= රු. 48,850.00

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 71,500.00 - රු. 48,850.00
= රු. 22,650.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් මාසික ශ්‍රම වැටුප ලෙස රු. 18,750.00 ක් හා ශුද්ධ ලාභය ලෙස රු. 22,650.00 ක් ද උපයාගත හැකිය.

හෑන්ඩ්ලූම් බෑග් නිෂ්පාදනය

1. හැඳින්වීම

අතීතයේ සිට පැවත එන දේශීය කර්මාන්තයක් ලෙස අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයෙහි විවිධාංගීකරණයක් ඇති කරමින් හෑන්ඩ්ලූම් බෑග් නිෂ්පාදනය වර්තමානයේ පාරිභෝගිකයන් අතර ප්‍රචලිතව පවතී. වර්තමාන රජයේ ප්‍රතිපත්තීන්වලට අනුගාමීව දේශීය කර්මාන්ත අතර පරිසර හිතකාමී බෑග් නිෂ්පාදනයක් ලෙස ඉතා හොඳ ඉල්ලුමක් පවතින ව්‍යාපාර අවස්ථාවක් ලෙස වර්තමානයේ හෑන්ඩ්ලූම් බෑග් නිෂ්පාදනය දැක්විය හැකිය. මෙම කර්මාන්තයේ තවත් විශේෂාංගයක් නම් ගැණුම්කරුවන්ගේ පුද්ගලික රුචි අරුචිකම් හා අවශ්‍යතාවන්ට සරිලන සේ විවිධ ප්‍රමාණයන්ගෙන් සහ විවිධ මෝස්තරවලින් මෙන්ම විවිධ විලාසිතාවන්ට අනුකූලව සැපයීමට හැකි නම්‍යශීලි කර්මාන්තයක් වීමයි. හරිත සංකල්පය රට තුළ ප්‍රචලිත වීමත් සමඟ නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ පරිසර හිතකාමී ද්‍රව්‍ය යොදාගෙන කරන නිෂ්පාදන සඳහා පාරිභෝගිකයා නැඹුරුවීම හේතුවෙන් බෑග් කර්මාන්ත ක්ෂේත්‍රය තුළද හෑන්ඩ්ලූම් බෑග් සඳහා ඉතා හොඳ වෙළඳපොලක් වර්තමානය වන විට සකස් වී ඇත.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

හෑන්ඩ්ලූම් රෙදි, ඊවා ෂීට් (Eva Sheet), ලයිනින් සඳහා ටැෆටා (taffeta) රෙදි, බකල්ස්, ලී හැන්ඩල් , ෂිපර්, ෂිපර් හෙඩ්, නූල්.

3. වෙළඳපොල

හෑන්ඩ්ලූම් බෑග් නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොල තුළ ඉතා හොඳ ඉල්ලුමක් දැකිය හැකිය. දේශීය වෙළඳපොළ ගත්විට කාන්තාවන්, පාසල් ළමුන් මෙන්ම වැඩිහිටියන් සඳහාද විවිධ අවශ්‍යතා වෙනුවෙන් සකස් කරන ලද මෙන්ම විවිධ ප්‍රමාණයන්ගේ සහ විවිධ මෝස්තරයන්ගෙන් සමන්විත බෑග් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. වෙළෙඳපොළ සඳහා මෙහි ඇති සුවිශේෂීතාවය වන්නේ අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සපයා ගත හැකි වීම, පරිසර හිතකාමීවීම සහ නව විලාසිතා අනුව නිෂ්පාදන පැවතීමයි.

4. ආයෝජනය

දිනකට බෑග් වර්ග 3කින් බෑග් 20 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුළු මුදල

(කාන්තා අත්බෑග් 05, සයිඩ් බෑග් (Side Class Bag) 05, ලන්ච් බෑග් (කෑම බෑග්) 10)

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 167,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	- රු. 38,000.00
	මුළු එකතුව	- **රු. 205,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	යන්තසූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
1	මහන මැෂිම (ජුකී)	65,000.00
2	මහන මැෂිම (ඕවර් ලොක්)	70,000.00
3	කැපීමේ මැෂිම (cutting machine)	30,000.00
4	කතුරු ටේප් සහ අනෙකුත් උපකරණ	2,000.00
	එකතුව	167,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට බෑග් 20 නිෂ්පාදනය කරන අතර සතියට දින 5ක් බෑග් නිෂ්පාදනය කරනු ලැබේ.

විස්තරය	දිනක වියදම	සතියක වියදම
අමුද්‍රව්‍ය සඳහා වියදම	6,000.00	30,000.00
ශ්‍රම වියදම	1,000.00	5,000.00
වෙනත් වියදම්	600.00	3,000.00
මුළු වියදම	7,600.00	38,000.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට දින 20 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන අතර දිනක දී විවිධ ප්‍රමාණයන් ගෙන් බෑග් 20 ක් නිෂ්පාදනය කරන බවට උපකල්පනය කර ඇත.

කාන්තා අත් බෑගයක විකුණුම් මිල = රු. 900.00
සයිඩ් ක්ලාස් බෑගයක විකුණුම් මිල = රු. 650.00
කෑම බෑග් (Lunch බෑග්) විකුණුම් මිල = රු. 350.00

මේ අනුව කාන්තා අත් බෑග් 100 ක් සයිඩ් ක්ලාස් බෑග් 100 ක් සහ කෑම බෑග් (Lunch බෑග්) 200 ක් මාසිකව නිෂ්පාදනය කරනු ලබයි.

මාසික විකුණුම් ආදායම

කාන්තා අත් බෑග්	100 x රු. 900.00	= රු. 90,000.00
සයිඩ් ක්ලාස් බෑග්	100 x රු. 650.00	= රු. 65,000.00
කෑම බෑග් (Lunch බෑග්)	200 x රු. 350.00	= රු. 70,000.00
මාසික මුළු ආදායම		= රු. 225,000.00

මාසික මුළු පිරිවැය

දිනක සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය + සෘජු වෙනත් වියදම්
= රු. 5500.00 + රු. 1000.00 + රු. 300.00
= රු. 7100.00
= රු.7100.00 x දින 20
= රු. 152,0000

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. (විදුලිය, ප්‍රවාහන, අළෙවි ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 30,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = **මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය**
= රු. 225,000.00 - (රු. 152,000.00 + රු. 30,000.00)
= රු. 43,000.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 43,000.00 ක ශුද්ධ ලාභයක් සහ ඔහුගේ ශ්‍රමය වෙනුවෙන් රු. 20,000.00 ක වැටුපක් උපයාගත හැකිය.

පූජා භාණ්ඩ නිෂ්පාදනය

1. හැඳින්වීම

පූජා භාණ්ඩ යන්න සෑම බෞද්ධාගමිකයෙකුගේම වන්දනීයත්වයට පාත්‍ර වන නොනැසී පවතින ඉල්ලුමක් ඇති නිෂ්පාදනයකි. විහාරස්ථානවල විවිධ පූජා උපහාර උත්සව වලදීත්, නිවෙස් තුළ දානමාන කටයුතු වලදීත් පූජා භාණ්ඩ බහුල ලෙස භාවිතා කරයි. අදාළ තාක්ෂණය ලබා ගැනීමෙන් අනතුරුව අඩු ප්‍රාග්ධන පිරිවැයකින් ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථාවක් ලෙස පූජා භාණ්ඩ නිෂ්පාදනය දැක්විය හැකිය. පූජා භාණ්ඩ නිෂ්පාදනය විවිධාකාර අංගයන්ගෙන් සමන්විත වේ. අටපිරිකර, සිවුරු, අඳනකඩ, මුතුකුඩ, නෙලුම් මල්, බෝගස්, පාවඩ, උඩුවියන්, බුද්ධ ප්‍රතිමා, බෞද්ධ කොඩි යනාදී ලෙස විවිධ වූ පූජා භාණ්ඩ ඇත. මේවා අතරින් එක් වර්ගයක් හෝ වර්ග කිහිපයක් වශයෙන් ගෙන ව්‍යාපාරයක් ලෙස ආරම්භ කල හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

කුඩ,ගල් වර්ග,පටි, රෙදි, සෙටින්, වෙල්වට්, ගම්, මුතු පබළු, ස්පොන්ච්, කාඩ්බෝඩ්, සෙලෝපේන් පේපර්, ඉටිකොළ, සෙලෝටේප්, නූල් වර්ග

3. වෙළඳපොල

පුජා භාණ්ඩ නිෂ්පාදනය අඛණ්ඩ පාරිභෝගික ඉල්ලුමක් පවතින ව්‍යාපාර අවස්ථාවකි. නිවෙස්වල මෙන්ම බෞද්ධ විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා විවිධ වූ පූජා භාණ්ඩ භාවිතයට ගනී. ඉහළ ප්‍රමිතිය මෙන්ම නිර්මාණශීලි හැකියාව සහ කලාත්මකභාවය අනුව ව්‍යාපාරයේ සාර්ථකත්වය තීරණය වන අතර, පාරිභෝගික ආකර්ෂණය දිනා ගැනීමට හැකියාවක් ලැබේ. නිෂ්පාදකයාට ඍජුවම හෝ අතරමැදියෙකු ලෙස පූජා භාණ්ඩ අලෙවි කරන ව්‍යාපාරයකට සම්බන්ධ වී හෝ අලෙවි කටයුතු සිදුකර ගත හැකිය. එමෙන්ම මෑත කාලීනව අන්තර්ජාලය හරහා පූජා භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රචාරණයක් ලබාදී කුරියර් සේවාව මගින් අලෙවි කටයුතු සිදුකල හැකිය.

4. ආයෝජනය

මසකට දින 24ක් පූජා භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළයුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 57,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	-	රු. 62,000.00
	මුළු එකතුව	=	**රු. 119,500.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර, ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමෙන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	මහන මැෂිම	20,000.00
02	කටර් මැෂිම	7,500.00
03	සීලර්	5,000.00
04	මේසය	15,000.00
05	අනෙකුත් උපකරණ	10,000.00
	එකතුව	57,500.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

සතියකට දින 06 බැගින් මාසයකට දින 24 ක් නිෂ්පාදන කටයුතු සිදුකරන ආකාරයට ගණනය කිරීම් සිදුකර ඇති අතර, මාසික නිෂ්පාදන හා ප්‍රමාණයන් පහත පරිදි වේ.

මුතු කුඩ 05
ලොකු නෙළුම් මල් 05
පොඩි නෙළුම් මල් 05
අටපිරිකර 04
බෝගස් 05
අඳන (චැලෙන්ජර්/තායි) 02
උඩු වියන් 01
පාවඩ (වෙල්වට් / සෙටින්) 02

අංක	විස්තරය	සතියක වියදම (රු.)	මාසික වියදම (රු.)
01	කුඩ, රෙදි, මුත, පබළු, ඇතුළු අමුද්‍රව්‍ය	6,000.00	24,000.00
02	ඇසුරුම්	500.00	2,000.00
03	ශ්‍රම වියදම	6,000.00	24,000.00
04	වෙනත් වියදම්	3,000.00	12,000.00
	එකතුව	15,500.00	62,000.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

1. අමුද්‍රව්‍ය මිල ස්ථාවරව පවතින බව.
2. පරිභෝගික ඉල්ලුම අඛණ්ඩව පවතින බව.

මාසික විකුණුම් ආදායම

මුතු කුඩ 05 × රු. 6,500.00	= රු. 32,500.00
ලොකු නෙළුම් මල් 05 × රු. 3,000.00	= රු. 15,000,00
පොඩි නෙළුම් මල් 05 × රු. 2250.00	= රු. 11,250.00
අටපිරිකර 04 × රු. 4,950.00	= රු. 19,800.00
බෝගස් 05 × රු. 650.00	= රු. 3,250.00
අඳන (චැලෙන්ජර්) 02 × රු. 650.00	= රු. 1,300.00
අඳන (තායි) 02 × රු. 1,250.00	= රු. 2,500.00
උඩු වියන් 01 × රු. 5,500.00	= රු. 5,500.00
පාවඩ (වෙල්වට්) 01 × රු. 5,200.00	= රු. 5,200.00
පාවඩ (සෙටින්) 01 × රු.4,720.00	= රු. 4,720.00
එකතුව	= රු. 101,020.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම

මාසික සෘජු පිරිවැය = රු. 6,500.00 + රු. 6,000.00 + රු. 3,000.00
= රු. 15,500.00 × සති 04
= රු. 62,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජලය , විදුලිය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 15,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 101,020.00 - (රු. 62,000.00 + රු. 15,000.00)
= රු. 24,020.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 24,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 24,020.00 ක් උපයාගත හැකිය.

පොල් කටු අඟුරු කර්මාන්තය

01. හැඳින්වීම.

පොල්කටු ආශ්‍රිත නිෂ්පාදනයක් ලෙස, පොල්කටු අඟුරු කාර්මාන්තය ශ්‍රී ලංකාවේ කුරුණෑගල, පුත්තලම හා ගම්පහ යන දිස්ත්‍රික්කවල බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇත. දේශීය වශයෙන් නිෂ්පාදනය වන පොල්කටු අඟුරු සැපයුම්කරුවන් හරහා වර්තමානය වන විට රටවල් සියයකට අධික ප්‍රමාණයකට වාර්ෂිකව අපනයනය කෙරේ. තවද පොල්කටු යොදා ගනිමින් පොල්කටු අඟුරු හා බැඳුණු සක්‍රීය කාබන් නිෂ්පාදනය කරන අතර, මේ සඳහා ගෝලීය වශයෙන් ඇත්තේ සැපයුම අභිබවා යන ඉල්ලුමකි. මෙතෙක් පාරිසරික වශයෙන් පරිසර සංරක්ෂණයට බලපෑමක් කරන පොල්කටු අඟුරු කර්මාන්තය හරිත සංකල්පය මුලික කරගත් ප්‍රධාන කර්මාන්තයක් බවට පත්වී ඇත.පොල් වගාව ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ පොල්කටු අඟුරු කර්මාන්තය ස්වයං රැකියාවක් ලෙස හඳුන්වා දිය හැකිය. සැලකිය යුතු මට්ටමේ අඩු අමුද්‍රව්‍ය ප්‍රමාණයකින් හා අඩු ප්‍රාග්ධනයකින් කුඩා පරිමාණ පොල්කටු අඟුරු ව්‍යාපාරයක් ආරම්භ කළ හැකිය. ප්‍රාදේශීය වශයෙන් පොල් වගාව පැතිරී ඇති වපසරිය තුළ පොල්කටු අඟුරු කර්මාන්තය ප්‍රදේශයේ රැකියා වියුක්ත පිරිස් වෙත ලබාගත හැකි ආර්ථිකමය වටිනාකමකි. පොල්කටු අඟුරු නිෂ්පාදනයට යොමු වීමේදී න්‍යායාත්මක දැනුමට වැඩි ප්‍රායෝගික භාවිතයන් ඇති නිසා කුමන තරාතිරමේ පුද්ගලයෙකුට වුවද කර්මාන්තයට ප්‍රවේශවීමේ හැකියාවක් පැවතීම සුවිශේෂී ලක්ෂණයකි.

මේ සඳහා යොමුවීමේදී පාරිසරික හා සමාජ සාධක කිහිපයකට අවධානය යොමු කළ යුතු අතර, ප්‍රධාන වශයෙන් පොල් කටු පිළිස්සීමේදී ඇතිවන දුම අවට සාමාන්‍ය ජන ජීවිතයට බාධවක් නොවිය යුතුය. එම නිසා මේ සඳහා භූමිය තෝරා ගැනීමේදී නිවාසවලට තරමක් ඈතින් පිහිටි භූමියක් තෝරා ගැනීම කළයුතු අතර කටු පිළිස්සීම රාත්‍රී කාලයේදී සිදු කිරීම යෝග්‍ය වේ.

02. වෙළඳපොල

නූතන ගෝලීය හරිත විප්ලවයත් සමඟ පරිසර හිතකාමී අයුරින් පොල්කටු අඟුරු නිෂ්පාදනය, වෙළඳපල තුළ ප්‍රමුඛ ස්ථානයක් ගනී. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පොල්කටු අඟුරු සඳහා දේශීය මෙන්ම විදේශීයව පුළුල් වෙළඳපලක් පවතී. ව්‍යවසායකත්වය නංවාලීම සඳහා ආර්ථික වර්ධනය අත්කර ගැනීමේ අරමුණින් ඉදිරිපත් කල "නීල හරිත" අයවැය මඟින් පොල්කටු අඟුරු කර්මාන්තයට ගෝලීය වෙළඳපල ජය ගැනීමට ඉහළ දායකත්වයක් ලබා දී ඇත.

පොල්කටු අඟුරු නිෂ්පාදනය කර සක්‍රීය කාබන් ලෙස යුරෝපීය වෙළඳපලට අපනයනය කිරීමේ ක්‍රමවේදයක් වර්තමාන පොල්කටු අඟුරු වෙළඳපල තුළ ප්‍රචලිත වී ඇත. වර්තමානයේ පොල්කටු අඟුරු වෙළඳපල සඳහා රාජ්‍ය අනුග්‍රහය පුළුල්ව ලැබී ඇත. ඒ අතරින් අපනයන සංවර්ධන මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය ප්‍රමුඛ වගකීමක් ඉටු කරයි.

03. ආයෝජනය

වරකදී කිලෝ ග්‍රෑම් 500 බැගින් මසකට 12 වරක් අඟුරු නිෂ්පාදනය කිරීමට මාසයක් සඳහා පොල් කටු කිලෝ ග්‍රෑම් 6,000ක් අවශ්‍ය වේ. ඒ සඳහා පහත වියදම් දැරිය යුතුය. වරකට පොල් කටු කිලෝ ග්‍රෑම් 500 ක් පිළිස්සීම සඳහා කවයේ විෂ්කම්භය අඩි 4ක් හා ගැඹුර අඩි 4ක් පමණ වන වලක් අවශ්‍ය වේ.

ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 56,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය	- රු. 127,700.00
මුළු එකතුව	- **රු. 183,700.00**

ඒ අනුව, රු. 183,700.00ක මූලික ආයෝජනයකින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ හැකිය.

3.1 ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

පොල් කටු අඟුරු නිෂ්පාදනය සඳහා අවම වශයෙන් පහත මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය දැරිය යුතුය.

අංකය	විස්තරය	වටිනාකම (රුපියල්)
1	කටු පිළිස්සුම් වල සැකසීම සඳහා	50,000.00
2	උපකරණ (තාච්චි 2 හා සවල් 2)	6,000.00
	මුළු ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	56,000.00

3.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

පොල් කටු කිලෝ ග්‍රෑම් 6,000ක් සඳහා මාසයක් තුළ දැරිය යුතු මුළු කාරක ප්‍රාග්ධන වියදම ගණනය කර ඇත.

අංකය	විස්තරය	වටිනාකම (රුපියල්)
1	පොල් කටු මිලට ගැනීම සඳහා (6,000 × රු.13.00)	78,000.00
2	ගෙන ඒමේ කූලි	7,000.00
3	ඉන්ධන සඳහා (භූමිතෙල් බෝතල් 2)	200.00
4	ශ්‍රම වැටුප	25,000.00
5	සේවක වේතන	12,000.00
6	ගෙන යාමේ කූලි	3,000.00
7	ඇසුරුම් වියදම් (15.00 × 96)	1,500.00
8	වෙනත් වියදම්	1,000,00
	මුළු කාරක ප්‍රාග්ධන පිරිවැය	127,700.00

3.3 ශුද්ධ ලාභය ගණනය කිරීම

පොල් කටු කිලෝ ග්‍රෑම් 3.4 කින් අඟුරු කිලෝ ග්‍රෑම් 1 ක් ලබා ගත හැකි යැයි උපකල්පනය කරන ලදී.

මුළු විකුණුම් ආදායම (කිලෝ ග්‍රෑම් 1,764 × රු. 85.00) - රු. 149,940.00

මාසික සෘජු වියදම = සෘජු ද්‍රව්‍ය + සෘජු ශ්‍රමය + සෘජු වෙනත් වියදම්
= රු. 78,000.00 + රු. 37,000.00 + රු. 12,700.00
= රු. 127,700.00

මාසික වක්‍ර වියදම = ආයතනය පවත්වාගෙන යාම සඳහා දරණ අනෙකුත් සියළු වියදම් වක්‍ර වියදම් වේ. එය රු. 5,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික මුළු වියදම = මාසික සෘජු වියදම + මාසික වක්‍ර වියදම
= රු. 127,700.00 + රු. 5,000.00
= රු. 132,700.00

මාසික ශුද්ධ ලාභය = මාසික මුළු විකුණුම් ආදායම - මාසික මුළු වියදම
= රු. 149,940.00 - රු. 132,700.00
= රු. 17,240.00

ව්‍යාපාරයේ අයිතිකරුද නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 25,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, රු. 17,240.00 ක ශුද්ධ ලාභයක් උපයා ගත හැකිය.

විදුලි උපකරණ අලුත්වැඩියාව

1. හැඳින්වීම

විවෘත ආර්ථිකයේ ආරම්භයත් සමඟ මෙරට ආනයන අපනයන සම්භාධක ඉවත්වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලාංකිකයන්ට ආනයනික විදුලි උපකරණ පරිභෝජනයට අවස්ථාව උදාවිය. වර්තමාන කාර්යබහුල ජීවනරටාව තුළ මෙම විදුලි උපකරණ ජන ජීවිතයට අත්‍යවශ්‍ය අංගයක් වී ඇත.

විදුලි උපකරණ භාවිතය ඉහලයාම නිසා ඒවායේ නොයෙකුත් තාක්ෂණික දෝෂ හටගැනීමද බහුලව දැකිය හැකිය. ඒ අනුව විදුලි උපකරණ අළුත්වැඩියා කරගැනීමේ අවශ්‍යතාවත් සමගම ගෘහාශ්‍රිත කර්මාන්තයක් ලෙසින් විදුලි උපකරණ අළුත්වැඩියාව තාක්ෂණික දැනුමෙන් හෙබි ඕනෑම පුද්ගලයෙකුටම අවම ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි ව්‍යාපාරයකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

සේවා සපයන ව්‍යාපාරයක් නිසා අවශ්‍යවන්නේ සීමිත අමුද්‍රව්‍ය ප්‍රමාණයකි.
ඊයම්, වයර්, ගම්, සිලිකන්, ග්‍රීස්

3. වෙළඳපොල

වර්තමානය වන විට සෑම නිවසකම විදුලි උපකරණ අත්‍යවශ්‍ය භාණ්ඩ බවට පත් වී ඇත. උදාහරණ ලෙස රූපවාහිනිය, ගුවන්විදුලිය, විදුලිපංකාව, රෙදිසෝදන යන්ත්‍ර, රයිස් කුකර් ස්ත්‍රික්ක, අවන්, බ්ලෙන්ඩර් යනාදිය දැක්විය හැකිය.

විදුලි උපකරණ පරිභෝජනය දිනෙන් දින ඉහළ යෑම සහ ඒවා නිසිලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් ඒවායේ හටගන්නා තාක්ෂණික දෝෂ නිරාකරණය කරගැනීම සහ අළුත්වැඩියා කටයුතු සඳහා වර්තමානයේ විශාල ඉල්ලුමක් නිර්මාණය වී ඇත. වර්තමානයේ විදුලි උපකරණ ආනයනය සීමා කිරීම වැනිහේතු නිසාද අළුතින් උපකරණ මිලදී ගැනීම සීමාසහිත වී ඇති බැවින් පවතින උපකරණ අළුත් වැඩියා කරගනිමින් පරිහරණය කිරීමට සිදුවී ඇත. ඒ අනුව ගෘහාශ්‍රිත සේවා ව්‍යාපාරයක් ලෙස විදුලි උපකරණ අළුත්වැඩියාව සැලකියයුතු ආදායමක් ලබාගතහැකි ව්‍යාපාරික අවස්ථාවක්ව පවතී.

4. ආයෝජනය

සේවා සපයන ව්‍යාපාරයක් නිසා සීමිත යන්ත්‍ර උපකරණ ප්‍රමාණයකින් හා සුළු කාරක ප්‍රාග්ධන ආයෝජනයකින් ආරම්භ කළ හැකිය.

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 15,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය	=	රු. 9,900.00
මුළු එකතුව	=	**රු. 24,900.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර, ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේතන්තු කර නොමැත.

අංකය	යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	වටිනාකම (රුපියල්)
01	මල්ටි මීටරය	5,000.00
02	බවුත් චික (Electrical soldering iron)	1,000.00
03	ටූල්සෙට්	6,000.00
04	පිරිසිදු කිරීමේ උපකරණ (තිනර්,පින්සල්,බුරුසු,WD 40)	3,000.00
	එකතුව	15,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට පැය 08 ක් හා සතියකට දින 06 ක් විදුලි උපකරණ අළුත්වැඩියා කටයුතු සිදු කරන ආකාරයට ඇස්තමේන්තු කර ඇත.

අංකය	විස්තරය	දිනක වියදම (රු)	සතියක වියදම - දින 06 ක (රු.)
01	අමුද්‍රව්‍ය වියදම	500.00	3,000.00
02	ශ්‍රම වියදම	1,000.00	6,000.00
03	ගෙනවීමේ කුලී	100.00	600.00
04	විදුලිය	50.00	300.00
	එකතුව	1,650.00	9,900.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

මෙම ව්‍යාපාරය මසකට දින 24ක් ව්‍යාපාර කටයුතු සිදුකරන බව.

විදුලි උපකරණ අළුත්වැඩියාවේ දී අමතර කොටස් සඳහා වියදම පාරිභෝගිකයාගෙන් අයකර ගන්නා අතර, එම වියදම සේවා ආදායමට ඇතුලත්කර නොමැති බව.

අළුත්වැඩියාවේ ස්වභාවය අනුව සේවා ගාස්තුව වෙනස් වන අතර, අවම වශයෙන් දිනකට රු. 3,000.00ක ආදායමක් ලබන බව.

මාසික සේවා ආදායම = (දින 24 x දිනක සේවා ආදායම)
= 24 x රු. 3,000.00
= රු. 72,000.00

දිනක සෘජු පිරිවැය = රු. 1,650.00 (කාරක ප්‍රාග්ධන දිනක වියදම් වගුව)
= රු. 1,650.00 x 24 දින

මුලු සෘජු පිරිවැය = රු. 39,600.00
මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 39,600.00 + රු. 2,000.00
= රු. 41,600.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙනයාම සඳහා දරණ වියදම් වේ. (ක්ෂයවීම සහ වෙනත් වියදම්) එය මාසයක් සඳහා රු. 2,000.00 ක් ලෙස ඇස්තම්න්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	=	මාසික සේවා ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 72,000.00 - රු. 41,600.00
	=	රු. 30,400.00

ව්‍යාපාරිකයා විසින් ම සේවා සැපයීමේ කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 24,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, රු. 30,400.00 ක ශුද්ධ ලාභයක් උපයා ගත හැකිය.

පාසල් නිල ඇඳුම් නිෂ්පාදනය

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නීතියට අනුව අධ්‍යාපනය ලැබීමේ අයිතිය සුරැකීම සඳහා සෑම ළමයෙකුටම පාසලක් හිමි වේ. සියවස් ගණනාවක් තුල ක්‍රමාණුකූලව ගොඩ නැගුණු නීති රීති වලට අනුව වර්තමානයේ පාසල් දරු දැරියන් සඳහා සමානාත්මතාවය සුරැකීමේ අරමුණින් පාසල් නිල ඇඳුම අත්‍යාවශ්‍ය අංගයකි. එක ශ්‍රේණියෙන් ආරම්භ වී දහතුන ශ්‍රේණිය දක්වා වසර 13 ක කාලයක්, වසරක් සඳහා වැඩි දවස් ප්‍රමාණයක් එක් සිසුවෙකු පාසැල් නිල ඇඳුම පරිහරණය කරයි. කාර්යබහුල දෙමාපියන්ට තම දරුවන් සඳහා නිල ඇඳුම් රෙදි මිලදී ගෙන කුලියට ඇඳුම් මසන්නෙකු සොයා යාම අසීරුය. එබැවින් විවිධ ප්‍රමාණයන්ගෙන්, විවිධ වයස් කාණ්ඩයන් සඳහා එක් එක් පාසලට අවශ්‍ය පරිදි නිවැරදිව නිෂ්පාදිත පාසල් නිල ඇඳුම් වෙළඳපොළ තුළ පවතී. ඒවා පහසුවෙන් හා ඉක්මණින් මිලදී ගැනීමට හැකි බැවින් දරුවන් මෙන්ම දෙමාපියන්ද තෘප්තිමත් වේ. එවැනි ඉල්ලුමක් පවතින පාසල් නිල ඇඳුම් වර්තමානයේ කදිම ව්‍යාපාර අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

සුදු ගවුම්, සුදු කමිස, කොට කලිසම් සහ දිග කලිසම් 50 බැගින් එක් මාසයක් තුළ නිෂ්පාදනය සිදු කිරීම සඳහා පහත පරිදි අමුද්‍රව්‍ය අවශ්‍ය වේ. මෙම නිෂ්පාදනය සිදු කිරීම සඳහා සේවකයින් දෙදෙනෙකු මාසයකට දින 25ක් නිෂ්පාදනය සිදුකරන බව උපකල්පනය කර ඇත.

කුඩා (S), මධ්‍යම (M), සහ විශාල (L) යන ප්‍රමාණ වලින් නිෂ්පාදනය සිදු කෙරෙන අතර රෙදි සඳහා අවශ්‍ය ප්‍රමාණ සාමාන්‍ය අගයක් ලෙස සලකන ලදී.

අංකය	අමුද්‍රව්‍ය විස්තරය	ඒකක ප්‍රමාණය	ඒකක මිල (රු.)	වියදම (රු.)
01.	සුදු ගවුම් රෙදි	මීටර් 120	260.00	31,200.00
02.	සුදු කමිස රෙදි	මීටර් 70	260.00	18,200.00
03.	කොට කලිසම් රෙදි	මීටර් 50	320.00	16,000.00
04.	දිග කලිසම් රෙදි	මීටර් 70	350.00	24,500.00
05.	නූල් කෝන්	20	150.00	3,000.00
06.	කදකක්ර තම්සබට	මීටර් 1	250.00	250.00
07.	හක් (ගවුම් සඳහා)	50	1.00	50.00
08.	හක් (කලිසම් සඳහා)	100	2.00	200.00
09.	ඉලාස්ටික් (කොට කලිසම් සඳහා)	මීටර් 15	25.00	375.00
10.	Zipper	70	10.00	700.00
11.	අයිලට් (සුදු ගවුම් සඳහා)	කාඩ් 04	25.00	100.00
12.	බොත්තම්(සුදු කමිස සඳහා)	300	0.50	150.00
13.	ලේබල්	200	2.00	400.00
	එකතුව			95,125.00

3. වෙළඳපොල

ශ්‍රී ලංකාවේ සෑම දරුවෙකුටම පාසැලක් හිමි බැවින් පාසැල් නිල ඇඳුම් සඳහා වැඩි ඉල්ලුමක් පවතී. දෙසැම්බර් සහ නව පාසල් වාර ආරම්භ වන මාස වල වැඩි වශයෙන් නිල ඇඳුම් ඉල්ලුම් කරයි. සතියකට දින 05 ක් පාසැල් පැවැත්වීම, නිල ඇඳුම් සුදු පැහැයෙන් යුක්ත වීම, ළමයින් විසින් පරිහරණය කිරීම සහ එක් සිසුවෙකු අඛණ්ඩව වසර 13 ක කාලයක් නිල ඇඳුම් පරිහරණය යන හේතු මත සැලකිය යුතු වෙළඳපොල ඉල්ලුමක් මේ සඳහා පවතී. අවම වශයෙන් වසරක් සඳහා එක් සිසුවෙකුට පාසැල් නිල ඇඳුම් 05ක් පමණ අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා කාර්යබහුල දෙමාපියන්ගේ පහසුව සඳහා සූදානම් කළ නිල ඇඳුම් වෙළඳපොල තුළ පවතින අතර ඒ සඳහා වැඩි නැඹුරුවීමක් දක්නට ලැබේ. මේ සඳහා විවිධ වයස් කාණ්ඩයන්ට විවිධ ප්‍රමාණවලින් විවිධ පාසැල් වල නිල ඇඳුම් වෙළඳපොලේ දැකිය හැකිය. සකස්කරන ලද නිල ඇඳුම් වල මිලෙහි විශාල උච්ඡාවචනයක් දක්නට නොලැබේ. පාසැල් අසල ඇති අලෙවිසැල්, නගරයේ ප්‍රධාන ඇඳුම් අලෙවිසැල්, අර්ධ නාගරික සහ ග්‍රාමීය ඇඳුම් අලෙවිසැල් ආදියෙහි මෙම නිෂ්පාදන අලෙවිය සිදුකරයි. මෙහිදී ව්‍යවසායකයා විසින් අලෙවිය සඳහා තෝරාගත් ප්‍රදේශයේ පිහිටි පාසල් වල නිල ඇඳුම් වෙළඳපොලට ඉදිරිපත් කළ යුතු වේ.

4. ආයෝජනය

මාසයකට සිදු කරන පාසැල් නිල ඇඳුම් නිෂ්පාදනය සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 188,200.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	=	රු. 179,125.00
	මුළු එකතුව	=	**රු. 367,325.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතමයන් පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ගොඩනැගිල්ල සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	විස්තරය	වටිනාකම (රු.)
01.	ජුකී මැෂින් (2 × රු. 52,000.00)	104,000.00
02.	ඕවර් ලොක් මැෂින් (නූල් 5) - 1	80,000.00
03.	කතුරු (2 × රු. 2,000.00)	4,000.00
04.	ටේප් (2 × රු. 100.00)	200.00
	එකතුව	188,200.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

අංකය	විස්තරය	මාසික වියදම (රු.)
01.	අමුද්‍රව්‍ය සඳහා	95,125.00
02.	ගෙන ඒමේ කුලී	2,000.00
03.	නිෂ්පාදන ශ්‍රම වියදම (රු.25,000.00 × 2)	50,000.00
04.	වෙනත් වියදම්	2,000.00
	එකතුව	149,125.00

5. මාසික ශුද්ධ ලාභය

සුදු ගවුම්, සුදු කමිස, කොට කලිසම් සහ දිග කලිසම් යන නිෂ්පාදන වල කුඩා (S), මධ්‍යම (M) සහ විශාල (L) යන ප්‍රමාණ සඳහා පිරිවැය සහ විකුණුම් මිල එකිනෙකට වෙනස් වන නමුත්, මෙහිදී පිරිවැයෙහි හා විකුණුම් මිලෙහි සාමාන්‍ය අගය (Average Value) සලකා ගණනයන් සිදුකර ඇත.

මාසික විකුණුම් ආදායම

අංකය	නිෂ්පාදනය	මාසික අලෙවි ප්‍රමාණය (ඒකක)	ඒකක විකුණුම් මිල (රු.)	මාසික විකුණුම් ආදායම (රු.)
01.	සුදු ගවුම්	50	1,250.00	62,500.00
02.	සුදු කමිස	50	750.00	37,500.00
03.	කොට කලිසම්	50	750.00	37,500.00
04.	දිග කලිසම්	50	1,700.00	85,000.00
	එකතුව			222,500.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය
= රු.95,125.00 + රු.50,000.00 + රු.4,000.00
= රු. 149,125.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ.(දුරකතන, නඩත්තු, සංග්‍රහ, යන්ත්‍ර / උපකරණ ක්ෂය, බෙදාහැරීමේ වියදම්, කළමනාකරණ වැටුප් (රු. 20,000.00), ප්‍රවාහන හා ප්‍රචාරණ වියදම්
එක් මාසයක් සඳහා මුළු වක්‍ර වියදම රු. 35000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 222,500.00 - (රු. 149,125.00 + රු. 35,000.00)
= රු. 222,500.00 - රු. 184,125.00
= රු. 38,375.00

ව්‍යාපාරයේ අයිතිකරුම ඇදුම් මැසීමේ කාර්යයේ නියැලේ නම් ඒ වෙනුවෙන් රුපියල් 25,000.00 ක වැටුපක් ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රුපියල් 38,375.00 උපයා ගත හැකිය.

පලතුරු අලෙවිසැල

01. හැඳින්වීම

නිරෝගිමත් දිවියක් උදෙසා රස ගුණ පිරි පලතුරු පරිභෝජනය අත්‍යාවශ්‍ය කරුණකි. ලොකු කුඩා කා අතරත් දේශීය විදේශීය වශයෙන් පවතින පළතුරු වර්ග සඳහා ප්‍රියතාවයක් පවතී. පලතුරුවල පවතින සුවිශේෂී ගුණාත්මක අගයන් ලොකු කුඩා කා අතරත් පලතුරු පරිභෝජනයට ඇති කැමැත්ත ඉහළ නංවයි. පලතුරු පරිභෝජනය තුළින් ශරීරයට අත්‍යාවශ්‍ය විටමින්, බණිජ ලවණ, තන්තු සහ ප්‍රතිඔක්සිකාරක නොඅඩු ව ලැබේ. විශේෂයෙන් පලතුරු ආහාරයට එක්කර ගැනීමේ දී ඉදීගෙන එන පළතුරු කෑමට ගැනීම, විවිධ පැහැයෙන් යුතු පලතුරු පරිභෝජනයට එක්කර ගැනීම පිළිබඳව පාරිභෝගිකයින් සැලකිලිමත් විය යුතුය. නිරෝගී දිවියක් සඳහා දෛනික පලතුරු පරිභෝජනය 200g පමණ විය යුතු බව දැක්වේ.

ඇපල්, දොඩම්, මිදි වැනි විදේශීය පළතුරු පරිභෝජනයට ශ්‍රී ලාංකීය පාරිභෝගිකයින් වැඩි කැමැත්තක් දක්වනු ලබයි. එහෙත් දේශීය වශයෙන් හඳුනා ගත හැකි ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ අගයක් ගන්නා, පාරිභෝගිකයන් අතර ඉහළ පරිභෝජනයක් දක්නට ලැබෙන පලතුරු වර්ග මෙන්ම ඌන පරිභෝජනයක් සහිත පලතුරු වර්ග ද බහුලව පවතී. ආසියාවේ පළතුරු විවිධත්වය අතින් ඉහළම ස්ථානයේ සිටින්නේ ශ්‍රී ලංකාවයි. ඒ අනුව විවිධත්වයෙන් යුතු පලතුරු දක්නට ලැබෙන අප රට තුළ පලතුරු අලෙවිය සඳහා ව්‍යාපාර අවස්ථා ප්‍රචලිත කිරීමේ හැකියාව පවතී. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල වගා කෙරෙන පලතුරු වර්ග අලෙවි සැල් හරහා පාරිභෝගික ජනතාව අතට පහසුවෙන් පත් කිරීම ලාභදායී ව්‍යාපාර අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය.

02. වෙළඳපොල

මෙරට වසරකට ටොන් මිලියන 140ක පමණ පලතුරු අවශ්‍යතාවයක් පවතින බව හඳුනා ගෙන ඇත. ඒ අනුව පාරිභෝගික ජනතාව තුළ දේශීය විදේශීය පළතුරු සඳහා හොඳ ඉල්ලුමක් පවතී. එහෙත් මෙරට පලතුරු වෙළඳපල ඉල්ලුමට සරිලන ආකාරයෙන් පලතුරු සැපයීම සිදු නොවේ. පලතුරුවල පවතින ගුණදායක බව හේතුවෙන්, අධික මුදල් වියදම් කර ශක්ති ජනක ආහාර ලබා ගැනීමට වඩා පලතුරු ආහාරයට ගැනීම වඩා උචිතය. පලතුරු සඳහා පවතින මිල ගණන් එක් කාල සීමාවක් තුළ පවතින සුලභතාවයන් මත උච්චාවචනයන්ට ලක් වේ. ඒ අනුව ශ්‍රී ලංකාව පුරා විවිධ කාළගුණික දේශගුණික තත්ත්වයන් යටතේ වැවෙන පලතුරු වර්ග ගැනුම් මිල යටතේ මිලදී ගෙන සාධාරණ ලාභ ප්‍රතිශතයක් සහිතව අලෙවි කිරීමේ හැකියාව පලතුරු වෙළඳුන්ට පවතී. පලතුරු පරිභෝජනයට කැමැත්තක් දක්වන සියළුම කාණ්ඩයන්ට අයත් පුද්ගලයින් පලතුරු වෙළඳුන්ගේ ඉලක්ක පාරිභෝගික කණ්ඩායම් ලෙස හඳුනා ගත හැකිය. ඒ අනුව පලතුරු වෙළඳසැල් හරහා පාරිභෝගික ජනතාව අතට නැවුම් පලතුරු ලබා දීමේ හැකියාව පවතී.

03. අමුද්‍රව්‍ය

1. කෙසෙල් (ඇඹුල්, සීනි, කෝලිකුට්ටු)
2. ගස්ලබු
3. අන්නාසි
4. කොමඩු
5. ඇපල්
6. දොඩම්
7. මිදි

(මීට අමතරව වසරේ විවිධ කාලවල ඵලදාව ලැබෙන පලතුරු ද අලෙවි කරන ආකාරයට ගණනය කිරීම් සිදුකර ඇත.)

04. ආයෝජනය

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 95,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියකට)	- රු. 60,200.00
	මුළු එකතුව	- **රු. 155,200.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

අංකය	විස්තරය	වටිනාකම (රුපියල්)
1	ගොඩනැගිල්ල (බදු පදනමට තැන්පත් කළ මුදල) රු. 10,000.00 × මාස 6	60,000.00
2	ලී බක්කි සඳහා	6,000.00
3	තරාදිය	25,000.00
4	අනෙකුත් සුළු උපකරණ	4,000.00
	එකතුව	95,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියකට)

අංකය	විස්තරය	සතියක වියදම (රුපියල්)
1	පළතුරු මිලට ගැනීම	50,000.00
2	ගෙන ඒමේ වියදම	1,500.00
3	ශ්‍රම වියදම්	7,000.00
4	විදුලිය වියදම	200.00
5	ඇසුරුම් වියදම	1,000.00
6	වෙනත් වියදම්	500.00
	එකතුව	60,200.00

අලෙවිසැල මසකට දින 28 ක් විවෘතව තබන ආකාරයට ගණනය කිරීම් සිදුකර ඇත. ඒ අනුව,

මාසික විකුණුම් ආදායම - සතියකට ආදායම × 4
- රු. 70,000.00 × 4
- රු. 280,000.00

මාසික මුළු පිරිවැය ගණනය

මාසික මුළු පිරිවැය - සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

මාසික සෘජු පිරිවැය - පළතුරු ගැණුම් මිල + සෘජු ශ්‍රමය + සෘජු වෙනත් වියදම් (ගෙන ඒමේ වියදම් + ඇසුරුම්)
- රු. 200,000.00 + රු. 28,000.00 + රු. 6,000.00 + රු. 4,000.00
- රු. 238,000.00

වක්‍ර පිරිවැය - විදුලිය + වෙනත්ූ කඩ කුලිය + ක්ෂය වියදම්
- රු. 800.00 + රු. 2,000.00 + රු. 10,000.00 + රු. 300.00
- රු. 13,100.00

මාසික ශුද්ධ ලාභය - මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
- රු. 280,000.00 - (රු. 238,000.00 + රු. 13,100.00)
- රු. 280,000.00 - රු. 251,100.00
- රු. 28,900.00

ව්‍යාපාරිකයා විසින්ම ව්‍යාපාරික කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 28,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 28,900.00 ක් උපයාගත හැකිය.

ටයර් සේවා ව්‍යාපාරය

1. හැඳින්වීම

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින කොවිඩ් 19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස පොදු ප්‍රවාහනයට වඩා තනි පුද්ගල වාහන පරිභෝජනය ඉතා සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත. එයට සමගාමීව ටයර් සේවා කර්මාන්තය සඳහා වෙළඳපොල තුළ මනා ඉඩකඩක් විවර වෙමින් පවතී.

ප්‍රධාන මාර්ගයකට ආසන්න විදුලි බලය සහිත ගොඩනැගිල්ලක් තිබීම අවශ්‍යතාවයක් වන අතර සේවා ස්ථානයට වාහන ගැනීමට පහසු ස්ථානයක් වීම වැදගත් වේ. ටයර් සඳහා වායුව සැපයීම, පැච් දැමීම, වායු පරීක්ෂාව, ටයර් මාරු කිරීම වැනි කාර්යයන්වල සිට වීල් එලයින්මන්ට්, වීල් බැලැන්ස් හා වාහනවල තත්ත්ව පරීක්ෂාව දක්වා මෙම ව්‍යාපාරය විහිදී පවතින අතර ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා මූලික සේවා සැපයීම වුව ද ප්‍රමාණවත් වේ.

පුහුණු ශ්‍රමය ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන අතර විධිමත් ලෙස ඉගෙන ගැනීම තුළින් මෙන්ම කර්මාන්තයේ ඇති අත්දැකීම් හා පළපුරුද්ද තුළින් ද ව්‍යාපාරය මූලික මට්ටමේ ආරම්භ කළ හැකි වීම ව්‍යාපාරයේ පවතින වාසිදායක තත්ත්වයක් වේ. මේ සඳහා ආරම්භයේ දී විශාල ආයෝජනයක් අවශ්‍ය නොවන බැවින් ඕනෑම අයෙකුට පහසුවෙන් ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථාවක් වේ.

2. අමුද්‍රව්‍ය

කොම්පවුන්ඩ්
ෂුවර් පැච්
සොලිසන් ටින්
ටියුබ්ලස් වෑල්
ටියුබ්ලස් පැච්

3. වෙළඳපොල

තරඟකාරී ව්‍යාපාර ක්ෂේත්‍රයක් වුව ද සේවා අවශ්‍යතාවය මත පාරිභෝගිකයින් තම ළඟම ස්ථානය තෝරා ගැනීමත් හා ග්‍රාමීය මට්ටමේ පුද්ගලික වාහන පරිභෝජනය ඉහළ යාමත් හේතුවෙන් ව්‍යාපාරයේ පැවැත්ම සඳහා වාසිදායක පරිසරයක් ගොඩනැංවී ඇත.

එසේම ව්‍යාපාරයේ පවතින සේවාවන් වල වෙනස්කම් මෙන්ම සේවා සපයන්නාගේ කුසලතාවය, පාරිභෝගික සේවාව, යන කරුණු මත පාරිභෝගික රැඳී සිටීම තීරණය වේ. එසේම නවීන යන්ත්‍ර සූත්‍ර පැවතීම නිසා සේවක අවශ්‍යතාවය අවම මට්ටමක පැවතීම මත ව්‍යාපාරයේ ලාභදායීත්වය ඉහළ නංවා ගත හැකි ය. එම නිසා වෙළඳපොල ගැටළුවක් ඇති නොවේ.

4. ආයෝජනය

උපකල්පන

ව්‍යාපාරික ස්ථානය බදු පදනම මත ලබා ගනු ලබන ස්ථානයකි.
පරිසර හා අනෙකුත් බලපත්‍ර ලබා ගෙන ඇත.
ව්‍යාපාරය මසකට දින 30 ක් විවෘතව පවත්වාගෙන යයි.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 473,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	= රු. 60,000.00
	මුළු එකතුව	= **රු. 533,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහි දී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංකය	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම රුපියල්
01	කොම්පෙෂර් යන්ත්‍රය	80,000.00
02	ටයර් ගලවන යන්ත්‍රය	220,000.00
03	පැච් තම්බන යන්ත්‍රය	20,000.00
04	ජැක්	15,000.00
05	ට්‍රොලි ජැක්	19,000.00
06	ටියුබ්ලස් උපකරණ	4,000.00
07	වීල් බ්‍රෂ්	2,000.00
08	බට හා ප්‍රෙෂර් මීටරය	5,000.00
09	යතුරු හා උපකරණ	13,000.00
10	මිටි	5,000.00
	එකතුව	383,000.00
	ස්ථානය සඳහා මාස 6 කට තැම්පත් මුදල	90,000.00
	මුළු එකතුව	473,000.00

4.2 කාරක ප්‍රාග්ධන පරිවැය (මසක් සඳහා)

මසකට දින 30 ක් තුළ වායු සැපයුම් 150ක්, පැච් දැමීම් 300ක්, වායු පරීක්ෂාව 20 ක්, ටයර් මාරු කිරීම 20ක් හා වෙනත් සේවා සැපයීම් 10 ක් යන කාර්යයන් කරනු ලබන බවට උපකල්පනය කෙරේ.

අංකය	විස්තරය	දිනක වියදම රු.	මසක වියදම රු.
01	අමුද්‍රව්‍ය සඳහා වියදම		11,000.00
02	ශ්‍රම වියදම	1,500.00	45,000.00
03	වෙනත් වියදම (විදුලිය,ජලය හා වෙනත්)		4,000.00
	එකතුව		60,000.00

5. මාසික ශුද්ධ ලාභය

මසකට දින 30 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන බව උපකල්පනය කර ඇත. මාසිකව පැව් දැමීම තුළින් රු. 55,000.00 ක්, ටියුබ්ලස් පැව් දැමීම තුළින් රු. 30,000.00 ක්, හා අනෙකුත් කාර්යයන් තුළින් රු. 20,000.00 කළහොත් විකුණුම් ආදායම රු. 105,000.00 ක් වේ යැයි ඇස්තමේන්තු ගත කෙරේ. ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = රු. 105,000.00
මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය

මාසික සෘජු පිරිවැය = රු. 11,000.00 + රු. 45,000.00 + රු. 4,000.00
= රු. 60,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ. (ගොඩනැගිලි කුලී, නඩත්තු හා අලුත්වැඩියාව, ක්ෂය, ප්‍රවාහන, ලිපිද්‍රව්‍ය, දුරකථන) එය මාසයක් සඳහා රු. 21,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 60,000.00 + 21,000.00
= රු. 81,000.00

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 105,000.00 - රු. 81,000.00
= රු. 24,000.00

ව්‍යාපාරිකයා විසින්ම ව්‍යාපාර කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට ශ්‍රම වැටුප ලෙස රු. 45,000.00ක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 24,000.00 ක් උපයාගත හැකි ය.

Home Stay
සංචාරක නවාතැන් පහසුකම් සැපයීම

1. හැඳින්වීම

ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයට හිතකර මෙන්ම ප්‍රවණතාවයක් දක්වන රටකි. වර්තමානයේ අප රට තුළ මෙන්ම මුළු ලෝකය පුරා පවතින වසංගතය හමුවේ සංචාරක කර්මාන්තය තරමක් අඩපණ වී තිබුණ ද එය නැවතත් යථා තත්වයට පත් වනු ඇත. වර්තමානයේ ලංකාවට පැමිණෙන සංචාරකයන් දෙස බලන විට ඔවුන් විශාල හෝටල් කාමර තුළ පහසුකම් ලබා ගන්නවාට වඩා ග්‍රාමීය හා නාගරික සංචාරක මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගත් නිවාස ආශ්‍රිත කාමර ලබාගෙන නැවතීමේ ප්‍රවණතාවයක් ඇත. මෙහිදී සංචාරකයන්ට අඩු වියදමකින් ඔවුන් බලාපොරොත්තු වන නිස්කලංක පරිසරය හා ග්‍රාමීය ආහාර පාන ලබා ගැනීමේ පහසුව ඇති වේ. මේ තුළින් ව්‍යාපාරයට අවතීර්ණ වන ග්‍රාමීය පවුල් ඒකක සඳහා සැලකිය යුතු ආදායමක් ලබාගැනීමට හැකි වේ. මෙය තංගල්ල මීගමුව, ඇල්ල, හබරණ, පොලොන්නරුව, හික්කඩුව ආදී සංචාරක ආකර්ෂණය දිනා ගත් ප්‍රදේශ වල ප්‍රචලිතව පවතින ව්‍යාපාර අවස්ථාවකි. මෙයින් සිදුකරන්නේ ව්‍යාපාරයට ප්‍රවිෂ්ට වන පුද්ගලයාගේ නිවස තුළම කාමර 01 ක් හෝ 02 ක් සංචාරකයන්ට ගැලපෙන ලෙස සකස්කර දින පදනම මත ඔවුන් වෙත ලබා දිමයි. ආහාර ලබා දීම හෝ නොදීම සංචාරකයාගේ ඉල්ලුම මත පදනම් වේ. මෙය කාලෝචිත හා වැඩි ආදායමක් ලබා ගත හැකි ව්‍යාපාර ක්ෂේත්‍රයකි. ව්‍යාපාරයක් ලෙස සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිය ද ලබාගත යුතුය.

2. ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය දේවල්

සංචාරකයන්ට ලබා දිය හැකි යුගල කාමරයක් සහිත ඒකකයක් උදාහරණයක් ලෙස ගනිමු..

- අනුබද්ධ නාන කාමර සහිත යුගල කාමරය
- යුගල ඇඳ, කොට්ට 02, ඇඳ කවරය, පොරෝනා 02, තුවා
- තේ පෝච්චිය, තේ කෝප්ප 02, තේ හැඳි 02
- කඩදාසි අත් පිස්නා
- සීනී, කිරි, තේ
- වතුර බෝතල් (500ml)- 02
- විදුලි කේතලය
- සබන් කැට -02
- Toilet Paper roll -01
- බුමුතුරුණු - 02

3. වෙළෙඳපල

ප්‍රධාන සංචාරක නිකේතන ඉහළ ගාස්තු අය කිරීම සහ ඒවා ප්‍රධාන නගර ආශ්‍රිතව කේන්ද්‍ර ගත වීම නිසා සංචාරකයන් වෙනත් විකල්ප කරා ඇදී එයි. මෙම සේවාව තුළින් දැරිය හැකි මිල ගණන් අය කිරීම, නිස්කලංක පරිසරය, දේශීය ආහාර ලබා ගත හැකිවීම, ග්‍රාමීය නිසංසල පරිසරය හා සංස්කෘතිකමය පිළිගැනීම ආදී කරුණු නිසා home stay සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවති.

4. මුළු ආයෝජනය

සංචාරකයන් දිනකට දෙදෙනකු නවාතැන් ගන්නා ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළයුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	-	රු. 697,600.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	-	රු. 27,000.00
	එකතුව	-	**රු. 724,600.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

අංකය	ගොඩනැගිලි හා උපකරණ	වටිනාකම (රු.)
01	අළුත් වැඩියා කළ අනුබද්ධ නාන කාමරය සහිත යුගල කාමරය වායු සමීකරණය, ටයිල් පොළොව සහ වහල සිවිලිම් සහිතව	600,000.00
02	විදුලි කේතලය	1,500.00
03	තේ පෝච්චිය හා තේ කෝප්ප 02	1,000.00
04	තේ හැඳි 02	100.00
05	රූපවාහිනිය	40,000.00
06	යුගල ඇඳ	50,000.00
07	කොට්ට 02	1,000.00
08	ඇඳ කවර හා පොරෝනා	3,000.00
09	බුමුතුරුණු	1,000.00
	මුළු වටිනාකම	697,600.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට දෙදෙනකු නවාතැන් ගන්නා පරිදි සතියකට දින 06 ක් ලෙස සේවා සැපයීම

අංකය	විස්තරය	දිනක වියදම රු.	සතියක වියදම රු.
01	අමුද්‍රව්‍ය වියදම(ආහාර සකස් කිරී ම සඳහා)	2,500.00	15,000.00
02	ශ්‍රම වියදම (ව්‍යාපාරිකයා + පවුලේ සාමාජිකයෙකු) 1000 ×	2,000.00	12,000.00
03	වෙනත් වියදම්	1,000.00	6,000.00
	එකතුව	5,500.00	33,000.00

05. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය තුළ මාසයකට දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන අතර එක් දිනක දී තේ සහ ආහාර සමඟ යුගල කාමරයක් ලබා දෙන බවට ඇස්තමේන්තු කර ඇත.

මාසික විකුණුම් ආදායම - (දින 25 × දිනකදී ලැබෙන දළ ආදායම)

මාසික ආදායම

කාමර ලබා දීමෙන්	-	රු. 87,500.00 (දින 25 × රු. 3,500.00)
ආහාර ලබා දීමෙන්	-	රු. 100,000.00 (දින 25 × රු. 4,000.00)
සංචාරක මගපෙන්වීමෙන්	-	රු. 30,000.00 (දින 25 × රු. 1,200.00)
මුලු ආදායම	-	රු. 21,7500.00

මාසික මුළු පිරිවැය - සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය - සෘජු අමු ද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්
දිනකට සෘජු පිරිවැය - රු. 2,500.00 + රු. 2,000.00 + රු. 1,000.00
- රු. 5,500.00 × දින 25
මාසික සෘජු පිරිවැය - රු. 137,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන අනෙකුත් වියදම් වේ .(ජලය, ප්‍රවර්ධනය ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා 24000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය - මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
- රු. 217,500.00 - (රු. 137,500.00 + රු. 24,000.00)
- රු. 217,500.00 - රු. 161,500.00
- රු. 56,000.00

ව්‍යාපාරිකයා විසින්ම සේවා කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 25,000.00 ක වැටුපක් ලබා ගත හැකි වේ. ශුද්ධ ලාභය වශයෙන් රු. 56,000.00 උපයා ගත හැකිය.පවුලේ එක් අයෙකුට රු. 25,000.00ක වැටුපක් සහිත රැකියා අවස්ථාවක් ලබා දිය හැකිය.

කායවර්ධන/ ව්‍යායාම මධ්‍යස්ථාන

1. හැඳින්වීම

වර්තමානයේ ශ්‍රී ලාංකිකයින්ගේ සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පුරුදු, කාබෝහයිඩ්‍රේට් සහ සීනි බහුල ආහාර, කාර්යබහුල ජීවන රටාව හා ව්‍යායාම අඩුකම නිසා, කුඩා ළමුන් ඇතුළු තරුණ හා වයස්ගත පිරිස් අධික රුධිර පීඩනය, කොලෙස්ටරෝල් සහ දියවැඩියාව ඇතුළු අනෙකුත් බෝනොවන රෝග වලට ගොදුරු වීම ඉතා ඉහළ මට්ටමක පවතී. බෝනොවන රෝග වලින් වැලකීම සඳහා වෛද්‍ය නිර්දේශය වන්නේ ව්‍යායාම වෙත යොමු වීමය. සැබවින්ම, ශාරීරිකව හා මානසිකව සෞඛ්‍ය සම්පන්නව සිටීමට සහ දිගුකාලීන ජීවන තත්ත්වයක් භුක්ති විඳීමට, සෑම පුද්ගලයෙකුම ශරීර සුවතා කටයුතුවල නිරතවීම යෝග්‍ය වේ. ඒ නිසා සුළු පරිමාණ කායවර්ධන මධ්‍යස්ථාන ග්‍රාමීය මෙන්ම නාගරිකව පිහිටුවීමේ අවශ්‍යතාව ඉස්මතු වී ඇති අතර, එය හොඳ ව්‍යාපාර අවස්ථාවක් බවට පත්ව ඇත.

2. අවශ්‍ය උපකරණ / යන්ත්‍ර

ව්‍යායාම් සඳහා අවශ්‍ය අවම උපකරණ/යන්ත්‍ර මෙහිදී සලකා ඇත. දේශීය නිෂ්පාදකයින්ගෙන් හෝ ව්‍යායාම් උපකරණ ආනයනය කරන ආයතන හරහා මෙම උපකරණ මිලදී ගත හැකි අතර, එම උපකරණ සාමාන්‍ය ව්‍යවහාරික නාමයන් යටතේ පහත පරිදි වේ.

Squat stand
Flat bench
Preacher curl bench
Sit up bench
Calf raises machine
Chin up with pawl bar doorway
inkling bench with rack
stand with bench
Lat pull down machine
t - bar rowing
twisting machine

3. වෙළඳපොල

සෞඛ්‍යය සම්පන්න ජීවන රටාවක් වෙනුවෙන් හා තරබාරුව අඩු කර සිරුරේ මනා පෙනුම හා හැඩය පවත්වා ගැනීම වෙනුවෙන් ව්‍යායාම වෙත යොමුවීමේ අවශ්‍යතාවය පිළිබඳ මාධ්‍ය හරහා සිදුකරන දැවැන්ත ප්‍රචාරණ හමුවේ ව්‍යායාම සඳහා ඇති ඉල්ලුම වැඩි වී ඇත.

ඒ නිසා මිනිසුන් තම ආදායමට හා ස්ථානයට ගැලපෙන පරිදි ශාරීරික ක්‍රියාකාරකම් සේවාවකට ප්‍රවේශය සොයන මෙම කාල සීමාවේ දී පවතින වසංගත තත්ත්වයත් සමඟ කාය වර්ධන මධ්‍යස්ථාන වෙත යොමු වීම පෙන්නුම් කරයි. දෛනික, මාසික, අර්ධ වාර්ෂික හෝ වාර්ෂික ගෙවීම් මත සේවා සැපයීම බෝහෝ ස්ථාන වල සිදු වේ. බෝහෝ පිරිසකගේ අරමුණු වනුයේ ව්‍යායාම් උපදේශකවරයෙකුගේ සහය ඇතිව සේවා ලබා ගැනීම වේ.

4.0 ආයෝජනය

කායවර්ධන/ව්‍යායාම් මධ්‍යස්ථානයක් යනු සේවා සැපයීමේ ආයතනයක් බැවින්, ආරම්භ කිරීම සඳහා මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය පමණක් ප්‍රමාණවත් වේ. ඒ අනුව මෙවැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා **රු. 530,000.00** ක් පමණ ආයෝජනය කළ යුතු වේ.

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් වර්ග අඩි 1,500 ක ප්‍රමාණයෙන් යුතු පිරිසිදු ගොඩනැගිල්ලක් අවශ්‍ය වන අතර, එය කුලී පදනම මත ලබා ගත හැකිය. අනෙකුත් අත්‍යාවශ්‍ය උපකරණ හා ව්‍යායාම් යන්ත්‍ර පමණක් ලබාගන්නා ආකාරයට ඇස්තමේන්තු කර ඇත.

අංක	උපකරණ	වටිනාකම (රු.)
01	ව්‍යායාම් යන්ත්‍ර	200,000.00
02	ව්‍යායාම් උපකරණ	290,000.00
03	අනෙකුත් උපකරණ	10,000.00
04	ගොඩනැගිලි සඳහා මූලික තැන්පතුව (කුලියට ලබා ගන්නේ නම් පමණි) ස්ථාන අනුව වෙනස් විය හැකිය	30,000.00
	එකතුව	530,000.00

ව්‍යායාම් උපකරණ හා යන්ත්‍ර දේශීය නිෂ්පාදකයන් ගේ මිල ගණන් මත පදනම් වේ. (Squat stand, flat bench, stand with bench, inkling bench with rack, preacher curl bench, lat pull down machine, sit up bench, calf raises machine, twisting machine, t bar rowing, chin up with pawl bar doorway)

5.0 මාසික ශුද්ධ ලාභය

එක් සේවාලාභියෙකු සතියට දින 3ක් හා දිනකට පැය 2 ක් ව්‍යායාම් සඳහා පැමිණෙන බවටත්, එක් අයෙකුගෙන් මසකට රු. 2,000.00 ක් අයකරන ආකාරයටත් ගණනය කිරීම් සිදුකර ඇති අතර, මසකට සේවාලාභීන් 40 කට සේවා ලබා දෙන බව සලකා ඇත.

මාසික විකුණුම් ආදායම = රු. 2,000.00 × 40
= රු. 80,000.00

මුළු පිරිවැය

සේවා සපයන ව්‍යාපාරයක් නිසා මෙහි පිරිවැය ලෙස සලකා ඇත්තේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා මාසිකව දරණ වියදම් වේ. (අයිතිකරු වැටුප, විදුලිය, ජලය, ගොඩනැගිලි කුලිය, වරිපනම්, ව්‍යායාම් උපකරණ හා යන්ත්‍ර නඩත්තු කිරීම ඇතුළු අනෙකුත් සියලු වියදම්). ඒ අනුව මෙම ව්‍යාපාරය දින 25 ක් සේවා ලබා දෙන්නේ නම්, මාසික වියදම රු. 50,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 80,000.00 - රු. 50,000.00
= රු. 30,000.00

ව්‍යාපාරයේ අයිතිකරු ව්‍යායාම් මධ්‍යස්ථානයේ සියලු කටයුතු සිදු කරන්නේ නම්, ඔහුට වැටුප ලෙස රු. 25,000.00 ක් (දිනක වැටුප රු. 1,000.00 × දින 25) වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 30,000.00 ක් උපයා ගත හැකිය.

බතික් නිෂ්පාදන

1. හැඳින්වීම

බතික් යනු සුවිශේෂී ව්‍යාපාරික අවස්ථාවක් මෙන්ම නිර්මාණශීලීත්වය මත ගුණාත්මක බව ඉහළ යන කලාවකි. මෙම බතික් කලාව ශ්‍රී ලාංකීය දේශීය සංස්කෘතියේ ගැඹුරින් මුල්බැසගත් සාම්ප්‍රදායික කලාවක් ලෙස ක්‍රියාත්මක වන්නේ ලංකාවටම ආවේණික වූ සුවිශේෂී ක්‍රමවේදයකට අනුවයි. ඉටි-ප්‍රතිරෝධී සායම් කරන තාක්ෂණික ක්‍රමවේදයක් යටතේ මෙම කලාව සිදු කරනු ලබයි.

දේශීයව ගත්කල ශ්‍රී ලංකාවේ විලාසිතා තුළ බතික් වලට ඇත්තේ ඉහළ වෙළඳපලකි. මේ නිසාම ලංකාවේ බතික් කර්මාන්තය නව්‍යකරණයට ලක්වෙමින් දිනෙන් දින ව්‍යාප්ත වන ස්වභාවයක් දක්නට ඇත. අලුත් විලාසිතාවන්ට උචිත අයුරින් නිර්මාණාත්මකව සහ ආකර්ෂණීය අයුරින් නිර්මාණය වන බතික් ඇඳුම්, දෛනික භාවිතයේ සිට, සමාන්‍ය ගමනකට, කාර්යාලයට, විනෝද චාරිකාවන්ට වගේම, මංගල උත්සව සඳහා ඇඳුම් කට්ටල දක්වාම විවිධාකාර ස්වරූපයෙන් නිර්මාණය වන්නේ බතික් කලාවට ඇති සුවිශේෂ හැකියාව නිසාවෙනි. එනම් තමන් කැමති වර්ණයකින්, තමන් කැමති නිර්මාණයක් යොදා ගෙන, ඇඳුම් නිමවා ගැනීමට ඇති හැකියාවයි.

බතික් සාරි, ගවුම්, සරොම්, චිත්ත, කමිස, බෑග්, සෙරෙප්පු පමණක් නොව බතික් ආභරණ පවා වත්මන් වෙළඳපළ තුළ දක්නට ලැබෙන්නේ විවිධාංගීකරණ වූ වෙළඳපළ මොනවට පැහැදිලි කරමිනි. බතික් රෙදි නිර්මාණය කර ගැනීමෙන් පසුව අවශ්‍ය පරිදි තම නිෂ්පාදනය නිමවා ගත හැකි අතර, බතික් නිෂ්පාදනයන් වෙනස් වන්නේ ඒ සඳහා භාවිතා කරන ඩයි වර්ගය අනුවයි. ප්‍රධාන වශයෙන් ඩයි වර්ග 03ක් භාවිතා කරනු ලබන අතර, එම ඩයි වර්ගය අනුව නිෂ්පාදන පිරිවැය මෙන්ම නිෂ්පාදනයේ ගුණාත්වය තීරණය වේ.
එම ඩයි වර්ග 03 පහත පරිදි වේ.

- රිඇක්ටිව් ඩයි
- වැට් ඩයි
- නැප්තෝල් ඩයි

2. අවශ්‍ය අමුද්‍රව්‍ය (සාරි 01 ක් සඳහා)

රිඇක්ටිව් ඩයි	
රෙදි යාර	07
සෝඩා ඇෂ්	100g
ඩයි	25g
VIP	5ml
යූරියා	13g
Tinofix	25ml
ලුණු	250g
ජලය	20L
පැරපින් ඉටි	

වැට් ඩයි	
රෙදි යාර	07
ඩයි	25g
හයිඩ්‍රෝ	100g
කෝස්ට්‍රික්	100g
ජලය	20L
පැරපින් ඉටි	

නැප්තෝල් ඩයි	
රෙදි යාර	07
නැප්කෝල්	50g
කෝස්ටික්	200g
ඩයි	50g
ලුණු	500g
ජලය	20L
පැරපින් ඉටි	

3. වෙළඳපොල

- බතික් කලාවේ පවතින සුවිශේෂත්වය වන්නේ එක් වයස් කාණ්ඩයකට සීමා නොවී බාල, තරුණ, වැඩිහිටි යන ඕනෑම වයස් කාණ්ඩයක් වෙත විවෘත වෙළඳපොලක් පැවතීමයි.

- දෛනික භාවිතයේ සිට, සමාන්‍ය ගමනකට, කාර්යාලයට, විනෝද චාරිකාවන්ට වගේම, මංගල උත්සව සඳහා ඇදුම් කට්ටල දක්වාම විහිදෙන පුලුල් වෙළඳපල අවස්ථාවක් ඇත.

- සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතවද දේශීය සංස්කෘතික වශයෙන් ප්‍රචලිත මොස්තර භාවිතා කරමින් විවිධ සිහිවටන අන්දමේ නිර්මාණ තුලින් බතික් නිෂ්පාදන සඳහා විදේශිකයින් සඳහා වන වෙළඳපොලක් නිර්මාණය කර ගත හැකිය.

- එමෙන්ම බතික් ඇඳුම් නිෂ්පාදනයෙන් ඉතිරිව ඉවත දමන කොටස්වලින් බතික් පාවහන්, ආභරණ, බෑග් වැනි දෑ නිෂ්පාදනය කර විවිධාංගීකරණය වූ බතික් වෙළඳපොළ තුළ අමතර ආදායමක් ලබා ගැනීමට ද හැකියාවක් පවතී.

- එමෙන්ම වර්තමානය වනවිට සමාජ මාධ්‍ය භාවිතය ඉතා ඉහළ මට්ටමක පවතින බැවින්, සමාජ මාධ්‍ය භාවිතා කරමින්ද අලෙවි සම්බන්ධතා ගොඩනගා ගත හැකිය. එබැවින් වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම පහසු මෙන්ම තම ව්‍යාපාරය පිළිබඳව ප්‍රචාරණ කටයුතු සිදු කිරීම පහසු වේ.

- නිර්මාණශීලීත්වය තුළින් සාර්ථක කර ගත හැකි ව්‍යාපාරයක් වන බැවින් නිර්මාණශීලීත්වයෙන් අනූන ඔබට තරගකාරී වෙළඳපොළ ආකර්ශණය කර ගැනීමට හැකිවනු ඇත. එමෙන්ම අන්තර්ජාලය භාවිතා කරමින් තම නිර්මාණශීලීත්වය වර්ධනය කරගැනීමටද හැක.

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	වතුර ලීටර් 20 ක සිමෙන්ති ටැංකියක්	8,000.00
02	ගැල්වනයිස් බැරල් 01	1,700.00
03	ලොකු බේසම් 01	700.00
04	ටුල් (පනල්) 01	250.00
05	භූමිතෙල් ලිප් 01	750.00
	එකතුව	11,400.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

සතියකට රිඇක්ටිව් ඩයි යෙදූ බතික් සාරි 04ක්ද, වැට් ඩයි යෙදූ බතික් සාරි 04ක් සහ නැප්තෝල් ඩයි යෙදූ බතික් සාරි 04ක් වශයෙන් සතියට සාරි 12ක් සහ මසකදී සාරි 48 ක් නිෂ්පාදනය කරනු ලැබේ. සතියකට දින 06 ක් වන සේ මසකට දින 24ක් වැඩ කරන ලෙස සැලකේ.

අංක	විස්තරය	සතියක වියදම (රු.)	මාසයක වියදම (රු.)
01	රිඇක්ටිව් ඩයි යෙදූ බතික් සාරි	7,320.00	29,280.00
02	වැට් ඩයි යෙදූ බතික් සාරි	7,740.00	30,960.00
03	නැප්තෝල් ඩයි යෙදූ බතික් සාරි	8,140.00	32,560.00
04	ශ්‍රමය	7,200.00	28,800.00
05	සේවක වැටුප්	5,400.00	21,600.00
06	විදුලිය	500.00	2,000.00
07	ඇසුරුම්	60.00	240.00
08	ගෙන ඒමේ කුලී	150.00	600.00
09	දර	500.00	2,000.00
	එකතුව	37,010.00	148,040.00

උපකල්පන

- මෙම ව්‍යාපාරය මාසයකට දින 24ක් පමණක් ව්‍යාපාර කටයුතු සිදු කරන බව.
- ව්‍යාපාරයේ හිමිකරු සහ එක් සේවකයෙක් පමණක් සේවය කරන බව.
- ලංකා වොයිල් සුදු පැහැති රෙද්දෙන් පමණක් නිශ්පාදන සිදු කරන බව. (රෙදි වර්ගය සහ ඩයි වල පාට අනුව මිල ගණන් වෙනස් වේ.)
- ඕනෑම බතික් නිර්මාණයක් සඳහා පළමුව රෙදි නිර්මාණය කර ගත යුතුය. එබැවින් සාරි පමණක් නිශ්පාදනය කරන බව උපකල්පනය කර පිරිවැය ගණනය කර ඇත. (සාරි 01ක් සඳහා යාර 7 ක් අවශ්‍ය වන අතර සාරියක පිරිවැය 7න් බෙදා රෙදි යාරයක පිරිවැය ගණනය කළ හැකිය)
- ව්‍යාපාරික ස්ථානය වශයෙන් සිය නිවස භාවිතා කරන බව.
- නිෂ්පාදන පාරිභෝගිකයා ව්‍යාපාරික ස්ථානය වෙත පැමිණ ගෙන යන බව.

විකුණුම් ආදායම

රිඇක්ටිව් ඩයි යෙදු බතික් සාරි (සාරියක මිල රු. 3,750.00 බැගින් සාරි 16)	= රු. 60,000.00
වැට් ඩයි යෙදු බතික් සාරි (සාරියක මිල රු. 3,850.00 බැගින් සාරි 16)	= රු. 61,600.00
නැප්තෝල් ඩයි යෙදු බතික් සාරි (සාරියක මිල රු. 4,000.00 බැගින් සාරි 10)	= රු. 64,000.00
	= රු. 185,600.00

5. මාසික ශුද්ධ ලාභය

මාසික මුළු පිරිවැය	= සෘජු පිරිවැය +වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය	= සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් වියදම
සතියක සෘජු පිරිවැය	= රු. 23,200.00 + රු. 12,600.00 + රු.1,210.00
මාසික සෘජු පිරිවැය	= රු. 37,010.00 × සති 4
	= රු. 148,040.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දරන වියදම් වේ. (යන්ත්‍රෝපකරණ ක්ෂය, ජලය, ආදි අනෙකුත් වියදම්) මාසයකට වක්‍ර වියදම් සඳහා රු. 5,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික මුළු පිරිවැය	= සෘජු පිරිවැය +වක්‍ර පිරිවැය
	= රු. 148,040.00 +5,000.00
	= රු. 153,040.00

මාසික ශුද්ධ ලාභය	=	මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 185,600.00 - රු. 153,040.00
	=	රු. 32,560.00

එමෙන්ම මෙම බතික් නිර්මාණ මගින් ඉවතලන කුඩා කොටස් ප්‍රයෝජනයට ගනිමින් බතික් පාවහන්, බෑග්, ආභරණ වැනි නිෂ්පාදන වලට යොමු වීමෙන් අමතර ආදායම් හිමි කර ගැනීමේ හැකියාවද පවතී.

ව්‍යාපාරිකයා විසින්ම නිශ්පාදන කටයුතු සිදු කරයි නම්, ඔහුට/ඇයට මසකට රු. 28,800.00 ක ශ්‍රම වැටුප ලබා ගත හැකි අතර, රු. 32,560.00 ක ශුද්ධ ලාභයක් උපයා ගත හැකිය.

මදුරුදැල් නිෂ්පාදන

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ බොහෝ රටවල් මැලේරියාව, ඩෙංගු වැනි මදුරුවන් මඟින් බෝවන රෝග වලින් ආරක්ෂා වීමට භාවිතා කරන විශේෂ ක්‍රමවේදයක් ලෙස මදුරුදැල් හැඳින්විය හැකිය. එමෙන්ම සුවපහසු නින්දක් ලබා ගැනීම සඳහා නිදන ඇඳන් වටා ආකර්ශනීයව මෙන්ම ආරක්ෂාව සඳහා භාවිතා කරන නිෂ්පාදනයක් ලෙසද හැඳින්විය හැකිය. මදුරුවන්ගෙන් ආරක්ෂාවීම සඳහා නොයෙකුත් මදුරු නාශක වර්ග වෙළඳපොල තුල දැකිය හැකි වුවද, මදුරුදැල් භාවිතය වඩා ආරක්ෂාකාරී ක්‍රමයක් වේ. නිර්මාණ කුසලතාවය භාවිතා කිරීම තුළින් හා රෙදි මැසීමේ මූලික පුහුණුව තුළින් විවිධ මෝස්තරවලින් යුත් මදුරු දැල් නිෂ්පාදනය කිරීම ජීවනෝපාය මාර්ගයක් ලෙස ගෘහාශ්‍රිතව සිදුකළ හැකිය. ගෘහනියකට පහසුවෙන් ආරම්භ කිරීමට හැකි මෙම මදුරුදැල් නිෂ්පාදනය දැනුම ලබා ගැනීම සඳහා ද සුලභව අවස්ථා පවතින නිසාවෙන් කුඩා පරිමාණික ව්‍යාපාර අවස්ථා අතර ඉහළින් සැළකිය හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- චකෝ රෙදි
- කන්ඩියුට් බට
- ගම්
- ප්ලාස්ටික් කොකු
- බෙන්ඩ් කෑලි
- නූල්
- නෙට් පොප්ලින්
- රේන්ද
- ඕවර්ලොක් නූල්

3. වෙළෙඳපොල

මදුරු දැල් සියලු වයස් කාණ්ඩවල පාරිභෝගිකයින්ට එකසේ අත්‍යාවශ්‍ය වන නිෂ්පාදනයකි. සුව පහසු නින්දක් ලබාගැනීම සඳහා අවශ්‍ය වන නිෂ්පාදනයක් නිසා මෙය කුඩා දරුවන්ගේ සිට වැඩිහිටි ජනයාගේ අවශ්‍යතාවය පරිදි විවිධ මිල ගණන්, විවිධ වර්ණයන්ගෙන් සහ විවිධ ප්‍රමාණයන්ගෙන් යුතුව වෙළඳපොල තුළ අලෙවිකළ හැකිය. එමෙන්ම හෝටල්, නවාතැන් සපයන ආයතන වෙතින් ද මේ සඳහා හොඳ ඉල්ලුමක් පවතී. ප්‍රසිද්ධ වෙළඳනාම යටතේ වෙළඳපොල තුළ මදුරුදැල් නිෂ්පාදන දැකිය හැකි වුවද, පාරිභෝගික අවශ්‍යතාවය පරිදි ගුණාත්මකව හා ආකර්ෂණීය ලෙස නිෂ්පාදනය කරන්නේ නම් අලෙවි අවස්ථා නිර්මාණය කර ගත හැකිය,

4. ආයෝජනය

මසකට මැදුරු දැල් 60ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුළු මුදල. (තනි පාට තනි මදුරුදැල් 20, තනි පාට ද්විත්ව මදුරුදැල් 30, විවිධ වර්ණයන්ගෙන් සහ හැඩතල මුද්‍රිත මදුරු දැල් 10)

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධනය	- රු. 90,000.00
4.2	කාරක ප්‍රාග්ධනය (මසකට)	- රු. 106,600.00
	මුළු වියදම	- **රු. 196,600.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
1	ජුකී සාමාන්‍ය මැෂින් 1	40,000.00
2	ඕවර්ලොක් මැෂින් 1	45,000.00
3	සීලර් මැෂින්	3,000.00
4	කතුරු, ඉඳිකටු, සමඟ අනෙකුත් උපකරණ	2,000.00
	එකතුව	90,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

සතියකට දින 06 ක් නිෂ්පාදනයේ යෙදෙන මදුරුදැල් නිෂ්පාදන ව්‍යාපාරයේ මසකට දින 25 ක් සේවය කරයි.

අංක	විස්තරය	මාසික වියදම (රු.)
01	අමුද්‍රව්‍ය වියදම	78,600.00
02	ශ්‍රම වියදම	25,000.00
03	වෙනත් (ගෙන ඒමේ කූලී, ලේබල් සහ පොලිතින් පැකට්)	3,000.00
	මුළු වියදම	106,600.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට මදුරුදැල් 60 ක් නිෂ්පාදනය කරන අතර දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදු කරන බවට උපකල්පනය කර ඇත.

තනි පාට තනි මදුරුදැලක විකුණුම් මිල රු. 1,500.00ක් ද, තනි පාට ද්විත්ව මදුරුදැලක විකුණුම් මිල රු. 2,500.00ක් ද, විවිධ රටා සහ විවිධ පාට මිශ්‍ර මදුරු දැලක විකුණුම් මිල රු. 2,550.00ක් ද වේ.
මේ අනුව,

මසකට මුළු විකුණුම් ආදායම

	විකුණුම් මිල × ප්‍රමාණය	
තනි පාට තනි මදුරුදැල්	රු. 1,500.00 × 20	= රු. 30,000.00
තනි පාට ද්විත්ව මදුරුදැල්	රු. 2,500.00 × 30	= රු. 75,000.00
විවිධ රටා සහ විවිධ පාට මිශ්‍ර මදුරුදැල්	රු. 2,550.00 × 10	= රු. 25,500.00
මේ අනුව මාසික මුළු විකුණුම් ආදායම		= රු. 130,500.00

මසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම+ සෘජු වෙනත් වියදම
මාසික සෘජු පිරිවැය = රු. 78,600.00 + රු. 25,000.00 + රු. 3,000.00
= රු. 106,600.00

වක්‍ර පිරිවැය
ව්‍යාපාරය පවත්වාගෙන යෑම සඳහා දරණ වියදම් වේ. (ජලය, විදුලිය, ප්‍රවාහන, ක්ෂය සහ අලෙවි ප්‍රවර්ධන) ආදී අනෙකුත් වියදම් වේ. එය මාසයක් සඳහා රු. 10,000.00 ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 130,500.00- (රු. 106,600.00 + රු. 10,000.00)
= රු. 130,500.00- (රු. 116,600.00)
= රු. 13,900.00

ව්‍යාපාරිකයා විසින් ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට රු. 25,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, රු. 13,900.00 ක ශුද්ධ ලාභයක් උපයාගත හැකිය.

විවාහ මංගල උත්සව සේවා

1. හැඳින්වීම

විවාහ මංගල උත්සවයක් යනු විවාහ දිවියට පත් වීමට අපේක්ෂිත නව යුවලගේ ජීවිතයේ ඉතාමත් වටිනා අවස්ථාවකි. එබැවින් එම අවස්ථාව ආකර්ෂණීය හා වඩා සුන්දර උත්සවයක් බවට පත් කරගැනීමට ඔවුන් සියලු දෙනා උත්සහ දරයි. එමෙන්ම වර්තමානයේ 99% ක් පමණ විවාහ මංගල උත්සව සඳහා උත්සව ශාලා තෝරා ගනු ලබන අතර, එහිදී අවශ්‍ය වන මංගල පෝරුව, සෙට් බැක්, කිරි කල 7 හෝ Dry Ice, සඝ්‍රික මේසය, නැටුම් කණ්ඩායම්, බෙරවාදන ශිල්පීන්, ජයමංගල ගාථා, අශ්ඨක කියන පුද්ගලයින්, පිවිසුම් දොරටු අලංකරණය අත්‍යාවශ්‍ය අංගයන් බවට පත්ව ඇත.

වර්තමානයේ පවතින කාර්ය බහුල ජීවිතයත් සමග මෙම සියලු සේවාවන් එකම ආයතනයකින් ලබා ගැනීමට විවාහ අපේක්ෂකයින් කැමැත්තක් දක්වන අතර, වර්තමානයේ හා අනාගතයේ ද ලංකාව පුරාම මේ සඳහා ඉහළ ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතී.

2. අවශ්‍ය අමු ද්‍රව්‍ය

මිලදී ගත යුතු අමුද්‍රව්‍ය හා සේවාවන්

- ප්‍රෙෂ් මල්
- ධාන්‍ය වර්ග
- Dry Ice හෝ කිරි
- බෙර කරුවන්
- නැටුම් කණ්ඩායම්
- ජයමංගල ගාථා කීමට පිරිස
- කේක් බඩු
- වෙනත් (පොල් තෙල්, පහන් තිර, කපුරු ආදිය)

3. වෙළඳපොල

ලංකාව පුරා සිටින බෞද්ධ ජනතාව මංගල උත්සව අවස්ථාවන්හි දී පෝරුවේ චාරිත්‍ර ඇතුලු අනෙකුත් සංස්කෘතික අංගයන් උත්සවය අලංකාර කිරීම සඳහාත්, පාරම්පරික විශ්වාසයන් ඉටුකිරීම සඳහාත් යොදා ගැනීමට පෙළඹේ. එමෙන්ම පහළ, මධ්‍යම සහ ඉහළ ආදායම් ලබන පිරිස් එකිනෙකාගේ මිලදී ගැනීමේ හැකියාව මත මෙම සංස්කෘතික අංගයන් අඩු වැඩි වශයෙන් යොදාගනී. එමනිසා මිල මට්ටම් කිහිපයක් යටතේ විවිධ පැකේජ ආකාරයෙන් අලෙවි කිරීමේ හැකියාව ඇත. සුපිරි හෝටල් වල විවාහ මංගල උත්සව පවත්වන ඉහළ පාන්තිකයින්ට ඉතා ඉහළ මිළක් යටතේ මෙම සේවාව අලෙවි කල හැකි අතර, පහළ හා මධ්‍යම පාන්තිකයින්ට ඔවුන්ගේ මූල්‍ය හැකියාව අනුව අඩු මිලකට සේවාවන් ලබා දිය හැකිය. එබැවින් විවාහ මංගල අවස්ථාවන්ට සේවාවන් සැපයීම සඳහා හොඳ වෙළඳපොල අවස්ථාවක් නිර්මාණය වී ඇත.

4. ආයෝජනය

සෑම මසකම ඒකාකාරී ස්වරූපයෙන් ආදායම් නොලබන ව්‍යාපාරයක් නිසා නැකැත් අඩු මාස 04 හි මසකට 01ක් සේවාවක් බැගින් සපයන ආකාරයටත්, අනෙක් මාස 8 හි මසකට මංගල උත්සව අවස්ථා 4ක් බැගින් සේවා සපයන ආකාරයටත් ඇස්තමේන්තු කර ඇති අතර, ඒ අනුව ආයෝජනය කලයුතු අවම මුදල පහත පරිදි වේ.

4.1	මූලික ස්ථාවර ප්‍රග්ධනය	- රු. 536,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	- රු. 45,000.00
	එකතුව	- **රු. 581,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මංගල උත්සව අවස්ථාවන් සඳහා අවශ්‍ය සියලුම සේවාවන් එකම ස්ථානයකින් සැපයීම සඳහා අවශ්‍ය අවම උපකරණ සපයා ගැනීමට අවශ්‍ය මුදල ඇස්තමේන්තු කර ඇත. උපකරණ ගබඩා කිරීම සඳහා ස්ථානයක් අවශ්‍ය වන අතර, ඒ සඳහා වියදම් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
1	කිරි කළ / Dry Ice සඳහා කළ හා යකඩ සැලැස්ම	6,000.00
2	කේක් ආකෘතිය	5,000.00
3	සෙට් බැක් (යකඩ හෝ ලී වලින් 02)	200,000.00
4	පෝරුව (ලී වලින් / යකඩ වලින් 02)	150,000.00
5	විවිධ වර්ගයේ කෘතීම මල් සැරසිලි	100,000.00
6	පහන සඳහා	10,000.00
7	පිවිසුම් දොරටු අලංකරණ තොරණ	50,000.00
8	මංගල රථය සැරසිලි සඳහා කෘතීම මල් පොකුරු	10,000.00
9	සශ්‍රීක මේසය සඳහා අවශ්‍ය උපකරණ	5,000.00
	එකතුව	536,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (එක් අවස්ථාවක් සඳහා)

අංක	විස්තරය	වටිනාකම (රු.)
1	පෝරුවේ චාරිත්‍ර සහ අශ්ධක කීම සඳහා	7,000.00
2	ජයමංගල ගාථා කීම සඳහා	3,000.00
3	පිවිසුම් දොරටු අලංකරණය	3,000.00
4	සශ්‍රීක මේසය පිළියෙල කිරීම සඳහා (ධාන්‍ය වර්ග)	3,000.00
5	සෙට් බැක් සැරසීම සඳහා	3,000.00
6	බෙරකරුවන් සඳහා	8,000.00
7	නැටුම් කණ්ඩායම් සඳහා	8,000.00
8	පහන සැරසීම සඳහා (ප්‍රෙෂ් මල් සහ අනෙකුත් ද්‍රව්‍ය)	1,000.00
9	කේක් ආකෘති සැකසීම සඳහා	3,000.00
10	කිරි / Dry Ice සඳහා	2,000.00
11	පෝරුව සැරසීම සඳහා	2,000.00
12	ශ්‍රමය සඳහා	2,000.00
	එකතුව	45,000.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

i. මංගල අවස්ථාවන් සඳහා පෝරුවේ චාරිත්‍ර ඇතුලු අනෙකුත් සේවාවන් එකම ස්ථානයකින් රු. 100,000.00 ක මිලට ලබා ගන්නා බවත්,

ii. නැකැත් අඩු මාස 04 හි මංගල උත්සව 04 ක් ද ඉතිරි මාස 08 එක් මාසයක් තුළ මංගල උත්සව අවස්ථා 04 බැගින් සේවා සපයන බවත්,

iii. මංගල උත්සව පැවැත්වීම සඳහා සුදුසු සාමාන්‍ය වාතාවරණයක් පවතින බවත් උපකල්පනය කර ඇත.

වාර්ෂික විකුණුම් ආදායම = එක් උත්සව අවස්ථාවක ආදායම × උත්සව අවස්ථා සංඛ්‍යාව
(කෝණා මාස වල උත්සව 04යි. අනෙක් මාස වල 04 බැගින් 32 යි)
= රු. 100,000.00 × 36
= රු. 3,600,000.00

වාර්ෂික මුලූ පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමු ද්‍රව්‍ය හා ලබා ගන්නා සේවා + සෘජු ශ්‍රමය + සෘජු වෙනත්
= රු. 29,000.00 + රු. 2,000.00 + රු. 14,000.00
= රු. 45,000.00 × උත්සව අවස්ථා 36
= රු. 1,620,000.00

වක්‍ර පිරිවැය

උපකරණ අලුත්වැඩියාව සහ ප්‍රවාහණය සඳහා මසකට රු. 10,000.00ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

වාර්ෂික ශුද්ධ ලාභය = වාර්ෂික විකුණුම් ආදායම - වාර්ෂික පිරිවැය
= රු. 3,600,000.00 - (රු. 1,620,000.00 + රු. 120,000.00)
= රු. 3,600,000.00 - රු. 1,740,000.00
= රු. 1,860,000.00

ව්‍යාපාරිකයාට රු. 1860,000.00 ක වාර්ෂික ශුද්ධ ලාභයක් ලැබෙන අතර එය මාසික සාමාන්‍යයක් ලෙස ගණනය කල විට රු. 155,000.00 කි. ඊට අමතරව සේවාව තමන් විසින්ම සපයයි නම් සේවා සපයන මසකට සාමාන්‍ය ශ්‍රම වැටුප වන රු. 6000.00 ද ඔහුට හිමි වේ.

සර්ෆින් ඉගැන්වීම සහ සර්ෆින් බෝඩ් බදු දීම

1. හැඳින්වීම

සර්ෆින් නොහොත් රළ මත ලිස්සායාම යනු වර්තමානය වන විට බෙහෙවින් ප්‍රචලිත ක්‍රීඩාවකි. ලංකාව වටා තිබෙන රමණීය මුහුදු තීරය හේතු කොටගෙන විදෙස් සංචාරකයන් මෙහි පැමිණීමට වඩාත් ප්‍රියතාවයක් දක්වයි. මෙලෙස ලංකාවට පැමිණෙන සංචාරකයන් සර්ෆින් කිරීමට වැඩි කැමැත්තක් දක්වන අතර, ලංකාවේ වෙරළ බඩ ප්‍රදේශයේ සර්ෆින් සම්බන්ධ විවිධ ව්‍යාපාර අවස්ථා වර්ධනය වෙමින් පවතී. මෙම ව්‍යාපාර අවස්ථා අතුරින් සර්ෆින් ඉගැන්වීම සහ සර්ෆින් බෝඩ් බදු දීම වඩා ප්‍රචලිතව ඇත. සර්ෆින් ඉගැන්වීම ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමේදි ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා ජාත්‍යන්තර සර්ෆින් සංගමයේ (ISA) සහතිකය ලබා ගත යුතුය. සර්ෆින් ඉගැන්වීම සඳහා soft surfing board යොදා ගනු ලැබේ. සර්ෆින් බෝඩ් බදු දීමේදී දෙපාර්ශවය අතර අනිවාර්යයෙන්ම ගිවිසුමකට එළඹිය යුතු අතර, ඒ තුළින් සර්ෆින් බෝඩ් සඳහා වන හානි, පලුදුවීම් සඳහා දඩ මුදලක් අය කර ගැනීමේ හැකියාව පවතී.

2. අමුද්‍රව්‍ය

සර්ෆින් බෝඩ්

3. වෙළඳපොළ

සර්ෆින් ක්‍රීඩාව ප්‍රථමයෙන් විදේශීය සංචාරකයන් මුල් කරගෙන වෙරළ ආශ්‍රිත ප්‍රදේශ වල ව්‍යාප්ත වුවද වර්තමානය වන විට දේශීය සංචාරකයන්ද සර්ෆින් ක්‍රීඩාව සඳහා වැඩි නැඹුරුවක් දක්නට ලැබේ. සර්ෆින් ක්‍රීඩාව සඳහා වසරේ සෑම දිනකම ඉල්ලුමක් පවතින අතර, තරුණ හා වැඩිහිටියන් අතර ප්‍රචලිත ක්‍රීඩාවක් ලෙස දැක්විය හැකිය. ඉහළ සහ මධ්‍යම ආදායම් කාණ්ඩය ඉලක්ක කරගෙන වෙරළ ආශ්‍රිතව (ආරුගම් බොක්ක, මාතර, ගාල්ල, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක ආශ්‍රිතව) වඩාත් සාර්ථකව මෙම ව්‍යාපාරික අදහස ක්‍රියාත්මක කළ හැකිය.

4. ආයෝජනය

දිනකට සර්ෆින් බෝඩ් බදු දීම පැය 15ක් සහ සර්ෆින් ඉගැන්වීම පැය 6ක් සිදුකරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 686,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	= රු. 80,500.00
	මුළු එකතුව	= **රු. 766,500.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර, ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

සර්ෆින් ඉගැන්වීම සහ සර්ෆින් බෝඩ් බදුදීම සඳහා අවම වශයෙන් සර්ෆින් බෝඩ් 10ක් වත් අවශ්‍ය වේ.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	ඒකක ප්‍රමාණය	ඒකකයක මිල	මුළු වටිනාකම (රු.)
1	7'×3' සර්ෆින් බෝර්ඩ්	2	50,000	100,000.00
2	8'×3' සර්ෆින් බෝර්ඩ්	2	60,000	120,000.00
3	8'×6' සර්ෆින් බෝර්ඩ්	4	65,000	260,000.00
4	9'×9' සර්ෆින් බෝර්ඩ්	2	70,000	140,000.00
5	සන් බෙඩ්	6	10,000	60,000.00
6	රෂ් ගාඩ්	6	1,000	6,000.00
	එකතුව			686,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට සර්ෆින් බෝඩ් බදුදීම පැය 15ක් සහ සර්ෆින් ඉගැන්වීම පැය 6ක් සිදුකරන කරන අතර සතියේ දින 7 තුලම සර්ෆින් බෝඩ් බදුදීම හා ඉගැන්වීම සිදු කරනු ලැබේ.

සර්ෆින් බෝඩ් එකක් පැයකට රු. 250.00 ක මුදලකට ලබා දෙනු ලැබේ.

සර්ෆින් ඉගැන්වීම සඳහා පැයකට රු.2500.00ක මුදලක් අය කරනු ලබන අතර එම සර්ෆින් ඉගැන්වීම් කටයුතු සිදුකරන පුද්ගලයා හට එම මුදලින් 50%ක් ගෙවිය යුතුය.

5. මාසික ශුද්ධ ලාභය

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු)
1	වැක්ස්	1,000.00	7,000.00
2	ශ්‍රම වියදම - සර්ෆින් ඉගැන්වීම සඳහා (පැය 6 × රු. 1,250.00)	7,500.00	52,500.00
3	ශ්‍රම වියදම (සර්ෆින් බදුදීම)	2,000.00	14,000.00
4	වෙනත් වියදම්	1,000.00	7,000.00
	එකතුව	11,500.00	80,500.00

මෙම ව්‍යාපාරය සෑම දිනකම ව්‍යාපාර කටයුතු සිදුකරන අතර එක් දිනකදී සර්ෆින් බෝඩ් බදුදීම දිනකට පැය 15ක් සහ සර්ෆින් ඉගැන්වීම දිනකට පැය 6ක් සිදුකරන බව උපකල්පනය කර ඇත.

දේශීය හා විදේශීය සංචාරකයන් මගින් මෙම ඉල්ලුම නොවෙනස්ව පවතින බවද උපකල්පනය කර ඇත.

සර්ෆින් බෝඩ් බදුදීමේ මාසික ආදායම

මාසික විකුණුම් ආදායම (දින 30 × දිනක බදුදෙන වාර ගනන 15 × රු. 250) = රු. 112500.00

සර්ෆින් ඉගැන්වීමේ මාසික ආදායම

මාසික විකුණුම් ආදායම (දින 30 ×දිනක ඉගැන්වීම සිදුකරන වාර ගනන 6 × රු. 2500) = රු.450,000.00

මුළු මාසික විකුණුම් ආදායම = රු. 112,500.00 + රු. 450,000.00
= රු. 562,500.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
දිනක සෘජු පිරිවැය = රු. 1000 + රු. 9500 + රු. 1000
= රු. 11500 × දින 30
= රු. 345,000.00

වකු පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ (ජල, විදුලි, ප්‍රවාහන, අලෙවි ප්‍රවර්ධන ආදි අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 30,000 ක් ලෙස ඇස්ථමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 562,500 - (රු. 345,000 + රු. 30,000)
= රු. 562,500 - රු. 375,000
= රු. 187,500

ව්‍යාපාරිකයා විසින්ම සර්ෆින් බෝඩ් බදුදීම කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 247500ක ආදායමක් උපයාගත හැකිය. (ශ්‍රම වැටුප රු. 60,000.00 + ශුද්ධ ලාභය රු. 187,500.00)

සර්ෆින් ඉගැන්වීම් කටයුතු සදහා වෙනත් අයෙකු සම්බන්ධ කර ගත යුතුය.

ලුහු ඉංජිනේරු කර්මාන්ත

1. හැඳින්වීම

ලුහු ඉංජිනේරු කර්මාන්තය ජන ජීවිතය හා තදින් බැඳුණු අතීතය තෙක් දිවයන කර්මාන්තයකි. 18 වන සියවසේ ඇති වූ කාර්මික විප්ලවයත් සමඟ ම ලුහු ඉංජිනේරු කර්මාන්තය තුළ ද සීඝ්‍ර දියුණුවක් දැකිය හැකි විය. එදිනෙදා ජීවිතය හා බැඳුණු සාමාන්‍ය ක්‍රියාකාරකම් සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපකරණ නිපදවීමත්, විවිධ වූ කර්මාන්තයන්ට පාදක කර්මාන්තයක් වීම නිසාත් ලුහු ඉංජිනේරු කර්මාන්තයට සුවිශේෂී ස්ථානයක් ලැබී තිබේ. ග්‍රාමීය වශයෙන් කම්මල් ආශ්‍රිතව සිදු කරන ලද ලුහු ඉංජිනේරු කර්මාන්තය තුළින් ප්‍රධාන වශයෙන් ගෘහාශ්‍රිත කටයුතු සඳහා අවශ්‍ය පිහි, කැති, පොරෝ, දෑකැති ආදී උපකරණ ද, කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය වන විවිධ උපකරණ ද නිපද වූ අතර ඒ සඳහා වැඩි ඉල්ලුමක් ගොඩනැඟී තිබුණි. ඕනෑම ප්‍රදේශයක් තුළ සෑම ජන කොට්ඨාසයකටම අවශ්‍ය උපකරණ නිපදවීමත්, අඩු මුදලක් ආයෝජනයෙන් ඕනෑම ස්ථානයක ආරම්භ කළ හැකි ව්‍යාපාරයක් වීම නිසාත් මෙය ගෘහස්ත වශයෙන් ලාභදායී ආදායමක් ලබාගත හැකි ව්‍යාපාර අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

වානේ
ඇණ
පොල්තෙල්
ලී මිටි

3. වෙළඳපල

දෛනික ක්‍රියාකාරකම් සඳහා සෑම නිවසකටම අත්‍යාවශ්‍ය උපකරණ ලුහු ඉංජිනේරු කර්මාන්තය තුළින් නිපදවන බැවින් සෑම නිවසකටම පොදුවේ අලෙවිය සඳහා ඉලක්ක කරගත හැකිය. ගෘහාශ්‍රිතව අත්‍යාවශ්‍ය උපකරණ වීම නිසා මිල දී ගැනීමේ දී පුද්ගල ආදායම් විචල්‍යතාවය බල නොපාන අතර සෑම ආදායම් මට්ටමකම පාරිභෝගිකයන් ඉලක්ක කරගත හැකිය. ශ්‍රී ලංකාවේ වැඩි පිරිසකගේ ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීමත්, ඒ සඳහා ප්‍රයෝජනයට ගන්නා ආම්පන්න ලුහු ඉංජිනේරු කර්මාන්තය තුළින් නිපදවීම නිසා කෘෂිකර්මාන්තයේ නියැලෙන පිරිස් අතර වැඩි ඉල්ලුමක් නිරන්තරයෙන්ම පවතී. නිෂ්පාදනවල මිල ගණන් ද සාමාන්‍ය මට්ටමක පවතින අතර ඒ සෑම ආදායම් මට්ටමක ජනතාවට දරාගත හැකිය. ග්‍රාමීය වශයෙන් මෙන්ම නාගරික වෙළඳපොල තුළ ලුහු ඉංජිනේරු නිෂ්පාදනයන් අලෙවිය සිදු කරගත හැකි අතර ක්ෂයවීම් අළුත්වැඩියා කිරීම ආදිය දේශීයව සිදු කරගත හැකි නිසා මේවාට වැඩි ඉල්ලුමක් පවතී.

4. ආයෝජනය

මසකට මන්න 100ක්, මාළු කපන පිහි 100ක්, දෑකැති 30ක්, වළලු කපන පිහි 200ක්, පොරව 10ක්, නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා ආයෝජනය කළ ඇස්මේන්තුගත මුදල

4.1	ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 86,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	= රු. 206,210.00
	මුළු එකතුව	= **රු. 292,210.00**

4.1 ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

අත්‍යාවශ්‍ය අයිතම සඳහා පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	යන්ත්‍රසූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
01	දඬු අඬුව	12,000.00
02	බෙඩ් ග්‍රයින්ඩර්	15,000.00
03	හෑන්ඩ් ග්‍රයින්ඩර්	10,000.00
04	හෑන්ඩ් ඩ්‍රිල්	8,000.00
05	බ්ලෝවර්	10,000.00
06	කිණිහිර	25,000.00
07	රාත්තල් 4 මිටිය	2,000.00
08	අනෙකුත් උපකරණ (අඬුව, කටුව)	4,000.00
	මුළු එකතුව	86,000.00

4.2 කාරක ප්‍රාග්ධනය පිරිවැය (මාසයක් සඳහා)

මසකට මන්න 100ක්, මාළු කපන පිහි 100ක්, දෑකැති 30ක්, වළලු කපන පිහි 200ක්, පොරව 10ක්, නිෂ්පාදනය කරනු ලබයි. මසකට දින 25ක් නිෂ්පාදකයා ව්‍යාපාරයේ යෙදේ.

අංකය	විස්තරය	මාසික වියදම (රු.)
01	අමුද්‍රව්‍ය සඳහා	84,060.00
02	ශ්‍රමය සඳහා (රු.1000 x දින 25)	25,000.00
03	වෙනත් වියදම්	1,000.00
	පොල්කටු අඟුරු	85,150.00
	ගෙන ඒමේ වියදම්	10,000.00
	විදුලිය	1,000.00
	මාසික සෘජු පිරිවැය	206,210.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මාසයකට දින 25ක් වැඩ කරන බවට උපකල්පනය කරයි. මසකට මන්න 100ක්, මාළු කපන පිහි 100ක්, දෑකැති 30ක්, වළලු කපන පිහි 200ක්, පොරව 10ක්, නිපදවා අලෙවි කිරීමට සැලසුම් කර ඇත. එක් එක් පිහි වර්ගයේ මිල ගණන් අනුව පහත පරිදි අලෙවි කළ හැකිය.

අංකය	නිෂ්පාදන වර්ගය	මසකට නිෂ්පාදන කරන ඒකක ගණන	ඒකකයක මිල (රු.)	විකුණුම් ආදායම (රු.)
01	පොරව	10	850.00	8,500.00
02	මන්න පිහි	100	850.00	85,000.00
03	මාළු කපන පිහි	100	800.00	80,000.00
04	දෑකැති	30	800.00	24,000.00
05	වළලු කපන පිහි	200	350.00	70,000.00
	මාසික විකුණුම් ආදායම			267,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා දරන වියදම් ය. (ක්ෂය, ප්‍රවාහන, ලිපිද්‍රව්‍ය, දුරකතන, වෙනත්) එය මාසයක් සඳහා රු. 30,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 206,210.00 + රු. 30,000.00
= රු. 236,210.00

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 267,500.00 - රු. 236,210.00
= රු. 31,290.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට ශ්‍රම වැටුප ලෙස රු. 25,000.00 හා ශුද්ධ ලාභය ලෙස රු. 31,290.00ක උපයාගත හැකිය.

වාහන පින්තාරු ව්‍යාපාරය

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දෛනික වාහන භාවිතය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී . විය කර්මාන්තයක් ලෙස වාහන පින්තාරු කර්මාන්තය සඳහා නව වෙළඳපොල ඉඩ ප්‍රස්ථාවක් ඇති කර තිබේ. එසේම වාහන ආනයනය සීමා කිරීම සඳහා රජය විසින් පියවර ගැනීම තුළ භාවිතයෙන් ඉවත්කොට ඇති වාහන ද පින්තාරු කොට අලුත්වැඩියා කිරීමෙන් පසු අළෙවි කිරීම නව ප්‍රවණතාවයක් බවට පත්ව තිබේ.

වාහන පින්තාරු කිරීම පිළිබඳ වෘත්තීය දැනුම සහිත වීම ව්‍යාපාරය ආරම්භ කිරීමට ශක්තියක් වන අතර වෘත්තිකයින්ගේ සේවය කුලී පදනම මත ලබාගෙන ද ව්‍යාපාරය ආරම්භ කළ හැකි ය. එසේම බොහෝ තාක්ෂණික ආයතන වලින් පිටවන පුහුණුලාභීන්ට ද ව්‍යාපාරයක් ලෙස වාහන පින්තාරු ව්‍යාපාරය ආරම්භ කළ හැකි ය.

විදුලිබලය සහිත ස්ථානයක් වීම අවශ්‍ය වන අතර සේවා ස්ථානයට වාහන ගැනීමට පහසු ස්ථානයක් වීම වැදගත් වේ. එසේම පරිසර බලපත්‍ර හා අනෙකුත් බලපත්‍ර ලබා ගැනීම ද ව්‍යාපාරය සඳහා අවශ්‍යතාවයක් වේ. මෙම කර්මාන්තයේ විශේෂත්වයක් වන්නේ සේවා සැපයීමට සිදුවන වාහනයේ කළයුතු කාර්යයන් අනුව ද, කාර්යයේ නිමාව ද මත අයකරනු ලබන මිල ගණන් වෙනස් වීමයි.

පුහුණු ශ්‍රමය ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන අතර විධිමත් ලෙස ඉගෙන ගැනීම තුළින් මෙන්ම කර්මාන්තයේ ඇති අත්දැකීම් හා පළපුරුද්ද තුළින් මෙම ව්‍යාපාරය මූලික මට්ටමේ ආරම්භ කළ හැකි වීම ව්‍යාපාරයේ පවතින වාසිදායක තත්වයක් වේ.

2. අමුද්‍රව්‍ය

කාබයිට්
ඔක්සිජන්
ඔක්සිජන් කූරු
වැලි කඩදාසි, තීන්ත
වෙනත් (සුළු වශයෙන් අවශ්‍ය වන ද්‍රව්‍ය)

3. වෙළඳපොල

භාවිතා කරන ලද වාහන වෙළඳපොල තරඟකාරී ලෙස ඉහළ යමින් පැවතීම වාහන පින්තාරු කර්මාන්තය ට හිතකර පරිසරයක් නිර්මාණය කර තිබේ. එම නිසා ම වෙළඳපොල ගැටලුකාරී නොවන අතර සේවාවේ නිමාව නව ඇණවුම් ලබා ගැනීම ට ඉතා වැදගත් වේ.

අයකරනු ලබන මිල හා සේවාවේ ගුණාත්මක භාවය මත ප්‍රවර්ධනය ද සිදුවන බැවින් වෙළඳපොල තුළ තරඟකාරිත්වයට පහසුවෙන් මුහුණදීමට හැකියාව ලැබේ. එසේම සේවා අවශ්‍යතාවය මත පාරිභෝගිකයින් තම ළඟම ස්ථානය තෝරා ගැනීමත් හා ග්‍රාමීය මට්ටමේ පුද්ගලික වාහන පරිභෝජනය ඉහළ යාමත් හේතුවෙන් ව්‍යාපාරයේ පැවැත්ම සඳහා වාසිදායක පරිසරයක් ගොඩනැංවී ඇත. එම නිසා වෙළඳපොල ගැටලු ඇතිවීම අවම මට්ටමක පවතී.

4. ආයෝජනය

උපකල්පන

- ඕනෑම වාහනයක් පින්තාරු කිරීමේ හැකියාව ඇත. මෙහිදී ත්‍රීවිල් රථ පමණක් පින්තාරු කරන්නේ යැයි උපකල්පනය කෙරේ.
- මාසික කුලී පදනම මත ස්ථානයක් යොදා ගන්නා බව.
- සහයක සේවකයෙකු යොදා ගන්නා බව.

මසකට ත්‍රී වීලර් පින්තාරු කිරීම් 03 ක් සඳහා දැරිය යුතු ඇස්තමේන්තු ගත අවම ආයෝජන මුදල පහත පරිදි වේ. (මෙහි දී ව්‍යාපාරික ස්ථානය සඳහා වියදම ඇස්තමේන්තු ගතකොට නැත.)

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 268,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	= රු. 147,000.00
	මුළු එකතුව	= **රු. 415,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහි දී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම හා ව්‍යාපාරික ස්ථානය කුලී පදනම මත පවත්වාගෙන යාමට අවශ්‍ය මාස 6 ක මූලික තැම්පත් මුදල් ද ඇතුළත් කර ඇත.

අංකය	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම රුපියල්
01	ඔක්සිජන් ටැංකිය	35,000.00
02	කාබයිට් ටැංකිය	15,000.00
03	ඔක්සිජන් ප්‍රෙෂර් මීටරය හා බට	11,000.00
04	ගෑස් ලාම්පුව	12,000.00
05	කොම්පෙෂර් යන්ත්‍රය	45,000.00
06	ස්ප්‍රේ ගන් හා බට	6,000.00
07	අනෙකුත් ආයුධ	54,000.00
	එකතුව	178,000.00
	ස්ථානය සඳහා මාස 6 කට තැම්පත් මුදල	90,000.00
	මුළු එකතුව	268,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මසක් සඳහා)

මසකට ත්‍රීවීලර් 03 ක් පින්තාරු කරනු ලබන බවට උපකල්පනය කෙරේ.

අංකය	විස්තරය	දිනක වියදම රු.	මසක වියදම රු.
01	අමුද්‍රව්‍ය සඳහා වියදම		66,000.00
02	ශ්‍රම වියදම (දිනකට)	3,000.00	75,000.00
03	වෙනත් වියදම(ඔක්සිජන්,විදුලිය,ජලය හා වෙනත්)		6,000.00
	එකතුව		147,000.00

5. මාසික ශුද්ධ ලාභය

මසකට දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන බව උපකල්පනය කර ඇත. එක් ත්‍රී වීලර් රථයක් පින්තාරු කිරීම සඳහා රු. 65,000.00 මුදලක් අය කරන්නේ නම් ත්‍රීවීලර් රථ03 ක් සඳහා මාසික විකුණුම් ආදායම රු. 195,000.00 කි. ඊට අමතරව වෙනත් සුළු පින්තාරු කාර්යයන් වලින් ලබන ආදායම රු. 20,000.00 ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = රු. 215,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය

මසක සෘජු පිරිවැය = රු. 66,000.00 + රු. 75,000.00 + රු. 6,000.00
= රු. 147,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ. (ගොඩනැගිලි කුලී, නඩත්තු හා අලුත්වැඩියාව, ක්ෂය, ප්‍රවාහන, ලිපිද්‍රව්‍ය, දුරකථන) එය මාසයක් සඳහා රු. 21,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 147,000.00 + රු. 21,000.00
= රු. 168,000.00

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 215,000.00 - රු. 168,000.00
= රු. 47,000.00

මෙම ව්‍යාපාරයේ පින්තාරු කාර්යය කරනු ලබන පුද්ගලයාගේ කුසලතාවය මත මසකට ලැබෙන ඇණවුම් ප්‍රමාණය හා අය කරනු ලබන ගාස්තුව තීරණය වේ. බාහිර සේවකයෙකු හට (සහයක සේවක හැර) ශ්‍රම වැටුප් ගෙවන්නේ නම් ඔහුට රු. 75,000.00ක් ගෙවන අතර ව්‍යාපාරිකයා විසින්ම ශ්‍රමය සපයන්නේ නම්, ඔහුට ශ්‍රම වැටුප ලෙස රු. 75,000.00 ක් හා ශුද්ධ ලාභය ලෙස රු. 47,000.00ක මුදලක් උපයා ගත හැකිය.

මැණික් ගල් කැපීම හා ඔප දැමීමේ සේවා

1. හැඳින්වීම

පතල් වලින් ලබාගත් මැණික් ගලට එහි සුන්දරත්වය හා වටිනාකම ලැබෙන්නේ ඒවා නිසි ලෙස කපා ඔප දැමූවිට පමණි. 1970 දශකයේ මුල් භාගය වන තෙක් හනපෝරුවා නම් සාම්ප්‍රදායික යන්ත්‍රයක් භාවිතයෙන් මැණික් කැපීම හා ඔප දැමීම සිදුකරන ලදී. මෙහිදී මැණික් ගල් කැපීම සඳහා ඉතා උසස් තත්වයේ පුහුණුවක් ලබා ගත යුතු අතර එම ව්‍යාපාරිකයාගේ පුහුණුව, හැකියාව හා පාරිභෝගික විශ්වාසය මත වෙළඳපොළ ඉල්ලුම තීරණය වේ.

මැණික් කර්මාන්තයේදී මූලිකවම සිදුවන්නේ ඉල්ලම් ගැරීමෙන් අගනා තත්වයක් ඇති ගල් වර්ග තෝරා ඒවා දීප්තිමත්ව ඔප දැමීම හා ඒවායේ ගුණාත්මක භාවය හා වටිනාකම අනුව වර්ග කිරීමයි. මෙලෙස වර්ග කළ මැණික් ගල් නිල්කැට, පද්මරාග, පුෂ්පරාග, රතුකැට, තෝරමල්ලි, වෛරොඩි ආදී විවිධ නම් වලින් හැඳින්වේ. ශ්‍රී ලංකාවෙන් හමුවන වටිනාම මැණික් වර්ග වන්නේ නිල් මැණික් හා පද්මරාග යන වර්ගය. ලංකාවෙන් හමුවන මැණික් වර්ග වටිනා මැණික් සහ අර්ධ වටිනා මැණික් යන වර්ග දෙකකට අයත් වේ. සාමාන්‍යයෙන් පතල් කර්මාන්තයේ යෙදෙන පතල්කරුවන් ඒවා හඳුන්වනු ලබන්නේ ජාති ගල් සහ පජාති ගල් ලෙසයි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- ලාකඩ පෙට්ටි
- පොලිෂින් වැක්ස්

3. වෙළඳපොළ

තරඟකාරී මිල ගණන් සහිතව උසස් තත්ත්වයේ කැපීම සහ ඔප දැමීමේ ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රසිද්ධ වී ඇති අතර තවමත් ලොව හොඳම සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස කීර්ති නාමයක් පවත්වාගෙන යයි. දේශීය මෙන්ම ගෝලීය මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳාම සමඟ ශ්‍රී ලංකාව දීර්ඝ කාලීන සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපාරයේ දී මධ්‍යම පරිමාණයෙන් සේවා සපයන ව්‍යාපාරවල උපකොන්ත්‍රාත් ලබාගෙන සහ මැණික් වෙළඳුන්ට සෘජුවද සේවාව සැපයිය හැකිවේ. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වශයෙන්ම මැණික් හමුවන දිස්ත්‍රික්කය රත්නපුර වන අතර එහි වැඩි වශයෙන් කුරුවිට, නිවිතිගල, පැල්මඩුල්ල, රක්වාන, ඇහැලියගොඩ, කිරිඇල්ල, බලංගොඩ නගරයන් ප්‍රධාන වේ.

4. ආයෝජනය

දිනකට වටිනා මැණික් (ජාති) ගල් කැරට් 8 ක් සහ අර්ධ වටිනා මැණික් (පජාති) ගල් කැරට් 6 ක් කපා ඔප දැමීම කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 93,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	= රු. 7,710.00
	මුළු එකතුව	= **රු. 100,710.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍යම අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
01	මැණික් කැපීමේ යන්ත්‍රය	65,000.00
02	පොලිෂින් ලැප්	10,000.00
03	600 කටින් ලැප්	1,000.00
04	හැන්ඩ් ලෙන්ස්	500.00
05	කැලිපර්	1,500.00
06	ෆෙස්ටර්	15,000.00
	එකතුව	93,000.00

4.2 කාරක ප්‍රාග්ධන වියදම

දිනකට වටිනා මැණික් ගල (ජාති) කැරට් 8 ක් සහ අර්ධ වටිනා මැණික්ගල් (පජාති) කැරට් 6 ක් කපා ඔප දැමීම කරන අතර සතියකට දින 6ක් සේවය කරනු ලැබේ. මෙහි ප්‍රායෝගික මිනුම් ඒකකය වන්නේ කැරට්ය.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක විදයම (රු.)
01	අමුද්‍රව්‍ය (ලාකඩ පෙට්ටි පොලිෂින් වැක්ස්)	220.00	1,320.00
02	ශ්‍රම වැටුප්	1,000.00	6,000.00
03	වෙනත්	65.00	390.00
	එකතුව	1,285.00	7,710.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මාසයකට දින 24 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන අතර එක් දිනක දී ජාති මැණික් ගල් කැරට් 8ක් සහ පජාති මැණික් ගල් කැරට් 6ක් කපා ඔප දැමීම සිදුකරන බවට ඇස්තමේන්තු කර ඇත.

ජාති මැණික් ගලක කැරට් එකක මිල රු. 250.00 ක් සහ පජාති මැණික් ගලක කැරට් එකක මිල රු. 150.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. එසේම ගලෙහි විකුණුම් මිල තීරණය කරනු ලබන්නේ එහි මෝස්තරය හා ප්‍රමාණය මතය.

මාසික විකුණුම් ආදායම = (8× 250× 24) + (6× 150× 24)
= රු. 69,600.00

වාර්ෂික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම

මාසික සෘජු පිරිවැය = (රු. 220.00 + රු. 1,000.00 + රු. 65.00) × දින 24
= රු. 30,840.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරනු ලබන අනෙකුත් වියදම් වේ. (විදුලිය, ප්‍රවාහනය, අලෙවි වියදම් හා ක්ෂය වියදම් ආදී) වය මාසයක් සඳහා රු. 5,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 69,600.00 - (රු.30,840.00 + රු. 5,000)
= රු. 33,760.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 24,000.00 ක වැටුපක් වෙන් කර ගත හැකි අතර ශුද්ධ ලාභය ලෙස රුපියල් 33,760.00 ක් උපයාගත හැකිය.

පල්ප් ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන

1. හැඳින්වීම

විවිධ වූ විසිතුරු නිෂ්පාදන අතර පල්ප් ආශ්‍රිත නිෂ්පාදන වලට කලාත්මක වශයෙන් මෙන්ම පරිසර හිතකාමීභාවය අතින්ද හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ශිල්පියාගේ කලාත්මක දක්ෂතාවය මත ඉතාමත් නිර්මාණාත්මක නිෂ්පාදනයන් සිදු කිරීමේ හැකියාව ඇත. වර්තමානයේ ප්ලාස්ටික් විසිතුරු නිර්මාණ මෙන්ම සෙල්ලම් සතුන් වැනි දේ වෙනුවට මෙම පල්ප් ආශ්‍රිත ගුණාත්මක නිර්මාණ වෙළඳපොලට හඳුන්වාදීම ඉතා වැදගත් වේ. එමෙන්ම ඉවතලන පත්තර වැනි දෑ සඳහා ආර්ථිකමය වටිනාකමක් ලබාදීමට ද මේ තුළින් හැකියාව ලැබේ.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

පත්තර
රෙපිෆෝම්
බයින්ඩර් ගම්/එපිෆික්ස් ගම්
සිමෙන්ති
පොටි
පිලර්
තීන්ත

3. වෙළඳපොල

කලාත්මක පල්ප් ආශ්‍රිත නිර්මාණ සංචාරක ව්‍යාපාරය තුළ සුවිශේෂී ස්ථානයක් හිමි කරගන්නා අතර, සංචාරක ව්‍යාපාරය වැඩි වශයෙන් පවතින මහනුවර, ගාල්ල, අනුරාධපුර, පොලොන්නරුව, පින්නවල වැනි ප්‍රදේශ වල මෙම නිර්මාණ සඳහා වැඩි ඉල්ලුමක් පවතී. එමෙන්ම දේශීයත්වය පිළිඹිබුවන හස්තීන් වැනි නිර්මාණ සඳහා විදේශිකයින්ගේ වැඩි ඉල්ලුමක් ඇති අතර, දේශීය සංචාරකයින්ගේද මෙම විසිතුරු නිර්මාණ සඳහා ඉල්ලුමක් ඇත. හෝටල් ක්ෂේත්‍රය තුළ ද පල්ප් නිර්මාණ සඳහා වැඩි වෙළඳපොල අවස්ථාවන් උදා වී ඇත. නිෂ්පාදනවල ගුණාත්මක සහ කලාත්මකභාවය මත අපනයන වෙළඳපොලටද අවතීර්ණ වීමේ හැකියාව පවතී.

4. ආයෝජනය

සතියකට එක් නිෂ්පාදන ක්‍රියාවලියක් තුළ පල්ප් හස්තීන් 10 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 23,100.00
කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	= රු. 6,700.00
මුළු එකතුව	= **රු. 29,800.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භකිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	වායු පීඩන යන්ත්‍රය	15,000.00
02	ඇඹරුම් යන්ත්‍රය	3,500.00
03	ස්ප්‍රේ ගන්	2,500.00
04	පින්සල්	1,500.00
05	හයිබ්‍රිඩ් පේපර් කටර් 2 ක්	600.00
	එකතුව	23,100.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

සතියකට පල්ප් හස්තීන් 10 ක් නිෂ්පාදනය කරන ආකාරයට සහ සතියකට දින 04 ක් නිෂ්පාදන කටයුතුවල නිරත වන අකාරයට ගණනය කිරීම් සිදුකර ඇත.

අංක	විස්තරය සතියක	වියදම (රු.)
01	අමුද්‍රව්‍ය සඳහා වියදම	2,500.00
02	ශ්‍රම වියදම	4,000.00
03	සෘජු වෙනත් වියදම	200.00
	එකතුව	6,700.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය සතියකට දින 04 බැගින් මසකට දින 16 ක් නිෂ්පාදන කටයුතු සිදු කරන අතර සතියකදී පල්ප හස්තීන් 10 ක් නිෂ්පාදනය සිදු කරන බවට උපකල්පනය කර ඇත.

අඩි 1/2 ක පල්ප් හස්තියෙකුගේ විකුණුම් මිල රු. 1,200.00 ක්ද අඩි 1 පල්ප් හස්තියෙකුගේ විකුණුම් මිල රු. 2,000.00 ක් ද වේ.

ඒ අනුව,

මාසික විකුණුම් ආදායම අඩි 1/2 පල්ප් හස්තීන් සඳහා = (සතියට 5 × සති 4 × රු.1,200.00)
= රු. 24,000.00

මාසික විකුණුම් ආදායම අඩි 1 පල්ප් හස්තීන් සඳහා = (සතියට 5 × සති 4 × රු.2,000.00)
= රු. 40,000.00

මුළු මාසික විකුණුම් ආදායම = රු.64,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමු ද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්
සතියක සෘජු පිරිවැය = රු. 2,500.00 + රු. 4,000.00 + රු. 200.00
= රු. 6,700.00 × සති 04
= රු. 26,800.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජලය, විදුලි, ප්‍රවාහන, අලෙවිය, බෙදාහැරීම් හා වෙනත් වියදම්). එය මාසයක් සඳහා රු. 7,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම – මාසික මුළු පිරිවැය
= රු. 64,000.00 - (රු. 26,800.00 + රු. 7,000.00)
= රු. 64,000.00- රු. 33,800.00
= රු. 30,200.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරන්නේ නම් ඔහුට මාසයකට රු. 16,000.00 ක ශ්‍රම වැටුප ක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 30,200.00 ක් උපයාගත හැකිය.

Soft Toys
මෘදු සෙල්ලම් බඩු නිෂ්පාදනය

1. හැඳින්වීම

මෘදු සෙල්ලම් බඩු නිෂ්පාදනය දේශීයව මෙන්ම විදේශීයව ද හොඳ ඉල්ලුමක් පවතින ව්‍යාපාරයකි. ඕනෑම පුද්ගලයෙකුට සුළු වශයෙන් ආරම්භ කර මහා පරිමාණ ව්‍යාපාරයක් දක්වා වර්ධනය කිරීමේ හැකියාව ඇති නමුත්, මෙම ව්‍යාපාරයේ නියැලෙන්නන් ප්‍රමාණය සීමිතය. වයස් භේදයකින් හෝ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව මෙම ව්‍යාපාරයේ නියැලිය හැකි අතර, මෙහිදී සෞඛ්‍යාරක්ෂිත අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. මෘදු සෙල්ලම් බඩු නිෂ්පාදනය යටතේ බෝනික්කන්, ටෙඩි බෙයාර්, විවිධ සත්ත්ව අනුරූ සහ කාටූන් චරිත නිර්මාණය කිරීමේ හැකියාවක් පවතී.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- රෙදි වර්ග - බෝවා, වෙල්බෝවා, ෆෙල්ට්
- පිරවුම් ද්‍රව්‍ය - රෙදි කැබලි, පැඩින්
- වෙනත් - ඇස්, නාස්,නූල්, විවිධ ප්‍රමාණයේ ඉදිකටු, වූල්, රෙදි අලවන ගම්, පබළු, කැරලි නූල්

3. වෙළඳපොල

මෘදු සෙල්ලම් බඩු නිෂ්පාදන කුඩා දරුවන් මෙන්ම තරුණ තරුණියන් අතර තෑගි භාණ්ඩ ලෙස වැඩි ඉල්ලුමක් මෙන්ම ජනප්‍රියතාවයක් පවතින නිෂ්පාදනයකි. නිෂ්පාදකයාගේ හැකියාව සහ නිර්මාණශීලීත්වය මත නිපදවිය හැකි නිර්මාණ අසීමිතය. දිනෙන් දින නව්‍යකරණය වන වෙළඳපොල තුළ කුඩා දරුවන් ඉලක්ක කර ගැනීමත්, පරිසර හිතකාමී සහ සෞඛ්‍යාරක්ෂිත අමුද්‍රව්‍ය භාවිතා කර නිෂ්පාදන කටයුතු සිදු කිරීමත් තුළින් පුළුල් වෙළඳපොලක් නිර්මාණය කර ගැනීමේ හැකියාව පවතී.

4. ආයෝජනය

දිනකට මෘදු සෙල්ලම් බඩු ඒකක 8 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 53,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	= රු. 11,000.00
මුළු එකතුව	= **රු. 64,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා පිරිවැයක් ඇස්තමේන්තු කර නැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	මහන මැෂින්	45,000.00
02	අනෙකුත් උපකරණ (කතුරු, නූල්, ගම් තුවක්කු : Glue Gun), ඉදිකටු ආදිය)	8,000.00
	එකතුව	53,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට මෘදු සෙල්ලම් බඩු ඒකක 8 ක් නිෂ්පාදනය කරන අතර සතියට දින 05 ක් නිෂ්පාදනයෙහි නිරත වේ.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු.)
01	අමුද්‍රව්‍ය සඳහා වියදම	900.00	4,500.00
02	ශ්‍රම වියදම	1,000.00	5,000.00
03	සෘජු වෙනත් වියදම	300.00	1,500.00
	එකතුව	2,200.00	11,000.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට දින 20 ක් නිෂ්පාදන කටයුතු සිදු කරන බවට සහ දිනකට මෘදු සෙල්ලම් බඩු ඒකක 8 ක් නිෂ්පාදනය කරන බවට උපකල්පනය කර ඇත. මෘදු සෙල්ලම් බඩු එකක මිල රු. 400.00 ක් වේ.

මාසික විකුණුම් ආදායම = (දින 20 × දිනක නිෂ්පාදනය ඒකක 8 × රු. 400.00) = රු. 64,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම

දිනක සෘජු පිරිවැය = රු. 900.00 + රු. 1,000.00 + රු. 300.00
= රු. 2,200.00 × දින 20
= රු. 44,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. (විදුලිය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 2,500.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 64,000.00 - (රු. 44,000.00 + රු. 2,500.00)
= රු. 64,000.00 - රු. 46,500.00
= රු. 17,500.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 20,000.00ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 17,500.00 ක් උපයාගත හැකිය.

බාබර් සාප්පු ව්‍යාපාරය

1. හැඳින්වීම

බාබර් සාප්පු යනු ඉතා දීර්ඝ ඉතිහාසයක් පවතින හා ක්‍රමිකව විකාශනය වෙමින් පවතින සේවා ව්‍යාපාරයක් ලෙස හැඳින්විය හැක. වර්තමානයේ දී රූපලාවන්‍යාගාර (සැලෝන්) වඩා ප්‍රචලිත වුවද තවමත් බාබර් සාප්පු ක්‍රියාත්මක වෙමින් පවතී. මෙය සැලොන් ව්‍යාපාර වලට සාපේක්ෂව අඩු ආයොජනයකින් ආරම්භ කළ හැකි ව්‍යාපාරයක් වේ. එමෙන්ම පුරුෂ පාර්ශවයට හා ළමයින්ගේ කොණ්ඩා කැපීම සඳහා අත්‍යාවශ්‍ය සේවාවක් වන බැවින් මෙම බාබර් සාප්පු සුළු පරිමාණව ආරම්භ කර වැඩි දියුණුකර ගත හැකි ව්‍යාපාර අවස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකි වේ.

2. මූලික අවශ්‍යතා

පුහුණුව

කරණවෑමියෙකු වීමට අවශ්‍ය පුහුණුව, වෘත්තීය පුහුණු අධිකාරිය වැනි රජයේ ආයතන මඟින් හෝ වෙනත් පෞද්ගලික ආයතන මඟින් පහසුවෙන් ලබාගත හැක. මෙම වෘත්තීය සහතික පත්‍ර පාඨමාලා හැදෑරීම සඳහා මාස හයක පමණ කාලයක් ගත වේ. කාර්යයේ යෙදීමෙන් ලබන පළපුරුද්ද මෙහිදී වැදගත් සාධකයක් වේ.

උපකරණ

දැලි පිහිය, කතුරු, පනා, කන්ණාඩි, හිසකෙස් වියලන යන්ත්‍ර, වතුර විදිනය සහ කොණ්ඩා කපන යන්ත්‍රය (ක්ලිපර්) වැනි පහසු මිලට සපයා ගත හැකි යන්ත්‍ර හා උපකරණ භාවිතයෙන් මෙම ව්‍යාපාරය ආරම්භ කළ හැකි වේ. තවද සැලොන් පුටු ආදි ලී බඩු සපයා ගැනීමද කළ යුතුය.

ස්ථානය

නිවසේ කාමරයක, බදු ගන්නා ලද සාප්පුවක හෝ ජංගම ව්‍යාපාරයක් ලෙසින් හෝ මෙම ව්‍යාපාරය සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ හැකි වේ.

3. වෙළෙඳපොල

ළමයින් හා පුරුෂයින් මෙම ව්‍යාපාරයේ පාරිභෝගික කණ්ඩායම ලෙස හඳුනා ගත හැකි වේ. වැඩිහිටි පුරුෂයෙකුගේ කොණ්ඩා කැපීම සඳහා රුපියල් 200 පමණ මුදලක් ද දරුවකුගේ කොණ්ඩය කැපීම සඳහා රුපියල් 150ක පමණ මුදලක් ද අයකරනු ලැබේ. මූලික සේවාවට අමතර වෙනත් සේවාවන් ලබා ගැනිමේදී අමතර ගාස්තු අයකරනු ලැබේ.

4. ආයෝජනය

දිනකට පුද්ගලයින් 10ත් 20ත් අතර ප්‍රමාණයකට සේවය සපයන බාබර් සාප්පුවක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල,

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	-	රු. 39,530.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයකට)	-	රු. 35,500.00
	මුළු එකතුව	-	**රු. 75,030.00**

5. මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය මූලික අයිතම පමණක් ඇතුළත් කර ඇත.

අංකය	උපකරණය	වටිනාකම (රු.)
01	දැලි පිහිය	230.00
02	කොණ්ඩා වියලනය	3,700.00
03	කොණ්ඩා කපන යන්ත්‍රය (ක්ලිපර්)	12,300.00
05	කතුර	650.00
06	ගැට කතුර	500.00
07	වතුර විදින බෝතලය	750.00
08	විවිධ පනා වර්ග	200.00
09	සැලෝන් හෙයාර් ක්ලිප්ස්(12)	900.00
10	සැලෝන් හෙයාර් බ්‍රෂ්	300.00
11	අයන් කිරිමේ උපකරණය	3,000.00
12	කන්ණාඩි	1,000.00
13	සැලොන් පුටු	15,000.00
14	වෙනත් වියදම්	1,000.00
	මුළු පිරිවැය	39,530.00

6. කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

අංකය	විස්තරය	මාසික වියදම (රු.)
01	කොණ්ඩා වර්ණ ගැන්වීමේ ඩයි වර්ග	3,000.00
02	ෂේවින් ක්‍රීම් සහ තෙල් වර්ග	2,500.00
03	ශ්‍රම වැටුප් (1200×25)	30,000.00
	මුළු පිරිවැය	35,500.00

7. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට දින 25ක් ක්‍රියාත්මක වන අතර දිනකට පුද්ගලයන් 10 ත් 20 ත් අතර ප්‍රමාණයකට සේවය ලබාදීම සිදුකරනු ලබයි.

මාසික විකුණුම් ආදායම - දිනකට පුද්ගලයින් 10 × රුපියල් 200.00 × දින 25 = රු. 50,000.00

ඉහත කාර්යයන්ට අමතරව කොණ්ඩා වර්ණ ගැන්වීම සහ රැවුල කැපීම වැනි දේ වලින් රුපියල් 8,000.00 ක පමණ අමතර මාසික ආදායමක් ලබා ගත හැකි වේ. එවිට මුළු මාසික ආදායම රුපියල් 58,000.00 ක් පමණ වේ.

මුළු පිරිවැය = ශ්‍රම පිරිවැය + සෘජු අමු ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 30,000.00 + රු. 5,500.00 + රු. 14,500.00
= රුපියල් 50,000.00

8. වක්‍ර පිරිවැය

ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සඳහා දරනු ලබන අනෙකුත් වියදම් වේ. දුරකතන ගාස්තු, ජල බිල්, විදුලිය, ප්‍රවාහනය, නඩත්තු වියදම්, යන්ත්‍ර ක්ෂය හා සෘජු වියදම් ලෙස නොසලකන ලද සියලුම වියදම් අනෙකුත් වියදම් වේ. මේ ව්‍යාපාරයේ මාසික වක්‍ර පිරිවැය රුපියල් 4,500.00ක් පමණ වේ. බදු හෝ කුලී වියදම ලෙස රුපියල් 10,000.00 ක වියදමක් මාසිකව දරනු ලැබේ. එවිට මුළු වක්‍ර පිරිවැය ලෙස රුපියල් 14,500.00 ක පමණ මුදලක් වැය වේ.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 58,000.00 - රු. 50,000.00
	= රුපියල්. 8,000.00

මෙම ව්‍යාපාරයේ අයිතිකරු පමණක් සේවයේ නිරත වේ නම් මාසික වැටුප ලෙස රුපියල් 30,000.00 ක් පමණ වෙන් කර ගත හැකි අතර ශුද්ධ ලාභය වශයෙන් රුපියල් 8,000 ක් උපයා ගත හැකිය. තමන්ගේම ස්ථානයක ව්‍යාපාරය පවත්වාගෙන යෑමේදී රුපියල් 18,000 ක ශුද්ධ ලාභයක් ඉපයිය හැකි අතර තම පළපුරුද්ද,දක්ෂතාවය හා ප්‍රසිද්ධිය මෙන්ම තරඟකරුවන් අවම තත්වයකදී තවදුරටත් වෙළඳපොළ වර්ධනය කර ගත හැකිය.

ග්‍රිල් ගේට්ටු නිෂ්පාදන ව්‍යාපාරය

1. හැදින්වීම

ජීවත්වීම සඳහා සැමගේ සිහිනය සුරක්ෂිත හා අලංකාර නිවසක් තනා ගැනීම. නිවසක ආරක්ෂාව තහවුරු කරගැනීම සඳහා නව නිවසක් තනන සහ පවත්නා නිවාස වල අලුත්වැඩියාවක් සිදු කරන දෙපාර්ශවයම ජනෙල් සඳහා වානේ ග්‍රිල් යොදා ගැනීම සහ ගෙවත්තට ව්‍යාපාරික ස්ථානයට ආරක්ෂාව සලසා ගැනීමට හා අලංකාර වක්කර ගැනීම උදෙසා වානේ ගේට්ටු සවි කිරීම ප්‍රචලිතව පවතී. ඒ තුලින් ව්‍යාපාර ක්ෂේත්‍රයේ ග්‍රිල් ගේට්ටු නිෂ්පාදන ව්‍යාපාරයට වැඩි අවස්ථාවක් උදා වී ඇත.

2 . අමුද්‍රව්‍ය

යකඩ කූරු, ගැල්වනයිස් බට, අමානෝ තහඩු, පට්ටම්, ඇණ වර්ග, පොප්ර්ට්, තීන්ත, වැලිකඩදාසි

3. වෙළඳපොල

ග්‍රිල් ගේට්ටු නිෂ්පාදනය ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සිදු කළ හැකි ව්‍යාපාරයක් ලෙස හඳුනාගත හැකි අතර මෙවැනි කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයකට යොමු වන පිරිසගේ සීමිත බව හේතුවෙන් වෙළඳපොල අවස්ථාව වැඩි වශයෙන් පවතී. එනම් ඉල්ලුමට සරිලන සැපයුමක් දක්නට නොමැති නිසා වෙළෙඳපොලට පිවිසීම පහසු වේ. එසේම වර්තමානයේ ඕනෑම නිවසකට ව්‍යාපාරික ස්ථානයකට එහි ආරක්ෂාව උදෙසා ගේට්ටුවක් සවි කිරීම අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වීමත්, නව නිවසක් ඉදි කිරීම සහ පවතින නිවසක අලුත්වැඩියා කිරීමක දී විවිධ මෝස්තරයන්ගෙන් යුත් ග්‍රිල් සවි කිරීම නව ප්‍රවණතාවයක් ලෙසත්, හඳුනාගත හැකිය. පාරිභෝගිකයන්ගේ ආදායම් මට්ටම අනුව සහ ඔවුන්ගේ වෙනස් මෝස්තර සඳහා ඇති අවශ්‍යතාවය මත මෙම නිෂ්පාදන සඳහා වන මිල ගණන් වෙනස් කිරීමට නිෂ්පාදකයාට අවස්ථාව පවතී.

4. ආයෝජනය

තම නිවස ව්‍යාපාරික ස්ථානය ලෙස භාවිතා කරමින් ආරම්භ කරන ග්‍රිල් ගේට්ටු නිෂ්පාදන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 74,200.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා) (24000+30400)	- රු. 54,400.00
	මුළු ආයෝජනය	- **රු. 128,600.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	හෑන්ඩ් වෙල්ඩින් ප්ලාන්ට්	35,000.00
02	ඩ්‍රිල් (Drill Machine)	9,000.00
03	ග්‍රයින්ඩර්	7,400.00
04	Welding glass	2,100.00
05	Hand Rivet Gun	700.00
06	අනෙකුත් උපකරණ Hand tool kit and steel cutting saw and other simple tools	20,000.00
	මුළු පිරිවැය	74,200.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

සතියකට ගේට්ටු 01ක් සහ ග්‍රිල් 8ක් සඳහා කාරක ප්‍රාග්ධනය ඇස්තමේන්තු කර ඇත.

විස්තරය	ගේට්ටුවක වියදම	ග්‍රිල් එකක වියදම
සෘජු ද්‍රව්‍ය (කම්බි. අමානෝ තහඩු, පට්ටම් ආදිය සඳහා)	18,500.00	3,125.00
සෘජු ශ්‍රමය සඳහා	4,000.00	500.00
සෘජු වෙනත් වියදම් (වැලි කඩදාසි, ග්‍රයින්ඩින් වීල්)	1,500.00	175.00
එක් ඒකකයක කාරක ප්‍රාග්ධන වියදම	**24,000.00**	**3,800.00**
සතියක මුළු කාරක ප්‍රාග්ධන වියදම	(24,000 x 1) 24,000.00	(3800 x 8) 30,400.00
සතියක් සඳහා කාරක ප්‍රාග්ධන වියදම	54,400.00	

5 මාසික ශුද්ධ ලාභය

උපකල්පන

මිල සහ ඉල්ලුම ස්ථාරව පවතී.

මාසිකව ගේට්ටු 4ක් සහ ග්‍රිල් 32ක් ද සකසන අතර සතියකට ගේට්ටු 01ක් සහ ග්‍රිල් 08ක් සකස් කරයි.

නිෂ්පාදනය ව්‍යාපාරිකයා විසින්ම සිදු කරයි.

ගේට්ටුවක් අඩි 10 × 05 සහ ග්‍රිල් එකක් අඩි 5 × 1.5 ප්‍රමාණයේ බව (විශාලත්වය හා මෝස්තරය අනුව අමුද්‍රව්‍ය ප්‍රමාණයන් හා මිල වෙනස් වේ)

මාසික විකුණුම් ආදායම

ගේට්ටු 04 × රු. 37,000 = රු. 148,000.00

ග්‍රිල් 32 × රු. 4,600 = රු. 147,200.00

මාසික විකුණුම් ආදායම = රු. 295,200.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම

මාසික සෘජු පිරිවැය = රු. 174,000 + රු. 32,000 + රු. 11,600
= රු. 217,600.00

වකු පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජල, විදුලි, ප්‍රවාහන, දුරකථන ආදී අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 10,600.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 295,200.00 - (රු. 217,600.00 + රු. 10,600.00)
	= රු. 295,200.00 - රු. 228,200.00
	= රු. 67,000.00

ව්‍යාපාරිකයා විසින් පෙර සඳහන් කල උපකල්පනයන්ට යටත්ව මෙම ව්‍යාපාර කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 67,000.00ක ශුද්ධ ලාභයක් සහ වැටුප ලෙස රු. 32,000.00 ක මුදලක් උපයාගත හැකිය.

කේටරින් සර්විස්

1. හැඳින්වීම

ආහාර පාන සැකසීමේ ව්‍යාපාර ක්ෂේත්‍රය අද වන විට විවිධ වූ මානයන් ඔස්සේ ක්‍රියාත්මක වේ. නියමිත රසය, ගුණය, තත්ත්වය සහ පිරිසිදු බව රඳවා ගනිමින් ආහාර පාන සැකසීමේ නිරත ව්‍යාපාරවලට ක්ෂේත්‍රය තුළ දීර්ඝ කාලීන පැවැත්මක් ඇති අතර, සාර්ථකව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යා හැකි වේ.

කාර්ය බහුල ජීවන රටාවත් සමග පුද්ගලයින් විසින් තමන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථාවන් වලදී පවත්වන ප්‍රියසම්භාෂන උත්සව වල ප්‍රධානතම අංගයක් වන ආහාර පිළියෙල කර ගැනීම තමන් විසින්ම සිදු කර ගන්නවා වෙනුවට බාහිර පුද්ගලයෙකුට හෝ ආයතනයකට භාර දීම අද වන විට බෙහෙවින් ප්‍රචලිතව ඇත. මෙහිදී විවිධ වූ උත්සව අවස්ථාවන්ට ගැලපෙන අයුරින් එම උත්සවයේ ස්වභාවය, සේවාලාභියාගේ ගෙවීමේ හැකියාව වැනි වූ කරුණු පදනම් කර ගෙන පාරිභෝගික රුචිකත්වය අනුව සේවා සැපයිය හැකි වේ.

ඒ අනුව, ආහාරපාන සැපයීමේ නිරත ව්‍යාපාර කලින් සකස් කර ගන්නා ලද මෙනු වර්ගවලට අදාළව සේවා ලාභීන්ගෙන් ඇණවුම් ලබා ගෙන, ආහාර සැකසීමේ කටයුතු ව්‍යාපාරික ස්ථානය තුළ සිදුකර, අදාළ ස්ථානය වෙත ගෙන ගොස් භාර දෙන ආකාරයට ක්‍රියාත්මක කිරීම බහුලව දැකිය හැකිය. අමුද්‍රව්‍ය, ප්‍රවාහන කටයුතු සඳහා ත්‍රීරෝද රථයක් ද උපකරණ හා සකස් කර ගන්නා ලද ආහාර ප්‍රවාහනය සඳහා ඩීමෝ බට්ටා රථයක් යොදා ගනිමින් ව්‍යාපාරික කටයුතු සිදු කිරීම වර්තමානයේ දැකිය හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

ආරාධිත බීම - කෝඩියල් හෝ පළතුරු
සහල් - සම්බා, බාස්මතී, රතු කැකුළු
වීළවළු
පරිප්පු
මස් වර්ග
මාළු වර්ග
තෙල් - පොල් තෙල් /වීළවළු තෙල්
පොල් පිටි කල පොල් කිරි
රසකාරක - සෝයා සෝස්, තක්කාලි සෝස්, මාලු සෝස්, මැගී සුප් කැට
පලතුරු - ඇපල්, ගස්ලබු, අන්නාසි, කෙසෙල් ,පැණි කොමඩු
අතුරුපස - කිරි, අයිස් ක්‍රීම්, පෙලි
කුළු බඩු

3. වෙළඳපොල

නාගරික ප්‍රදේශ වල බෙහෙවින් ප්‍රචලිතව ඇති මෙම ව්‍යාපාරය වර්තමානය වන විට ග්‍රාමීය මට්ටමින්ද ව්‍යාප්ත වෙමින් පවතී. නිෂ්පාදන ගුණාත්වය තත්ත්වය, රසය අඛණ්ඩව පවත්වා ගත හැකි ව්‍යාපාරවලට දීර්ඝ කාලීනව වෙළඳපොල තුළ රැඳීසිටිය හැකි වේ.

ආහාර සැකසුම් ක්ෂේත්‍රයට අදාළව දැනුම ඇති නැති ඕනෑම පුද්ගලයෙකුට මෙම ව්‍යාපාරය ආරම්භ කළ හැකි අතර, එසේ දැනුම තමන් සතු නොවන්නේ නම් දැනුම පලපුරුද්ද සහිත අයෙකු සේවයට බඳවා ගත හැකිය. මේ සඳහා සේවක වැටුප ලෙස ගෙවන මුදල අතිරේක පිරිවැයක් ලෙස එක් වේ.

එමෙන්ම රාජ්‍ය පෞද්ගලික ආයතන, ඇඟලුම් කර්මාන්ත ශාලා වැනි අයතන වලින් බත් පාර්සල් ඇණවුම් ලබා ගැනීම ලෙස හෝ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙනයාම සඳහා නියමිත ස්ථානයක් නොමැති නම් ඇණවුමට අදාළ ස්ථානය වෙත ගොස් ආහාර පාන පිළියෙල කර දීම සිදුකල හැකි වේ. එහිදී අවශ්‍ය අමුද්‍රව්‍ය පාරිභෝගිකයාගෙන් ලබාගන්නා ආකාරයට වුවද සිදු කළ හැකිය. තවද අවශ්‍ය උපකරණ (බුෆේ සෙට්, පිඟන්, විදුරු) සඳහා මූලික ආයෝජනයක් සිදුනොකරන්නේ නම් උත්සව භාණ්ඩ බදු පදනම මත ලබා දෙන ස්ථානයකින් බදු පදනමට ලබා ගත හැකිය.

4. ආයෝජනය

එක් සතියක් තුළ ඇණවුම් 03ක් ලබා ගන්නා ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 291,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	- රු. 112,580.00
	මුළු එකතුව	- **රු. 404,080.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර, ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
1	හයි ප්‍රෙෂර් ගෑස් ලිප්	15,000.00
2	සාමාන්‍ය ගෑස් ලිප් 02	12,500.00
3	ග්‍රරයින්ඩර්	12,000.00
4	කි.ග්‍රෑ 10 රයිස් කුකර්	12,000.00
5	ඇලුමීනියම් හට්ටි, පෙරණ	30,000.00
6	බුෆේ සෙට් ලොකු,පොඩි	130,000.00
7	පිඟන් , විදුරු, කප්	40,000.00
8	අනෙකුත් උපකරණ (පිහි හැදි චොපින් බෝඩ්,මැට් වලං	40,000.00
	මුළු එකතුව	291,500.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

සතියකට රු.250.00, රු.450.00 ,රු.650.00 යන මෙනු වර්ග තුනෙන් එක් ඇණවුමකට පුද්ගලයින් 100 ක් සඳහා ආහාර සපයන ඇණවුම් 3 ක් ද, උත්සව ඇණවුම් නොමැති අනෙක් දින වලදී වෙනත් ආයතන වලින් බත් පාර්සල් ඇණවුම් ලබා ගැනීම ද සිදුකළ හැකි බව සලකා සතියකට දින 5ක් ව්‍යාපාර කටයුතු කරන බව උපකල්පනය කර ඇත.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු.)
1	අමුද්‍රව්‍ය	18,450.00	92,250.00
2	ගෙන ඒමේ කුලී	500.00	2,500.00
3	ගෑස්	306.00	1,530.00
4	ඇසුරුම්	160.00	800.00
5	වීදුලිය	100.00	500.00
6	ශ්‍රම වැටුප	3,000.00	15,000.00
	මුළු එකතුව	22,516.00	112,580.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

අයිතිකරු විසින් ආහාර සකස් කිරීමේ කාර්යයේ නියැලෙන බව සහ සහාය සඳහා සේවකයින් 02 යොදා ගන්නා බව.

සතියකට රු. 250.00, රු. 450.00, රු. 650.00 යන මෙනු වර්ග තුනෙන් පුද්ගලයින් 100 ක් බැගින් වූ ඇණවුම් 03 සඳහා සේවා සපයන බව.

උත්සව ඇණවුම් නොමැති අනෙක් දින වලදී වෙනත් ආයතන වලින් බත් පාර්සල් ඇණවුම් ලබා ගැනීම සිදු කරන බව.

ව්‍යාපාරය මසකට දින 20 ක් ව්‍යාපාර කටයුතු සිදුකරන බව.

මාසික විකුණුම් ආදායම

(එක් සතියක් තුළ සපයනු ලබන ඇණවුම් 3 හි වටිනාකම රු. 135,000.00 ක් ලෙස ගණනය කර ඇත.)
සතියක විකුණුම් ආදායම × සති 04 (රු. 135,000.00 × 04)- රු. 540,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
දිනක සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය
= රු. 19,110.00 + රු. 3,000.00 + රු. 406.00
= රු. 22,516.00

දිනක සෘජු පිරිවැය × දින 20
මාසික සෘජු පිරිවැය = රු. 22,516.00 × 20
= රු. 450,320.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජලය, ගෙන යාමේ කුලී, ක්ෂය, යන්ත්‍ර උපකරණ අලුත් වැඩියා, ආදී වියදම්) එය මාසයක් සඳහා රු. 40,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 540,000.00 - (රු. 450,320.00 + රු. 40,000.00)
= රු. 540,000.00- රු. 490,320 .00
= රු. 49,680.00

ව්‍යාපාරිකයා විසින්ම ව්‍යාපාරයේ කටයුතු සිදුකරයි නම්, ඔහුට මාසයකට රු. 20,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 49,680.00 ක් උපයා ගත හැකිය.

මාතෘ - ළදරු ඇඟලුම් කට්ටල නිෂ්පාදනය

1. හැඳින්වීම

ගර්භණී මාතාවන් සිය දරුවා බිහිකිරීම සඳහා රෝහල් ගත වීමේ දී පවුල් සෞඛ්‍යය සේවිකාව විසින් රෝහල වෙත රැගෙන යා යුතු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවක් ලබා දීම සිදු කරයි. මෙම ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් මිලට ගැනීමට යාමේදී වැයවෙන පිරිවැය මෙන්ම ඒ සඳහා ගතවන කාලය වැඩිවීම හේතුවෙන් එක කට්ටලයක් ලෙස ලබා ගැනීමට වැඩි කැමැත්තක් දක්වයි. එහෙයින් මේ සඳහා වර්ථමානය වන විට හොඳ වෙළඳපලක් නිර්මාණය වී ඇත. සෑම රෝහලකම මේ සඳහා ලබා දෙන ද්‍රව්‍ය ලැයිස්තුව සමාන වන අතර ප්‍රදේශය අනුව භාණ්ඩ වල ප්‍රමාණ වෙනස් විය හැකිය. මෙම නිෂ්පාදන සිදුකරන දිස්ත්‍රික්ක 03 ක (නුවරඑළිය, මාතර, ගම්පහ) ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සසඳා බලා ලැයිස්තුවට ඇතුලත් විය යුතු ද්‍රව්‍ය සහ ප්‍රමාණ තීරණය කර ඇත.

ද්‍රව්‍ය	ප්‍රමාණය
බේබි ඇදුම්	12
නැප්කින්	12
ච්ත්ත	06
බෙඩ් ජැකට්	06
පැනල් සූට්	02
ටවල්	02
දරුවා ඔතා ගැනීමට රෙදි	01

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

මල් පීස් රෙදි - මෙහිදී මල් පීස් රෙදි වර්ග තුනක් වෙළඳපොළේ පවතින අතර මෙම ව්‍යාපාරය සඳහා උසස් තත්ත්වයේ මල් පීස් රෙදි වල මිළ ගනන් යොදාගෙන ඇත.
නූල් හා බේබි ඉලාස්ටික් වර්ග - මෙම නූල් හා ඉලාස්ටික් වර්ග කිලෝ ගණනට වෙළඳපොලෙන් තොග මිලට ලබාගත හැක.

ඉහත අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී හැකි හැම විටම තොග මිලට මිලදී ගැනීමේදී ලබන ලාභ ප්‍රමාණය වැඩිකරගත හැකිය.

3. වෙළඳපොල

ප්‍රදේශයේ පවතින මාතෘ සායන සහ රෝහල් මූලික කොට මෙම නිෂ්පාදන අලෙවි කිරීමේ හැකියාව පවතී. ඒ අනුව ගුණාත්වයෙන් ඉහල නිෂ්පාදන සාධාරණ මිලකට එම පාරිභෝගික කාණ්ඩයේ අවශ්‍යතාවය අනුව ලබාදීම මගින් හොඳ වෙළඳපොලක් නිර්මාණය කර ගැනීමේ හැකියාව ඇත. මාසිකව ගෙවීමේ ක්‍රමයට මාතෘ ළදරු පැකේජයන් ලබාදීම, එකවර ගෙවීමේදී වට්ටම් ලබාදීම සහ විවිධ ප්‍රවර්ධන ක්‍රම හරහා අලෙවිය වැඩි කරගැනීමේ හැකියාව පවතී.

4. ආයෝජනය

මසක් තුළ මාතෘ - ළදරු ඇඟලුම් කට්ටල 30ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 220,600.00
කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස හයක් සඳහා)	- රු. 204,523.00
මුළු එකතුව	- **රු. 425,123.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	ජුකී මැෂින්	67,000.00
02	නූල් 04 ඕවලොක් මැෂින්	95,000.00
03	විදුලි ස්ත්‍රික්කය	5,000.00
04	කැපුම් යන්ත්‍රය	20,000.00
05	අනෙකුත් උපකරණ	11,600.00
06	ලී බඩු	22,000.00
	එකතුව	220,600.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මසකට පැක් 30 ක් නිෂ්පාදනය කිරීම සඳහා)

අංක	විස්තරය	පැක් එකක් සඳහා (රු.)	පැක් 30 සඳහා (රු.)
01	සෘජු අමුද්‍රව්‍ය	6,108.44	183,253.00
02	ශ්‍රම වියදම	650.00	19,500.00
03	සෘජු වෙනත්	59.00	1,770.00
	එකතුව	6,492.44	204,523.00

5. මාසික ශුද්ධ ලාභය

මසක් තුළ මාතෘ ළදරු කට්ටල 30ක් නිෂ්පාදනය කරන අතර කට්ටලයක විකුණුම් මිල රු. 8,000.00 කි ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = කට්ටල ප්‍රමාණය × විකුණුම් මිල
= 30 × රු. 8,000.00
= රු. 240,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත්
= රු. 183,.253.00 + රු. 19,500.00 + රු. 1,770.00
= රු. 204,523.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙනයාම සඳහා දරණ වියදම් වේ (විදුලි,ප්‍රවාහන, අලෙවි ඇසුරුම් ආදි අනෙකුත් වියදම්) වය මාසයක සඳහා රු. 15,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ශුද්ධ ලාභය = විකුණුම් ආදායම - මුළු පිරිවැය
= රු. 240,000.00 - (රු. 204,523.00 + රු. 15,000.00)
= රු. 240,000.00 - රු. 219,523.00
= රු. 20,477.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 19,500.00 ක ශ්‍රම වැටුපක් සහ රු. 20,477.00 ක ශුද්ධ ලාභයක් උපයාගත හැකිය.

පාවහන් නිෂ්පාදනය

1. හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකයින් 3040 ක පමණ පිරිසක් පාවහන් නිෂ්පාදන කර්මාන්තයේ නිරතව සිටින අතර එයින් 3000 කට ආසන්න පිරිසක් කුඩා පරිමාණයේ ව්‍යවසායකයින් වේ. ඊට අමතරව ගෘහ ආශ්‍රිතව ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාරයක් ලෙස විශාල පිරිසක් මෙම කර්මාන්තයේ නියැලී සිටී. එසේම විදේශ වෙළඳපොළ තුළ හොඳ ඉල්ලුමක් පවතී. ඒ අනුව දක්ෂ ව්‍යවසායකයෙකුට ක්ෂුද්‍ර ව්‍යාපාරයක් ලෙස ආරම්භ කර මහා පරිමාණ ව්‍යාපාරයක් දක්වා වර්ධනය කර ගැනීමේ විභවතාවයක් පවතින ව්‍යාපාර අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- සපත්තු අඩිය (Sole)
- සපත්තුවේ ඇතුළත අඩිය (Insole)
- සපත්තුවේ ඇතුළත අඩියට භාවිතා කරන රෙක්සින් (Insole Rexene)
- සපත්තුව නිර්මාණය සඳහා යොදා ගන්නා රෙක්සින් (Design Rexene)
- සපත්තුවේ ඇතුළත අඩිය සඳහා භාවිතා කරන ගම් (කිරි ගම්) (Insole Gum)
- අලවන ගම්
- බකල්ස්
- අවශ්‍ය නම් හරක් හම් (Leather)

මෙම සියළුම අමුද්‍රව්‍ය වෙළඳපොලින් මිලදී ගැනීමේ හැකියාව ඇත. කොළඹ සහ මහනුවර නගරය ආශ්‍රිතව මෙම කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමට විශේෂිකරනය වූ ආයතන පවතී.

3. වෙළඳපොළ

පාවහන් යනු දේශීය හා විදේශීය වශයෙන් හොඳ ඉල්ලුමක් ඇති ව්‍යාපාරයකි. දේශීයව ගත්කල පාසල් පාවහන්, ළමා පාවහන්, කාන්තා පාවහන්, පිරිමි පාවහන් ලෙස පුළුල් පරාසයක විහිදුනු වෙළඳපොලක් පවතී. භාණ්ඩය නිෂ්පාදනයට යොදා ගන්නා අමුද්‍රව්‍ය හා භාණ්ඩයේ ගුණාත්වය අනුව පුළුල් පරාසයක විහිදුනු ලෙස මිල තීරණය වී තිබේ. එසේම පාවහන් සඳහා හොඳ විදේශ වෙළඳපොළක් ද පවතී. ඇමෙරිකා එක්සත් ජනපදය, එංගලන්තය ඇතුළු යුරෝපා රටවල ද, මැදපෙරදිග රටවල ද, අප රටේ පාවහන් අපනයනය කිරීම සිදු කරනු ලබයි. අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) තොරතුරු අනුව 2016 වසරේ දී ඇ.ඩො. මිලියන 135 ක හා 2021 වසරේ දී ඇ.ඩො. මිලියන 12.5 ක විදේශ විනිමය පාවහන් හා හම් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් උපයාගෙන ඇත.

4. ආයෝජනය

දිනකට කාන්තා පාවහන් 12ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්මේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 60,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	= රු. 36,000.00
	මුළු වියදම	= **රු. 96,000.00**

සියළුම කාර්යයන් යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් තොරව සිදු කරන්නේ නම්, රු. 96,000.00 ක පමණ ආරම්භක ආයෝජනයකින් මෙම ව්‍යාපාරය ආරම්භ කළ හැකිය.

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහි දී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතමයන් පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය (ඉඩම් හා ගොඩනැගිලි) සඳහා පිරිවැයක් ඇස්තමේන්තු කර නැත.

අංකය	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
1	මහන මැෂිම	40,000.00
2	අච්චු, මවුන්ටර්, මිටිය, අඬුව, කතුර, රෑල, පන්චරය, හා අනෙකුත් උපකරණ	20,000.00
	මුළු එකතුව	60,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට කාන්තා පාවහන් ජෝඩු 12ක් නිෂ්පාදනය කරන අතර සතියකට දින 6ක් සේවයේ නිරත වේ.

අංකය	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු.)
1	අමුද්‍රව්‍ය වියදම	4,500.00	27,000.00
2	ශ්‍රම වියදම	1,000.00	6,000.00
3	වෙනත් වියදම්	500.00	3,000.00
	මුළු එකතුව	6,000.00	36,000.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාර මාසයකට දින 25ක් නිෂ්පාදන කටයුතු සිදුකරන අතර දිනකට කාන්තා පාවහන් ජෝඩු 12ක් නිෂ්පාදනය කරන බවට ඇස්තමේන්තු කර ඇත. පාවහන් ජෝඩුවක විකුණුම් මිල රු. 630.00 කි.

ඒ අනුව,

මාසික විකුණුම් ආදායම (දිනක නිෂ්පාදනය 12 × දින 25 × රු. 630.00) = රු. 189,000.00

මාසික මුළු පිරිවැය	= සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය	= සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම
දිනක සෘජු පිරිවැය	= රු. 4,500.00 + රු. 1,000.00 + රු. 500.00
	= රු. 6,000.00 × දින 25
	= රු. 150,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ (ජලය, විදුලිය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු.15000.00 ලෙස ඇස්තමෙන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 189,000.00- (රු.150,000.00 **+** රු.15,000.00)
	= රු. 189,000.00- රු.165,000.00
	= රු. 24,000.00

ව්‍යාපාරිකයා විසින් ම ව්‍යාපාර කටයුතු සිදුකරන්නේ නම්, ඔහුට ශ්‍රම වැටුප ලෙස රු. 25,000.00ක් ශුද්ධ ලාභය ලෙස රු. 24,000.00ක මුදලක් උපයාගත හැකිය.

පොල් ලෙලි කැබලි නිෂ්පාදනය

1. හැඳින්වීම

පොල් ලෙලි කැබලි රෝපණ මාධ්‍යයක් ලෙස යොදාගත හැකි ස්වාභාවික අමු ද්‍රව්‍යකි. ශ්‍රී ලාංකේය පොල් ලෙලි කැබලි රෝපණ මාධ්‍ය සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුතු බැවින් ඒ සඳහා විශාල විදේශීය ඉල්ලුමක් පවතී. එසේම කාබනික පොහොර භාවිතය කෙරෙහි අවධානය යොමුවී ඇති පරිසරය තුළ ශ්‍රී ලංකාව තුල ද මේ සඳහා විශාල ඉල්ලුමක් ඇති වේ. අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගැනීමට හැකි බැවින් ගෘහාශ්‍රිතව පහසුවෙන් කල හැකි ව්‍යාපාර අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

මෙම ව්‍යාපාරයට අමු ද්‍රව්‍ය ලෙස අවශ්‍ය වන්නේ පොල් ලෙලි පමණි. පොල් තොග අලෙවිකරුවන්ගෙන් ලෙලි මිල දී ගත හැකිය. එමෙන්ම පොල් වගා කරන ප්‍රදේශයක නම් ගෘහ ආශ්‍රිතව පොල් ලෙලි අඩු මුදලට එකතු කර ගත හැකිය.

3. වෙළඳපොල

පොල් ලෙලි කැබලි සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. පොල් ලෙලි කැබලි අපනයනය කරන මහා පරිමාණයේ ආයතන මෙන්ම මධ්‍ය පරිමාණයේ ආයතනවලටද, අලෙවි කල හැකිය. ඇතැම් ගැණුම්කරුවන් ළඟටම පැමිණ ලෙලි කැබලි මිලදී ගනියි. පොල් ලෙලි කැබලි ඉහළ ප්‍රමිතියෙන් යුතුව නිෂ්පාදනය කල හොත් වැඩි මිලකට අලෙවි කර ගත හැකිය. පොල් ලෙලි කැබලි අලෙවි කර ගැනීමේ දී මුහුණු පොතේ (face book) පොල් ලෙලි කැබලිකරුවන්ගේ සංගම් හරහා ද අලෙවි කර ගත හැකිය. පසුකාලීනව අපනයන වෙළඳපොල කරා ද යොමු වීමට අවස්ථාව පවතී.

4. ආයෝජනය

දිනකට පොල් ලෙලි කැබලි කිලෝ 330 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල.

04.1	මූලික ස්ථාවර පිරිවැය	- රු. 176,500.00
04.2	කාරක ප්‍රාග්ධනය දින 05 ක් සඳහා	- රු. 59,500.00
	මුළු එකතුව	- **රු. 236,000.00**

04.1 මූලික ස්ථාවර පිරිවැය

අංක	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
1	පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රය(තනි)	145,000.00
2	පොල් ලෙලි කැබලි හලන උපකරණය (රයිසිය)	3,000.00
3	සවල් 02	2,000.00
4	ටෙන්ට් 05	25,000.00
5	කූඩ 03	1,500.00
	එකතුව	176,500.00

04.2 කාරක ප්‍රාග්ධනය දින 05 ක් සඳහා

විස්තරය	දිනකට වියදම (රු.)	දින 05කට වියදම (රු.)
අමුද්‍රව්‍ය	8,000.00	40,000.00
ගෙන ඒමේ කුලිය	1,000.00	5,000.00
ශ්‍රම වැටුප්	2,500.00	12,500.00
ඇසුරුම් / වෙනත්	400.00	2,000.00
එකතුව	11,900.00	59,500.00

05. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට දින 25 ක් ව්‍යාපාර කටයුතු සිදු කරන අතර එක් දිනක දී පොල් ලෙලි කැබලි කිලෝ 330ක් නිෂ්පාදනය කරන බවට උපකල්පනය කර ඇත. පොල් ලෙලි කැබලි කිලෝවක මිල රු. 45.00 කි
ඒ අනුව

1. මාසික විකුණුම් ආදායම (දින 25 × දිනක නිෂ්පාදනය කිලෝ 330 × කිලෝ 1 මිල රු. 45)
   = රු. 37,1250.00

2. මාසික මුළු වියදම = සෘජු පිරිවැය රු. 295,500.00 + වක්‍ර පිරිවැය රු. 28,000.00
   = රු. 323,500.00

සෘජු පිරිවැය - සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම

සෘජු අමුද්‍රව්‍ය වියදම - පොල් ලෙල්ලක මිල රු.8 × දිනකට පොල්ලෙලි 1000 × දින25 = රු.200,000.00
සෘජු ශ්‍රම වියදම - දිනක ශ්‍රම වැටුප රු.2500.00 (ශ්‍රමිකයින්02) × දින 25 = රු. 62500.00
සෘජු වෙනත් වියදම් - විදුලිය රු.5000.00 ඇසුරුම් වියදම්(150 × රු.20.00) රු. 3000.00
ගෙන ඒමේ කුලිය (රු.1000.00 × දින 25) රු.25000.00 = රු.33000.00
= රු.295500.00

වක්‍ර වියදම්
ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් රු.28,000.00 පමණ වේ.
(බෙදාහැරීමේ වියදම්, සංග්‍රහ වියදම්, අලුත්වැඩියා වියදම්, ක්ෂය අනෙකුත් වියදම්)

මාසික ශුද්ධ ලාභය

මාසික විකුණුම් ආදායම	= රු. 371,250.00
අඩුකලා	
මාසික මුළු පිරිවැය	= රු. 323,500.00
ශුද්ධ ලාභය	= රු. 47,750.00

ව්‍යාපාරිකයා විසින් නිෂ්පාදන කටයුතුවල නියැලේ නම්, ඔහුට මසකට ශ්‍රම වැටුප ලෙස රු.25,000ක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 47,750.00 මුදලක් උපයා ගත හැකිය.

සහාය සපයන ආයතන

01 කාර්මික සංවර්ධන මණ්ඩලය

ලිපිනය: 615, ගාලූ පාර, කටුබැද්ද, මොරටුව
දුරකථන අංකය: 011-2605323, 2605326-7, 2605394, 2624846-7
ඊ මේල්: info@idb.gov.lk
වෙබ් ලිපිනය: http://www.idb.gov.lk

සපයන සේවාවන්:

- ව්‍යාපාරික අවස්ථාව හඳුනාගැනීම, හඳුනාගත් අවස්ථාව මත පදනම්ව ව්‍යාපාරය ආරම්භ කිරීම සහ එම ව්‍යාපාරය මෙහෙයවීම සහ පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම
- සේවායෝජනීයත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම
- අපනයන අභිනත කර්මාන්තකරණය - වෙළඳ, ආර්ථික, අපනයන ආදියෙන් අනතුරුව ව්‍යාපාරික ඵලදායිතාව උපරිම තත්ත්වයට පත් කිරීම සඳහා තාක්ෂණය භාවිතා කිරීමට ව්‍යවසායකයින් පෙළඹවීම
- අගය එකතුකළ නිෂ්පාදන සමඟින් ලාභ හා තෘප්තිය ඉහළ නැංවීමට කටයුතු කිරීම
- ව්‍යවසායකයින්ගේ අවශ්‍යතාවය මත අදාල කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික වැඩසටහන්, තොරතුරු තාක්ෂණ වැඩමුළු, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම
- කර්මාන්ත තොරතුරු හා උපදේශන සේවා සැපයීම
- ව්‍යවසායකත්ව සංවර්ධන සේවා සැපයීම සහ කර්මාන්තකරුවන්ට සංවර්ධිත බිම් කොටස් ලබාදීම
- ව්‍යාප්ති සේවා සැපයීම
- ඉංජිනේරු සේවා සැපයීම
- වෙළඳ ප්‍රවර්ධන සේවා සහ අඛලි අමුද්‍රව්‍ය සැපයීම

02 ජාතික ශිල්ප සභාව

ලිපිනය: රෝහිනා මාවත, පැලවත්ත, බත්තරමුල්ල
දුරකථන අංකය: 0112 784425 / 0112 785381 / 0112787441 / 0112 177336 /0112 177462
ඊ මේල්: craftscouncil@sltnet.lk
වෙබ් ලිපිනය: http://craftscouncil.gov.lk

සපයන සේවාවන්:

- දේශීය හස්ත කර්මාන්ත දිරි ගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම
- හස්ත කර්මාන්ත ශිල්පීන් සංවිධානගත කිරීම
- හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සමාජීය හා ආර්ථික තත්ත්වය නංවාලීම

- ඔවුන්ගේ කුසලතා හා දැනුම වර්ධනය කිරීම
- හස්ත කර්මාන්ත සඳහා වන දේශීය අමුද්‍රව්‍ය සුලබ කිරීම මඟින් හස්ත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනයන් ඉහළ නැංවීම
- ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම
- පළාත් හා ජාතික මට්ටමින් ප්‍රදර්ශන ආශ්‍රිත නව තාක්ෂණය හඳුන්වා දීම

03 ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ලිපිනය: අංක 10, ඩී මෙල් පාර, කටුබැද්ද, මොරටුව.
දුරකථන අංකය: 0112 607 814
ඊ මේල්: info@slndc.gov.lk
වෙබ් ලිපිනය: www.slndc.gov.lk

සපයන සේවාවන්:

- ව්‍යවසායකයින්ට තම කර්මාන්ත ඉදිරියට කරගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම
- පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මෝස්තර උපදේශන සේවාවන් සැපයීම
- මෝස්තර සම්බන්ධ දැනුම ලබාදීම
- පර්යේෂණ, සංවර්ධන සහ තාක්ෂණික සේවය සැපයීම
- පොදු පහසුකම් සේවා සැපයීම

04 කාර්මික තාක්ෂණ ආයතනය

ලිපිනය: නො.363, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන අංකය: 0112883779 / 0112883789 / 0112883791
ඊ මේල්: info@lankainformation.lk
වෙබ් ලිපිනය: www.iti.lk

සපයන සේවාවන්:

- භඬු මඟින් පැමිණෙන්නන්හට මෙන්ම කර්මාන්ත අංශයේ නියුතු හා උපාධි මට්ටමේ අධ්‍යාපනයක් අත්පත් කරගැනීමට බලාපොරොත්තු වන්නන් හට උපාධි මට්ටමේ අධ්‍යාපනයක් ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම
- රාජ්‍ය අංශයේ නියෝජිත ආයතන සඳහා මෙන්ම ප්‍රාදේශීය වශයෙන් අවශ්‍ය පුහුණු ලබාදීම
- පුද්ගල අවශ්‍යතාවය මත වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා ලබා දීම
- විවිධ ආහාර වර්ග සකස් කිරීම ඇතුළු නව නිපැයුම් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම හා නවීන උපක්‍රම හඳුන්වා දීම

05. G 1 LANKA- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය

ලිපිනය- ලංකා වාණිජ මණ්ඩලය.නො.50 නවම් මාවත, කොළඹ 02
දුරකථන අංකය- 011-5588885
ඊ මේල්- info@gslanka.org
වෙබ් ලිපිනය- gs1lanka.org

සේවාව- නිෂ්පාදන සඳහා තීරු කේත (Barcode) ලබා දීම.

06. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (නයිටා)

ලිපිනය- අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය,
දුරකථන අංකය- 011 288 8782
ඊ මේල්- info@naita.gov.lk
වෙබ් ලිපිනය- www.naita.gov.lk

සපයන සේවාව- අර්ධකාලීන පාඨමාලා, ජාතික වෘත්තීය සුදුසුකම් (සෘජු / භඬු),ආයතනික පුහුණුව ජාතික වෙළඳ පරීක්ෂණය, ආධුනිකත්ව පුහුණුව

07. සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය - කාර්මික සංවර්ධන මණ්ඩලය

ලිපිනය- 280/1, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව
දුරකථන අංකය - 011-4213472
ඊ මේල් - hmmmunasigha@gmail.com idblcd@gmail.com

සපයන සේවාව- සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම.

08 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ලිපිනය: 80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
දුරකථන අංකය: 011-2034300
ඊ මේල්: info@agrimin.gov.lk
වෙබ් ලිපිනය: www.doa.gov.lk

සපයන සේවාවන්:

- කෘෂි උපදේශන සේවාවන් ලබාදීම
- කෘෂි තාක්ෂණික තොරතුරු ව්‍යාප්ත කිරීම
- කෘෂි SMS සේවාව මඟින් කෘෂි තොරතුරු පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබාදීමට කටයුතු කිරීම
- වී මිල දී ගැනීමේ හා වෙළඳපල වැඩසටහන් කාර්යක්ෂම කළමනාකරණය
- තෝරාගත් භෝගවල නිෂ්පාදනය ඉහළ නැංවීම
- කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම

09 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ලිපිනය: අංක 1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන අංකය: 0812 388651, 081 2386018, 081 2386019
ඊ මේල්: helpdesk@dea.gov.lk
වෙබ් ලිපිනය: http://www.dea.gov.lk

සපයන සේවාවන්:

- අපනයන කෘෂි භෝග අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම සහ ඒවාට මූල්‍ය ආධාර ලබා දීම
- පාර්ශවකරුවන්ට තාක්ෂණික උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම
- සේවාස්ථ පුහුණු වැඩසටහන් දියත් කිරීම
- කුළුබඩු නිෂ්පාදකයින් සහ ගැනුම්කරුවන් සම්බන්ධ කෙරෙන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම
- ප්‍රමිතිකරණ ක්‍රියාවලි ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම
- කුළුබඩු වෙළෙඳාම ආශ්‍රිත නව ව්‍යවසායකයින් සඳහා උපදේශකත්වය සැපයීම
- බහු වාර්ගික, අපනයන කෘෂි බෝග, සංවර්ධනයට හා වීම බෝගවල නිෂ්පාදනය, නිෂ්පාදනවල තත්වය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම

10 සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ලිපිනය: ගැටඹේ, පේරාදෙණිය
දුරකථන අංකය: 081-2388462, 081-2388189, 081-2388337, 081-2388120
වෙබ් ලිපිනය: http://www.daph.gov.lk

සපයන සේවාවන්:

- සත්ත්ව සෞඛ්‍ය, සත්ව අභිජනන, පශු පර්යේෂණ, මානව සම්පත් සංවර්ධනය, පශු සම්පත් සැලසුම් හා ආර්ථික යන තාක්ෂණික අංශ මේ යටතේ ක්‍රියාත්මක වේ.
- සත්ත්ව අභිජනන ව්‍යාපෘති දියත් කිරීම
- ව්‍යවසායකයින්ට අවශ්‍ය සත්ත්ව තාක්ෂණ විශේෂඥ සේවය සැපයීම
- ස්වයං රැකියා ව්‍යාපෘති දියත් කිරීම

11 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

ලිපිනය: නො. 55/75, වොක්ස් හෝල් පටුමග, කොළඹ 02
දුරකථන අංකය: 011 2395561
ඊ මේල්: rubbdev@gmail.com
වෙබ් ලිපිනය: www.rubberdev.gov.lk

සපයන සේවාවන්:

- ප්‍රාදේශීය කාර්යාල මගින් රබර් ඉඩම් සහ එහි හිමිකරුවන් ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම
- අවශ්‍ය පොහොර, පැල හා සහනාධාර මුදල් ලබාදීම
- රබර් නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලා නවීකරණය කිරීමට සහනාධාර ලබාදීම
- රබර් වගාකරුවන්ට උපදේශක සේවාවන් සැපයීම සහ ඔවුන්ට අවශ්‍ය කෘෂි යෙදවුම් ප්‍රවාහනය කරදීම
- රබර් වෙළඳාම, රබර් ආශ්‍රිත නිෂ්පාදන හා රබර් අපනයන සඳහා බලපත්‍ර ලබාදීම
- වෙළඳපොල පිලිබඳව කුඩා රබර් හිමියන් දැනුවත් කිරීම

12 විද්‍යා සම්පත් මධ්‍යස්ථානය

ලිපිනය: ලෝක වෙළඳ මධ්‍යස්ථානය, 7 වන මහල, බටහිර කුළුණ, කොළඹ 01
දුරකථන අංකය: 071 6858161
ඊ මේල්: info@mostr.gov.lk

සපයන සේවාවන්:

- ග්‍රාමීය ව්‍යවසායකයින්ට අවශ්‍ය නවීන තාක්ෂණික පුහුණු වැඩසටහන් කිරීම
- නවෝත්පාදන සඳහා අවශ්‍ය දැනුම ලබාදීම
- නවෝත්පාදන සිදුකරන්නන් සඳහා පැවතිය යුතු ප්‍රමිතීන් සොයා බැලීම
- පාරම්පරික සහ පාරම්පරික නොවන ග්‍රාමීය කර්මාන්තකරුවන්ට වෙළඳපොල ජයගැනීම සඳහා අවස්ථා ලබාදීම
- කර්මාන්තකරුවන්ට තම කර්මාන්තය සිදු කරන ස්ථානය වැඩිදියුණු කරගැනීමට හා ප්‍රමිති සහතික ලබාදීමට උපකාර කිරීම
- විද්‍යා නව්‍යකරණ සහ තාක්ෂණවේද ජනප්‍රියකරණය කිරීමට කටයුතු කිරීම

13 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ලිපිනය: නව ලේකම් කාර්යාලය, මාළිගාවත්ත පාර, කොළඹ 10
දුරකථන අංකය: 0112 320 140
වෙබ් ලිපිනය: https://www.fisheriesdept.gov.lk

සපයන සේවාවන්:

- ප්‍රජා සංවර්ධන වැඩසටහන් හරහා ධීවර ජනතාවගේ සමාජ ආර්ථික අංශයන් නඟා සිටුවීම
- ජලජීවී වගාව සහ මිරිදිය නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර ප්‍රජාවට අවශ්‍ය උපකරණ ලබාදීම සඳහා කටයුතු කිරීම
- පරිසර හිතකාමී ධීවර ආම්පන්න හා ක්‍රම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින්ට අස්වනු නෙලීමේ නවීන තාක්ෂණය ලබාදීම

14 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ලිපිනය: 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
දුරකථන අංකය: 011-2871672 / 011-2872202 / 0012-873802 / 0112-873801
ඊ මේල්: mseadmin@sltnet.lk
වෙබ් ලිපිනය: http://stateminsamurdhi.gov.lk

සපයන සේවාවන්:

- අඩු ආදායම්ලාභීන් ස්වයං රැකියා ගැන්වීම සඳහා කටයුතු කිරීම
- ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම
- ප්‍රාදේශීය මට්ටමෙන් සිටින සමෘද්ධිලාභීන් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට අඩුපොළී යටතේ ණය සහනාධාර ලබාදීම
- ප්‍රජාමූල සංවිධාන වැඩසටහන
- තොරතුරු තාක්ෂණ වැඩසටහන
- පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන
- මාධ්‍ය වැඩසටහන
- ප්‍රජාමූල බැංකු වැඩසටහන
- සමාජ සුභසාධන වැඩසටහන
- සමාජ ආරක්ෂණ වැඩසටහන
- අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම

15 ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය (RDTRI)

ලිපිනය: නො 24/4, කාසල් වීදිය, කොළඹ 08
දුරකථන අංකය: 0112 695579 / 0714 086 303
ඊ මේල්: director@rdtri.gov.lk

සපයන සේවාවන්:

- ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැළසුම්කරණය හා කළමනාකරණය
- සමාජ සජීවිකරණය තුළින් ව්‍යවසායකත්ව සංවර්ධනය
- ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය
- වාර්ෂික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මැදිහත්කරුවන් ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන
- අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීමේ කාර්යබද්ධ පුහුණු වැඩසටහන්

16 පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

ලිපිනය: නො.80/5, බිම් මහල, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
දුරකථන අංකය: 0112883779 / 0112883789 / 0112883791
ඊ මේල්: secretary@livestock.gov.lk
වෙබ් ලිපිනය: https://livestock.gov.lk

සපයන සේවාවන්:

- ග්‍රාමීය ජනතාව ආර්ථිකව නඟා සිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍යාධාර සම්පාදනය කිරීම
- ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයකින් සමන්විත සත්ත්ව ගහනයක් ඇතිකරලීම සහ ආහාරයන්හි සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම හා සහය ලබා දීම
- නිරෝගිමත් සත්ත්ව ගහනයක් ඇතිකරලීම සඳහා ගුණාත්මක සත්ව ආහාර ප්‍රචලිත කිරීම සහ සත්ත්ව රෝග වළක්වාලන හා මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම
- පශු සම්පත් මඟින් ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් ලබා ගැනීම සඳහා ඉහළ ගුණාත්වයකින් යුත් සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම
- දේශීය සත්ත්ව ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම
- පශු සම්පත් නිෂ්පාදන අලෙවිකරණය, සැකසීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම සඳහා විධිමත් අලෙවි ජාලයන් ඇති කිරීම සඳහා අදාළ පාර්ශවයන් දිරි ගැන්වීම
- දේශීය කිරි ගොවීන් ශක්තිමත් කරමින් දියර කිරි නිෂ්පාදනයේ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමට දිරි දීම
- පූර්ණ බලැති ජාතික කෘෂිකර්ම අලෙවිකරණ අධිකාරිය ස්ථාපිත කිරීම තුළින් ප්‍රාදේශීය හා ගම් මට්ටමින් කෘෂි නිෂ්පාදන මිලට ගැනීම හා ගබඩා කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණය සම්බන්ධීකරණය කිරීම
- තොග වෙළෙඳුන් හා පාරිභෝගිකයින්, කෘෂි නිෂ්පාදකයින් සමඟ සම්බන්ධ කිරීම තුළින් දේශීය කෘෂි නිෂ්පාදන මිල තිරසාර මට්ටමක පවත්වා ගැනීමේ අරමුණින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම

17 පර්යේෂණ හා නව නිපැයුම් අංශය

ලිපිනය: නො. 3 වන මහළ, සෙත්සිරිපාය පළමු අදියර, බත්තරමුල්ල
දුරකථන අංකය: 011-2392149, 2392150, 2327554
ඊ මේල්: info@mostr.gov.lk

සපයන සේවාවන්:

- ප්‍රමිති සහ ප්‍රතිතනය
- තාක්ෂණ පැවරුම් සහ වාණිජ්‍යකරණය
- ඉල්ලුම අනුව මෙහෙයවනු ලබන පර්යේෂණ ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාමාර්ග යොදා ගැනීම
- විද්‍යා නව්‍යකරණ සහ තාක්ෂණවේද ජනප්‍රියකරණය
- වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අන්තර්ජාතික වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල සිදුවන පර්යේෂණයන්හි නව සොයා ගැනීම්වලට අනුගතවන පරිදි දේශීය පර්යේෂණ සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම
- තොරතුරු, නැනෝ හා ජෛව තාක්ෂණයද ඇතුලුව නව පර්යේෂණ හා සොයාගැනීම්වලින් ලබාගන්නා ප්‍රතිඵල හා දැනුම ව්‍යාපාරික ප්‍රජාවද ඇතුලුව අදාළ පාර්ශවයන් වෙත ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ප්‍රමිතීන් පැනවීම සම්බන්ධ කටයුතු සිදු කිරීම
- වෙනත් අමාත්‍යාංශ විෂය පථය යටතේ ගැනෙන පර්යේෂණ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ සඳහා තාක්ෂණික සහාය ලබාදීම
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

18 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

ලිපිනය: නො. 73/1, ගාලූ පාර, කොළඹ 03
දුරකථන අංකය: 011-2392149, 2392150, 2327554
ඊ මේල්: secretarymid@gmail.com
වෙබ් ලිපිනය: www.industry.gov.lk

සපයන සේවාවන්:

- වෙළඳ සහ තීරුබදු පිළිබඳ කාර්යය
- කර්මාන්ත හා පාරිසරික කටයුතු
- කර්මාන්ත ලියාපදිංචිය
- උපදේශන සභාවේ ක්‍රියාකාරිත්වය
- කර්මාන්ත සඳහා සහායක වැඩසටහන් පැවැත්වීම
- ඵලදායිතාව වර්ධනය
- පර්යේෂණ සහ සංවර්ධනය

---

19 ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ලිපිනය: නො. 42, නවම් මාවත, කොළඹ 02
දුරකථන අංකය: 0112300705 / 0112300707
ඊ මේල්: edb@edb.gov.lk
වෙබ් ලිපිනය: https://www.srilankabusiness.com/si/edb

සපයන සේවාවන්:

- ශ්‍රී ලාංකික සමාගම්වලට ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම සඳහා අවස්ථාවන් සහ සහාය ලබා දීම
- ශ්‍රී ලාංකාවේ අපනයන වෙළඳාම සහ රැකියා අපේක්ෂා ඉහළ නැංවීමට කටයුතු කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උපදේශන සේවා ලබා දීමට කටයුතු කිරීම
- අපනයනකරුවන් සඳහා නිර්මාණය කර ඇති අධ්‍යාපනික සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම
- ශ්‍රී ලාංකේය හා ලෝක වෙළඳපොළේ ඇති විවිධ භාණ්ඩ හා සේවාවන් පිළිබඳ මණ්ඩලය සතුව පවතින දැනුම ව්‍යවසායකයින් වෙත ලබාදීම
- අපනයනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා අපනයන සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳව රජයට උපදෙස් ලබා දීම
- අපනයන ක්ෂේත්‍රයේ කාර්ය සාධනය නියාමනය කිරීම
- ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීමට නිෂ්පාදන, නිර්මාණ, වෙළඳපල සහ වෙනත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම
- අපනයන සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය ලෙස අපනයනයට සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන් සමග එක්ව අපනයන සංවර්ධන ක්‍රියාකාරකම් වලට පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම
- අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම විෂයන් පිළිබඳව උපදේශන සේවා සහ තොරතුරු සැපයීම

20 ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ලිපිනය: කාර්මික ජනපදය, රජ මාවත, ජා ඇල, වීකල
දුරකථන අංකය: 011-2236284 / 011-2236384 / 011-2234267
ඊ මේල්: techno@nerdc.lk
වෙබ් ලිපිනය: http://nerdc.lk

සපයන සේවාවන්:

- නව සොයාගැනීම් හා නිර්මාණ කුසලතාවයන්ට ධෛර්යය දීම
- නව නිර්මාණ සංවර්ධනය කිරීම සඳහා ආධාර දීම
- දේශීය තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධි විධාන සැලැස්වීම
- රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැලැස්වීම
- උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත්වලින් වැනම් ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත්වලින් උපරිම උපයෝජනය අත්කර ගැනීමට අනුබල දීම
- කාර්මික වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිත කරන්නන් විසින් ඉල්ලූම්කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛණ්ඩ උපදේශක සේවාවන් සැපයීම
- මෙරට ඉංජිනේරු සහ කාර්මික සැලසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම
- ජනතාව දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම

21 ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය

ලිපිනය: නො.28, බත්තරමුල්ල පාර, ඇතුල් කෝට්ටේ
දුරකථන අංකය: 0112866846 / 0112887899
ඊ මේල්: service@agrimin.gov.lk / info@agrimin.gov.lk
වෙබ් ලිපිනය: http://www.agrimin.gov.lk

සපයන සේවාවන්:

- එළවළු, පලතුරු, වී බීජ නිෂ්පාදනය කිරීම
- ස්වාරක්ෂක බීජ තොග පවත්වා ගැනීම
- පුහුණු වැඩසටහන් පැවැත්වීම
- වී ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පලතුරු සහ එළවළු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අන්තර් පළාත් ඒකක 06 මඟින් ප්‍රධාන ජල සම්පාදන ක්‍රම යටතේ සෘජු ව්‍යාප්ති වැඩසටහන් මෙහෙය වීම
- පළාත් සහ මහවැලි ප්‍රදේශ සමඟ එක්ව සිදු කරන සහයෝගිතා ව්‍යාප්ති වැඩසටහන්
- ව්‍යාප්ති නිලධාරීන්, ගොවීන්, ව්‍යවසායකයන් සහ වෙනත් පුද්ගලයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- භඬු මට්ටමෙන් යුත් කෘෂිකාර්මික නිෂ්පාදනය සහ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා මෙහෙය වීම
- තරුණ ගොවි සමාජ කටයුතු මෙහෙය වීම
- මී මැසි සංවර්ධන කටයුතු මෙහෙය වීම
- කෘෂි ව්‍යාපාර උපදේශන, ක්ෂුද්‍ර ජල සම්පාදන සහ ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ වැඩසටහන් මෙහෙය වීම
- කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් මෙහෙය වීම
- හෙළ බොජුන් අලෙවි සැල් පිහිටුවමින් සහ ඒවා පවත්වාගෙන යමින් මහජනතාව අතර දේශීය ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම
- උද්‍යාන බෝග සංවර්ධන සහ පුහුණු වැඩසටහන් දියත් කිරීම

---

22 තල් සංවර්ධන මණ්ඩලය

ලිපිනය: අංක 41, ඩබ්ලිව්.ඒ.සිල්වා මාවත, කොළඹ 06
දුරකථන අංකය: 021 222 2034
ඊ මේල්: slpdbho@yahoo.com
වෙබ් ලිපිනය: http://pdb.gov.lk

සපයන සේවාවන්:

- තල් ආශ්‍රිත සංවර්ධනය සහ ප්‍රජාව නගා සිටුවීම සඳහා මනා සංවිධානමය පදනමක් සැපයීම
- ශ්‍රී ලංකාවේ තල් ආශ්‍රිත කර්මාන්තයේ ක්ෂුද්‍ර, ව්‍යාපාර, අතරමැදි කර්මාන්ත හා අධිතාක්ෂණ කර්මාන්ත මට්ටම්වල තිරසාර සංවර්ධනය සඳහා මනා විද්‍යාත්මක පදනමක් සැපයීමට කටයුතු කිරීම
- අධි තාක්ෂණ සංවර්ධනය වෙත මග පාදමින්, මූලික උපායමාර්ගික හා ව්‍යවහාරික පර්යේෂණ හරහා තල් සම්පත් සඳහා උචිත භෝග සංරක්ෂණ, පිරිසැකසුම් හා නිෂ්පාදන සංවර්ධන තාක්ෂණවේදයන් සංවර්ධනය කිරීම
- සමෝධානිත සංවර්ධන ප්‍රයත්නයන් දායාද කරනු පිණිස දියුණු තල් ආශ්‍රිත භෝග හා පශු සම්පත් නිෂ්පාදන පද්ධති හා ක්‍රම සංවර්ධනය කිරීම
- තල් සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධනය කරන ලද, යැපෙන්නන්ට හා කර්මාන්තකරුවන්ට උචිත තාක්ෂණවේදයන් සුදුසු ලෙස ලබා දීම
- තල් ජාන සම්පත් සඳහා ජාතික සුරක්ෂිතාගාරයක් ලෙස සේවය සැලසීම සහ දියුණු රෝපණ ද්‍රව්‍ය නිපදවීම
- ප්‍රායෝගික ව්‍යවහාරයන් සහිත ජනප්‍රිය අනුවර්තනද සමගින් තල් පිළිබඳ තාක්ෂණික තොරතුරු රැස් කිරීම හා ප්‍රචලිත කිරීම
- නිෂ්පාදන පද්ධති කළමනාකරණය කිරීම පිළිබඳ විවිධ විකල්ප තේරීම් බිහි කළ හැකි වන පරිද්දෙන් තල් ආශ්‍රිත ආයතනික සංවර්ධනය සහ උපකාර ප්‍රශස්ततම තත්ත්වයට ගෙන ඒම

---

23 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ලිපිනය: නො 561,. ඇල්විටිගල මාවත,. නාරාහේන්පිට
දුරකථන අංකය: 0772 624 242 / 0112 369 792
ඊ මේල්: chairman.neda@gov.lk
වෙබ් ලිපිනය: https://www.neda.gov.lk

සපයන සේවාවන්:

- ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා තාක්ෂණික සහාය හා නිෂ්පාදන සංවර්ධනයට අවශ්‍ය සහාය ලබා දීම
- ආහාර ඇසුරුම්කරණය හා නිෂ්පාදනය, භෞතික ඉඩ අවකාශය, ආහාර සැකසුම් සඳහා තාක්ෂණික සහාය, ව්‍යාපාර කළමනාකරණ සේවා සහ මූල්‍ය සම්බන්ධතා සඳහා සම්පූර්ණ විසඳුමක් වශයෙන් කුඩා ව්‍යාපාර සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- ව්‍යවසායකත්ව සංවර්ධනය හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුම ලබාදීමේ වැඩමුළු සංවිධානය කිරීම
- කලාපීය ආර්ථික සංවර්ධන වැඩසටහන මඟින් දේශීය පෞද්ගලික හා රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් අතර, දිරිගැන්වීම්, අවස්ථා සහ හවුල්කාරිත්වයන් ඇති කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- වෙළඳපොළ තොරතුරු බෙදාහැරීමට සහ වෙළඳපොළ සබඳතා ගොඩනැගීමට කටයුතු කිරීම සහ අවශ්‍යතාවන්ට අනුව හඳුනාගත් වෙළඳපොළවල් සමග සබඳතා ගොඩනගා දීමට කටයුතු කිරීම
- ව්‍යවසායකත්වය, අලෙවිකරණය, තාක්ෂණික හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- මූල්‍යාධාර සැපයීම සහ වෙනත් ව්‍යවසාය සංවර්ධන සේවා සහ පසු විපරම් සේවා සිදු කිරීම
- ගැණුම්කරුවන්ගේ අවශ්‍යතා සහ නිෂ්පාදන, බහුවිධ කළමනාකරණ, අලෙවිකරණ, ඇසුරුම්කරණ, තාක්ෂණය, තත්ත්ව සහතිකය සහ මූල්‍ය ප්‍රවේශය වැනි දෑ අතර පරතරයක් ඇති වටෙකදී ඔවුන් නිෂ්පාදකයින් හා සම්බන්ධ කිරීමට හා ගැණුම්කරුගේ අවශ්‍යතා අනුව නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු කිරීම

24 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය - තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය

ලිපිනය - අංක 420, බෞද්ධාලොක මාවත, කොළඹ - 07
දුරකථන අංකය- 0112669240/0112662002
වෙබ් ලිපිනය - www.sed.gov.lk

සපයන සේවාවන්-

තරුණ හා ක්‍රීඩා අමාතයංශය යටතේ ක්‍රියාත්මක වන කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතින් ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා පහත සේවාවන් නොමිලයේ සපයනු ලැබේ. මෙම සේවාවන් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිළධාරීන් හරහා ලබා ගත හැකිය.

- වෙළඳපොල ඉල්ලුමක් ඇති ව්‍යාපාරික අවස්ථා හඳුන්වා දීම.
- ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීම.
- ව්‍යාපාර ලියාපදිංචිය සහ බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය සහය සැපයීම.
- භාණ්ඩයේ ලේබලය , ඇසුරුම හා බාර්කොඩ් ලබා ගැනීම සඳහා නිසි ආයතන වෙත යොමු කිරීම.
- භාණ්ඩවල ගුණාත්වය වර්ධනය කර ගැනීමට අවශ්‍ය නිසි තාක්ෂණය ලබා ගැනීම සඳහා යොමු කිරීම.
- ව්‍යාපාර සඳහා අවශ්‍ය වන ණය පහසුකම් ලබා ගැනීමට මූල්‍ය ආයතන වෙත යොමු කිරීම.
- ව්‍යාපාරය ලාභදායී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබාදීම.
- ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
- ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය අලෙවිපොල හා ප්‍රදර්ශන සඳහා යොමු කිරීම.
- ගුණාත්මක නිපැයුම් සදහා ගැණුම්කාර ආයතන සම්බනධීකරණය

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දිස්ත්‍රික් කාර්යාල

කොළඹ	- 011 236 9764	අනුරාධපුරය	- 025 222 1909
ගම්පහ	- 033 222 2284	පොළොන්නරුව	- 027 222 4716
කළුතර	- 034 222 9792	බදුල්ල	- 055 223 1167
ගාල්ල	- 091 224 2308	මොණරාගල	- 055 227 6808
මාතර	- 041 222 7950	අම්පාර	- 063 222 2259
හම්බන්තොට	- 047 225 6128	මඩකලපුව	- 065 205 7309
මහනුවර	- 081 222 9181	ත්‍රිකුණාමලය	- 026 205 0930
මාතලේ	- 066 223 2375	යාපනය	- 021 221 3861
නුවර එළිය	- 052 223 4741	මුලතිව්	- 021 229 1327
කුරුණෑගල	- 037 222 6755	වව්නියාව	- 024 222 8037
පුත්තලම	- 032 226 6696	මන්නාරම	- 023 222 3475
රත්නපුරය	- 045 223 0703	කිලිනොච්චි	- 021 228 4037
කෑගල්ල	- 035 223 0812		

දිවියට
සවිය